# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2023 දෙසැම්බර් මස 01 වන දින
## II කොටස

## අතිරේකය

## (2023.12.05 දින නිකුත් කරන ලදී)


# ශ්‍රී ලංකා විදුලිබල

**විදුලිබල කර්මාන්තයට සිදු කරනු ලබන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට විධිවිධාන සැලැස්වීම සඳහා ද; ජාතික විදුලිබල උපදේශක සභාව පිහිටුවීමට විධිවිධාන සැලැස්වීම සඳහා ද; 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනත යටතේ පිහිටුවන ලද, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව මේ පනත ප්‍රකාර විදුලිබල කර්මාන්තය සඳහා නියාමක වශයෙන් කටයුතු කිරීමට විධිවිධාන සැලැස්වීම සඳහා ද; විදුලිබලය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදා හැරීම, වෙළෙඳාම් කිරීම, සැපයීම සහ ප්‍රසම්පාදනය කිරීම සම්බන්ධ සියලු කටයුතු පැවරී ඇති සංස්ථාමය අස්තිත්ව 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කිරීමට අදාළ ව්‍යවස්ථාමය පියවර සැපයීම සඳහා ද; ඒ හා සම්බන්ධ සියලු කටයුතුවලට අදාළ වන ක්‍රියාපටිපාටි නිශ්චිතව දැක්වීම සඳහා ද; 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනත සහ 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත පරිච්ඡින්න කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.**

විදුලිබල හා බලශක්ති ඇමතිතුමාගේ නියමය පරිදි පළ කරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිල : රු. 154.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම ගැසට් අතිරේකය *www. documents. gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# ශ්‍රී ලංකා විදුලිබල

එල්. ඩී. - ඕ. 1/2023

**විදුලිබල කර්මාන්තයට සිදු කරනු ලබන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට විධිවිධාන සැලැස්වීම සඳහා ද; ජාතික විදුලිබල උපදේශක සභාව පිහිටුවීමට විධිවිධාන සැලැස්වීම සඳහා ද; 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනත යටතේ පිහිටුවන ලද, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව මේ පනත ප්‍රකාර විදුලිබල කර්මාන්තය සඳහා නියාමක වශයෙන් කටයුතු කිරීමට විධිවිධාන සැලැස්වීම සඳහා ද; විදුලිබලය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදා හැරීම, වෙළෙඳාම් කිරීම, සැපයීම සහ ප්‍රසම්පාදනය කිරීම සම්බන්ධ සියලු කටයුතු පැවරී ඇති සංස්ථාමය අස්තිත්ව 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කිරීමට අදාළ ව්‍යවස්ථාමය පියවර සැපයීම සඳහා ද; ඒ හා සම්බන්ධ සියලු කටයුතුවලට අදාළ වන ක්‍රියා පටිපාටි නිශ්චිතව දැක්වීම සඳහා ද; 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනත සහ 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත පරිච්ඡින්න කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

විදුලිබලය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදා හැරීම, වෙළෙඳාම් කිරීම, සැපයීම සහ ප්‍රසම්පාදනය කිරීම සම්බන්ධ සියලු කටයුතු පැවරී ඇති සහ මෙම කටයුතු කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම සඳහා සහ මෙම කටයුතු සම්බන්ධයෙන් වෙළෙඳපොළ තරගකාරීත්වය නිර්මාණය කිරීම සඳහා වගකිව යුතු වන ස්වාධීන සංස්ථාමය අස්තිත්ව සංස්ථාගත කිරීම මගින් වර්තමානයේ දී රජයට හිමි තනි අස්තිත්වයක් වෙත පැවරී ඇති විදුලිබල කර්මාන්තයේ කටයුතු නො වෙන් කිරීම මගින් සනාථ කරනු ලබන විදුලිබල කර්මාන්තයට අලුත් ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා වන අවශ්‍යතාව යථා පරිදි හඳුනාගනු ලබන සහ ඒ සඳහා සැලසුම් කරනු ලබන, විදුලිබල කර්මාන්තයේ පවත්නා ආයතනික ව්‍යුහය සඳහා ප්‍රතිසංස්කරණ අවශ්‍ය හෙයින් ද: පූර්විකාව

විදුලිබල කර්මාන්තයේ වෙනස්වීම සහ ප්‍රතිසංවිධානය කිරීම සඳහා යෝජනා ක්‍රමයක් සකස් කිරීම සහ කාලීන සහ අත්‍යවශ්‍ය නෛතික, ව්‍යුහාත්මක, අධීක්ෂණය සහ වෙළෙඳපොළ පදනම් කරගත් වෙනස්වීම් මත පදනම් වූ හඳුනාගත් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සමඟ ආරම්භ වන ක්‍රියාවලියකි. කොටස් වෙළෙඳපොළ ලැයිස්තුගත කිරීම සහ රාජ්‍ය පෞද්ගලික අංශ හවුල් ව්‍යාපාර පිළිවෙත් භාවිත කර විදුලිබල කර්මාන්තයේ සෑම කටයුත්තක ම පෞද්ගලික අංශයේ ආයෝජන සඳහා පහසුකම්

සැලැස්වීම සඳහා ගාස්තු සම්බන්ධයෙන් පිරිවැය පිළිබිඹු කරන සහ විනිවිදභාවයෙන් යුත් ක්‍රමයක්, විනිවිදභාවයෙන් යුත් මූල්‍ය, ආයෝජන සහ සම්පත් කළමනාකරණය සහ වැඩිදියුණු කරන ලද වගවීමේ සහ අධීක්ෂණ පියවර හරහා මේ පනත යටතේ පිහිටුවනු ලබන සංස්ථාමය අස්තිත්වවල මූල්‍ය ස්වයං පූර්ණතාව සහතික කිරීමට ප්‍රතිසංස්කරණ මගින් අපේක්ෂා කරන හෙයින් ද:

රජයේ කාබන්හරණ ඉලක්ක, දේශගුණික විපර්යාස ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ නවීන තාක්ෂණය මගින් පහසුකම් සපයනු ලබන විදුලිබල උත්පාදනය සඳහා පුනර්ජනනීය බලශක්ති දායකත්වය වැඩි කිරීම සහ ආනයනික පොසිල ඉන්ධන ප්‍රභවයන් මත යැපීම අවම කිරීම සඳහා දේශීය පුනර්ජනනීය බලශක්ති ප්‍රභවවලින් බලශක්ති උත්පාදනය කිරීම ප්‍රශස්තකරණය සඳහා වන ක්‍රියාවන් සහ පුනර්ජනනීය බලශක්තිය ඒකාබද්ධ කිරීමට පහසුකම් සැලැස්වීම පිණිස සහ කාර්යක්ෂම සහ විනිවිදභාවයෙන් යුත් ආකාරයකින් විදුලිබල උත්පාදනය කිරීමේ විකල්ප ක්‍රියාවලීන් අතර තරගය වැඩි කිරීම පිණිස බලශක්ති පරිවර්තනය, ගබඩා කිරීම සහ කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් වන නව තාක්ෂණයන් යොදා ගැනීම හරහා විදුලිබල කර්මාන්තයේ විකාශනය සඳහා ශ්‍රී ලංකා රජයේ කැපවීම හඳුනාගැනීම අවශ්‍ය වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දින**

1. (1) මේ පනත 2023 අංක      දරන ශ්‍රී ලංකා විදුලිබල පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ වගන්තියේ 32 වන වගන්තියේ සහ (4) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති වගන්තිවල විධිවිධාන හැර, මේ පනතේ විධිවිධාන, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක දී ක්‍රියාත්මක විය යුතු ය:

එසේ වුව ද, නියමිත දිනය, පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත් වන දිනයේ සිට මාස හයක් පසු නොවන දිනයක් විය යුතු ය:

එසේම තවදුරටත්, මේ උපවගන්තිය මගින් නියම කරනු ලබන පරිදි නියමිත දිනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ නොමැති නම්, මේ වගන්තියේ, 32 වන වගන්තියේ සහ (4) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති වගන්තිවල විධිවිධාන හැර, මේ පනතේ විධිවිධාන මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත් වන දිනයේ සිට මාස හයක කාලසීමාවක් ඉකුත් වූ වහාම ක්‍රියාත්මකභාවයට එළඹිය යුතු ය.

(3) මේ වගන්තියේ සහ 32 වන වගන්තියේ විධිවිධාන පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත් වන දිනයේ දී ක්‍රියාත්මකභාවයට එළඹිය යුතු ය.

(4) මේ උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා ඇති කරනු ලැබිය යුතු හෝ සපුරාලනු ලැබිය යුතු බවට මේ පනත මගින් නියම කරනු ලබන විශේෂ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගනිමින්, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, පහත දැක්වෙන පරිදි ඒ එක් එක් වගන්ති ක්‍රියාත්මක වීම සඳහා වෙනස් දිනයන් නියම කරනු ලැබිය හැකි යː-

(අ) විවෘත ප්‍රවේශයට අදාළ 12 වන වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මකභාවයට එළඹෙනු ලබන්නේ යම් දිනයක සිට ද එකී දිනය; සහ

(ආ) තොග විදුලිබල වෙළෙඳපොළට අදාළ IX වන කොටසේ විධිවිධාන ක්‍රියාත්මකභාවයට එළඹෙනු ලබන්නේ යම් දිනයක සිට ද එකී දිනය.

(5) (4) වන උපවගන්තිය ප්‍රකාර සාදනු ලබන සෑම නියමයක් ම, අදාළ නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට දින අනූවක් ඇතුළත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු යː

එසේ වුව ද, (4) වන උපවගන්තිය ප්‍රකාර සාදනු ලැබීමට අවශ්‍ය නියමයන්, පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත් වන දින සිට අවුරුදු දෙකක කාලසීමාවක් ඉකුත්වීමෙන් පසුව සහ අවුරුදු පහක කාලසීමාවක් ඉකුත්වීමට පෙර සාදනු ලැබිය යුතු ය. එකී අවුරුදු පහක කාලසීමාව ඇතුළත කිසිදු නියමයක් සාදනු ලැබ නොමැති නම්, (4) වන උපවගන්තියේ දක්වා ඇති වගන්තිවල විධිවිධාන එකී අවුරුදු පහක කාලසීමාව ඉකුත්වන දිනයේ සිට ක්‍රියාත්මකභාවයට එළඹෙන ලෙසට සලකනු ලැබිය යුතු යː

එසේම තවදුරටත්, අමාත්‍යවරයා විසින්, අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, එකී අවුරුදු පහක කාලසීමාව ඉකුත්වීමට පෙරාතුව කවර හෝ අවස්ථාවක දී, එකී කාලසීමාව වරකට අවුරුද්දක් වන සේ දීර්ඝ කළ හැකි අතර, කවර ලෙසකින් හෝ එකී දීර්ඝකිරීම්වල එකතුව අවුරුදු පහක් නොඉක්මවිය යුතු ය.

## I වන කොටස

### පනතේ පරමාර්ථ

පනතේ පරමාර්ථ

2. ශ්‍රී ලංකාව තුළ විදුලිබලය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදා හැරීම, වෙළෙඳාම් කිරීම, සැපයීම සහ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් වූ මේ පනතේ පරමාර්ථ වන්නේ,-

(අ) විනිවිදභාවයෙන් යුතු ප්‍රතිපත්ති හරහා කෙසේ හෝ මුළු කාලය පුරාම ශ්‍රී ලංකාව පුරා සපයනු ලබන නිසි පරිදි සම්බන්ධීකරණය වූ, කාර්යක්ෂම සහ පිරිමැසුම්දායක විදුලිබල සැපයුම් පද්ධතියක්, එසේ කිරීමට ආර්ථික වශයෙන් හැකි වන තාක් දුරට, සැපයීම සහ පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වගකිව යුතු ස්වාධීන සහ වගකීමෙන් බැඳී සිටින සංස්ථාමය අස්තිත්ව හරහා වැඩිදියුණු වූ විදුලිබල කර්මාන්ත කාර්යසාධනය සහතික කිරීම;

(ආ) රට පුරා කාර්යක්ෂම විදුලිබල සැපයුමක් සඳහා ස්වාධීන සහ වගකීමෙන් බැඳී සිටින සංස්ථාමය අස්තිත්ව පිහිටුවීම සඳහා පහසුකම් සැලැස්වීම;

(ඇ) තොග විදුලිබල වෙළෙඳපොළ පිහිටුවීම සහ එහි ක්‍රියාකාරීත්වය ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැලැස්වීම;

(ඈ) විදුලිබලය උත්පාදනය කිරීමට, සම්ප්‍රේෂණය කිරීමට, බෙදා හැරීමට, වෙළෙඳාම් කිරීමට, සැපයීමට සහ ප්‍රසම්පාදනයට අදාළව තරගකාරීත්වය ප්‍රවර්ධනය කිරීම සහ හැකි සෑම අවස්ථාවක දී ම බලශක්ති සුරක්ෂිතභාවය සහ විශ්වසනීයභාවය වැඩිදියුණු කිරීම;

(ඉ) (මෙහි මින් මතු "බලපත්‍රලාභීන්" යනුවෙන් සඳහන් කරනු ලබන) මේ පනත යටතේ බලපත්‍ර ප්‍රදානය කරනු ලැබ ඇති තැනැත්තන් විසින්, ඔවුන් වෙත නිකුත් කරන ලද අදාළ බලපත්‍රවලින් බලය ලබා දී ඇති හෝ නියම කර ඇති කටයුතු සිදු කිරීම සඳහා ප්‍රමාණවත් මුදල් යෙදවීම පිණිස කාර්යක්ෂම ලෙස ක්‍රියා කරනු ඇති බව සහතික කිරීම;

(ඊ) සියලු පරිශ්‍ර වෙත සපයනු ලබන විදුලිබලය ඵලදායී ලෙස භාවිත කිරීම සහතික කරනු ලබන අතරම, විදුලිබලය සඳහා වූ අනාගත අවශ්‍යතා ඇතුළු විදුලිබලය සඳහා වූ සියලු සාධාරණ ඉල්ලීම් සපුරා ඇති බවට සහතික වීම;

(උ) විදුලිබල සේවාවල වැඩිදියුණු කරන ලද විශ්වසනීයත්වය සහ ගුණාත්මකභාවය මගින් විදුලිබලය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදා හැරීම, වෙළෙඳාම් කිරීම, සැපයීම සහ ප්‍රසම්පාදනය කිරීම තුළින් උද්ගත වන උපද්‍රවවලින් ජනතාව ආරක්ෂා කිරීම;

(ඌ) ගාස්තු නිර්ණය කිරීමේ දී අනුගමනය කරනු ලැබිය යුතු මූලධර්ම සහ ක්‍රමවේද හඳුනාගැනීම; සහ

(එ) ස්වාභාවික සම්පත් උපරිම ලෙස භාවිත කිරීම සහතික කරනු ලබන අතර, ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්ති සහ එහි ජාත්‍යන්තර බැඳීම්වලට අනුව ශ්‍රී ලංකාවේ විදුලිබල කර්මාන්තයේ කාබන්හරණය සඳහා සහ පු**k¾**ජනනීය බලශක්තිය සහ බලශක්ති ඒකාබද්ධ කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා නීතියෙන් විධිවිධාන සැලැස්වීම.

### ෂෂ වන කොටස

### ජාතික විදුලිබල උපදේශක සභාව, ජාතික විදුලිබල ප්‍රතිපත්තිය සහ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ නිකුත් කිරීම

ජාතික විදුලිබල උපදේශක සභාව පිහිටුවීම

3. (1) මේ පනතේ කාර්ය සඳහා (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන) ජාතික විදුලිබල උපදේශක සභාව යනුවෙන් හඳුන්වනු ලබන සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) සභාව, (1) වන උපවගන්තියෙන් එය වෙත පවරා ඇති නාමයෙන් සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, එයට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තව ද, එකී නාමයෙන් එය විසින් සහ එයට එරෙහිව නඩු පවරනු ලැබිය හැකි ය.

(3) (අ) පහත දැක්වෙk ish¨ fyda hï ldrKd iïnkaOfhka wud;Hjrhd fj; Wmfoia §fï j.lSu iNdj fj; ;sìh hq;= h(-

:ස* විදුලිබල කර්මාන්තයට සහ මේ පනතේ 4 වන වගන්තිය ප්‍රකාර ජාතික විදුලිබල ප්‍රතිපත්තිය සකස් කිරීමට අදාළ කාරණා;

(ii) ශ්‍රී ලංකාවේ විදුලිබලය උත්පාදනය කිරීමට, සම්ප්‍රේෂණය කිරීමට, බෙදා හැරීමට, වෙළෙඳාම් කිරීමට, සැපයීමට සහ ප්‍රසම්පාදනයට අදාළව මේ පනතේ විධිවිධානවලට අනුව විදුලිබල කර්මාන්තයේ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට අදාළ කාරණා;

(iii) ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය හරහා විදුලිබල කර්මාන්තයේ සංවර්ධනය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සහතික කර ගැනීම පිණිස කලාපීය වෙළෙඳපොළවල් සමඟ අන්තර් සම්බන්ධතා ඇතුළු තරගකාරී විදුලිබල වෙළෙඳපොළවල් පිහිටුවීම ඇතුළුව විදුලිබල කර්මාන්තයේ සංවර්ධනය සඳහා වන යෝජනා සහ සැලසුම් සකස් කිරීමට අදාළ පිළිවෙත් සම්බන්ධයෙන්;

(iv) ජාතික ආර්ථිකයේ උපරිම යහපත පිණිස පුනර්ජනනීය බලශක්තිය, නවීන තාක්ෂණ ක්‍රම සහ බලශක්ති කාර්යක්ෂමතාව ඇතුළු දේශීය බලශක්ති විභවයන් උපරිම භාවිතය සහතික කිරීම සඳහා අදාළ නියෝජ්‍යායතනවල කටයුතු සම්බන්ධීකරණය කිරීම;

(v) උත්පාදන සහ සම්ප්‍රේෂණ ධාරිතාවට එකතු කිරීම්, තරගකාරී ගාස්තු ව්‍යුහයක් මත පදනම්ව විදුලිබල උත්පාදන ධාරිතාව සැපයීමට පෞද්ගලික අංශයේ ආයෝජකයන්ගේ හැකියාව, රජයේ දේශගුණික විපර්යාස ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා වූ පියවර

සහ කාබන්හරණයේ සහ පුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධ කිරීමේ ඉලක්ක ඇතුළුව මේ පනතේ විධිවිධාන යටතේ ජාතික විදුලිබල ප්‍රතිපත්තිය ප්‍රකාර දීර්ඝකාලීන විදුලිබල පද්ධති සංවර්ධන සැලැස්ම සකස් කිරීමට අදාළ කාරණා;

(vi) නියාමනය කරන ලද අස්තිත්වවල මූල්‍ය ස්ථාවර මට්ටමක් සහ ආයෝජනවලට සාධාරණ ලාභයක් සහතික කරන අතර, ජාතික ගාස්තු ප්‍රතිපත්තිය ප්‍රකාරව ගාස්තු නියම කිරීමේ දී පිළිපැදිය යුතු සැකැස්මට සහ ක්‍රමවේදයට අදාළ කාරණා; සහ

(vii) අමාත්‍යවරයා විසින්, සභාව වෙත යොමු කරනු ලැබිය හැකි, ජාතික විදුලිබල ප්‍රතිපත්තියට සම්බන්ධ හෝ එයින් උද්ගත වන වෙනත් යම් කාරණා.

(ආ) සභාව විසින්, මේ උපවගන්තිය යටතේ එහි වගකීම් ඉටු කිරීමේ දී, අදාළ පරදු දරන්නන් විමසනු ලැබිය හැකි ය.

(4) අමාත්‍යවරයා විසින්, අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව, සභාවේ සාමාජිකයන් වශයෙන් තැනැත්තන් පස්දෙනෙකු පත් කරනු ලැබිය යුතු අතර, ඒ සාමාජිකයන්ගෙන් එක් තැනැත්තකු අමාත්‍යවරයා විසින් සභාවේ සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබිය යුතු ය.

(5) සභාපතිවරයා සහ සාමාජිකයන් දෙදෙනෙකු පිළිවෙළින් විදුලි ඉංජිනේරු ශිල්පය, මූල්‍ය සහ ආර්ථික විද්‍යාව යන ක්ෂේත්‍රවල ප්‍රවීණත්වය, දක්ෂතාවය සහ පළපුරුද්ද සහිත තැනැත්තන් විය යුතු ය. අනෙක් සාමාජිකයන් දෙදෙනා, බලශක්ති වෙනස්වීම, බලශක්ති කාර්යක්ෂමතාව, පුනර්ජනනීය බලශක්තිය සහ දේශගුණික මූල්‍යකරණය හෝ විදුලිබල කර්මාන්තයේ කටයුතුවලට වර්තමානයේ දී අදාළත්වයක් තිබේ යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන පරිදි වෙනත් යම් සමාන ක්ෂේත්‍රයක ප්‍රවීණත්වය, දක්ෂතාවය සහ පළපුරුද්ද සහිත තැනැත්තන් විය යුතු ය.

(6) සභාවේ සාමාජිකයන් විසින් අවුරුදු දෙකක කාලසීමාවක් සඳහා ධුර දරනු ලැබිය යුතු අතර, ඔවුන් ස්වකීය පත්වීම් ලිපිවල දක්වා ඇති යොමු කිරීම් අනුදේශවලට සහ මේ පනතේ විධිවිධානවලට අනුව, සභාව වෙත පවරා ඇති බලතල, කාර්ය

සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, සභාපතිවරයා හැර මේ වගන්තිය යටතේ පත් කරන ලද පළමු සභාවේ සාමාජිකයන්, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි සහ එම සාමාජිකයන් වෙත නිකුත් කරන ලද පත්වීම් ලිපිවල නිශ්චිතව දක්වා ඇති පරිදි අවුරුදු දෙකක කාලසීමාවක් සඳහා ධුර දරනු ලැබිය යුතු ය.

(7) (අ) සභාව ඉදිරියේ යම් නිශ්චිත ගැටලුවක් තහවුරු කිරීම සඳහා අදාළ ප්‍රවීණත්වය අවශ්‍ය වන අවස්ථාවක දී , අමාත්‍යවරයා විසින් විශේෂිත සුදුසුකම් සහ ප්‍රවීණත්වයක් සහිත තැනැත්තන් සභාවේ රැස්වීම්වලට සහභාගි වීම සඳහා අනුයුක්ත කරගනු ලැබිය හැකි ය.

(ආ) එකී තැනැත්තන්, ඔවුන්ගේ ප්‍රවීණත්වය අවශ්‍ය වන ගැටලුව පිළිබඳ සාකච්ඡා කරනු ලබන යම් රැස්වීමකට සහභාගි වී සහාය දක්වනු ලැබිය යුතු අතර, එසේ වුව ද, එසේ සාකච්ඡා කරනු ලබන යම් කාරණාවක දී ඡන්දය ලබා දීම සඳහා හිමිකම් නොලැබිය යුතු ය.

(8) (අ) යම් තැනැත්තකු -

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ පුරවැසියකුව සිටීම නතර වේ නම්;

(ii) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු, පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වන්නේ නම් පත්කරනු ලැබීමට පෙරාතුව වූ අවුරුදු තුනක් ඇතුළත පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුව, පළාත් සභා මන්ත්‍රීකරයෙකුව හෝ පළාත් පාලන ආයතනයක සභිකයකුව සිට ඇත්තේ නම් ; හෝ

(iii) එකී සාමාජිකයා හෝ සම්බන්ධිත තැනැත්තා විසින් ඉටු කරනු ලබන කර්තව්‍යවලට අදාළ යම් කාරණාවක දී, සෘජුව හෝ වක්‍රාකාරයෙන් සම්බන්ධතා අතර ගැටුමකට හේතු වන යම් මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවක් තිබෙන සම්බන්ධිත පුද්ගලයකු වන්නේ නම්;

(iv) ශ්‍රී ලංකාවේ බලපවත්නා යම් ලිඛිත නීතියක් යටතේ සිහිවිකල තැනැත්තකු බවට හඳුනාගනු ලබන්නේ නම් හෝ ප්‍රකාශ කරනු ලබන්නේ නම්;

(v) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් ලිඛිත නීතියක් යටතේ වස්තු භංගත්වයට හෝ බුන්වත්භාවයට පත්ව ඇති බවට ප්‍රකාශ කරනු ලැබ හෝ වස්තු භංගත්වයට හෝ බුන්වත්භාවයට පත්ව නිදහස් කරනු ලැබ නොමැත්තේ නම්;

(vi) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් යම් අපරාධමය වරදකට වරදකරු කරනු ලැබ ඇත්තේ නම්; හෝ

(vii) සභාවේ සාමාජිකයකු වශයෙන් එකී තැනැත්තා වෙත පැවරී ඇති වගකීම් ඉටු කිරීමෙන් එකී තැනැත්තාව වළක්වන යම් මානසික හෝ ශාරීරික දුබලතාවකින් පෙළෙන්නේ නම්,

එම තැනැත්තා සභාවේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු ලෙස දිගටම කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු විය යුතු ය.

(ආ) සභාවේ යම් සාමාජිකයකු (අ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති යම් නුසුදුසුකමකට යටත් වන්නේ නම්, අමාත්‍යවරයා විසින් ඒ සඳහා හේතු ලිඛිතව අමාත්‍ය මණ්ඩලය වෙත දැනුම් දීමෙන් පසු එම සාමාජිකයාව ඉවත් කරනු ලැබිය යුතු ය.

(9) (අ) සභාව විසින්, සභාවේ වගකීම්වලට අදාළ කාරණා ඇතුළු (3) වන උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන ප්‍රකාරව එහි වගකීම් ඉටු කිරීමේ දී සභාවට සහාය ලබා දිය යුතු යම් තැනැත්තන් සංඛ්‍යාවක් සභාවේ කාර්ය මණ්ඩලය වශයෙන් කටයුතු කිරීමට සේවයට නියුක්ත කරගනු ලැබිය යුතු ය.

(ආ) සභාව විසින් අමාත්‍යවරයා විමසා, කාර්ය මණ්ඩලයේ ආයතනික සැලැස්ම සහ කාර්ය මණ්ඩලයේ එක් එක් සාමාජිකයාට පැවරිය යුතු කාර්යභාරය සහ සභාවේ එදිනෙදා කටයුතු කළමනාකරණය කළ යුතු ආකාරය නිශ්චිතව දක්වමින් රීති සාදනු ලැබිය යුතු ය.

(ඇ) සභාවේ සාමාජිකයන් සහ කාර්ය මණ්ඩලය වෙත, පාරිශ්‍රමික ගෙවිය යුතු ආකාරය සහ ගෙවිය යුතු පාරිශ්‍රමිකවල අනුප්‍රමාණ භාණ්ඩාගාරයේ ලේකම්වරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(10) සභාවේ කටයුතු කරනු ලැබිය යුතු ආකාරය සහ සභාවේ රැස්වීම් පැවැත්වීමේ දී අනුගමනය කරනු ලැබිය යුතු කාර්යපටිපාටිය නියාමනය කිරීම සඳහා සභාව විසින් රීති සාදනු ලැබිය යුතු ය.

(11) අමාත්‍යවරයා විසින්, කලින් කලට, සභාවේ කාර්ය සහ කර්තව්‍ය කාර්යක්ෂමව ඉටු කිරීම සහ කිරීම සඳහා අවශ්‍ය විය හැකි සමස්ත සැලසුම් කිරීම සහ සම්බන්ධීකරණය ඇතුළු ජාතික විදුලිබල ප්‍රතිපත්තියට සම්බන්ධ කාරණා පිළිබඳ යම් විධාන සහ මාර්ගෝපදේශ සභාව වෙත නිකුත් කරනු ලැබිය යුතු ය. එකී විධාන සහ මාර්ගෝපදේශ මේ පනතේ පරමාර්ථවලට සහ ජාතික විදුලිබල ප්‍රතිපත්තියට අනුකූල විය යුතු ය.

ජාතික විදුලිබල ප්‍රතිපත්තිය සකස් කිරීම සහ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ නිකුත් කිරීම

4. (1) ජාතික විදුලිබල ප්‍රතිපත්තිය මගින් 2 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පනතේ පරමාර්ථ පිළිබිඹු කරනු ලැබිය යුතු අතර, එකී එක් එක් පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා වන ක්‍රියාවලීන් සහ ක්‍රමවේදයන් හඳුනාගනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීමෙන් පසුව, අමාත්‍යවරයා විසින්, ඉහළ යන අනාගත විදුලිබල ඉල්ලුම සපුරාලීමට ශ්‍රී ලංකාවට හැකියාව ලබා දීමේ අදහස ඇතිව, නියාමක, ජාතික පද්ධති ක්‍රියාකරු, බලපත්‍රලාභීන්, පාරිභෝගික සංවිධාන සහ අදාළ වෙනත් සියලු පරදූ දරන්නන් විමසීමෙන් පසුව සහ අදාළ සියලු ජාතික ප්‍රතිපත්ති සහ අමාත්‍යවරයාගේ ප්‍රතිපත්ති මාර්ගෝපදේශවලට අනුකූලව ජාතික විදුලිබල ප්‍රතිපත්ති කෙටුම්පත සකස් කරන ලෙසට සභාව වෙත විධාන කරනු ලැබිය යුතු ය.

(3) සභාව විසින්, (2) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයාගේ විධානයට අනුකූලව පහත දැක්වෙන කරුණු පිළිබඳ රජයේ ප්‍රතිපත්තියේ දළ සටහනක් ඇතුළත් විය යුතු ජාතික විදුලිබල ප්‍රතිපත්ති කෙටුම්පත සකස් කිරීමට කටයුතු කළ යුතු යː-

(අ) විදුලිබල සැපයුම් පිරිවැය අවම කිරීම සඳහා වූ වැඩිදියුණු කළ තාක්ෂණික ක්‍රම සහිත පුනර්ජනනීය බලශක්තිය ඇතුළු සියලු දේශීය බලශක්ති විභවයන් උපරිම ලෙස භාවිත කිරීම මත පදනම් වන බලශක්ති පද්ධතියක් ගොඩ නැංවීම ;

(ආ) විදුලිබලය උත්පාදනය කිරීම සම්බන්ධයෙන් භාවිත කිරීමට නියමිත තාක්ෂණික ක්‍රම;

(ඇ) ජාතික බලශක්ති සුරක්ෂිතතාව වර්ධනය කරනු ලබන සහ ආනයනික පොසිල ඉන්ධන ප්‍රභවයන් මත රඳා පැවතීම අඩු කරනු ලබන පුනර්ජනනීය බලශක්තිය, බලශක්ති ගබඩා කිරීම, හරිත හයිඩ්‍රජන් සහ බලශක්ති කාර්යක්ෂමතාවය වැනි බලශක්ති තාක්ෂණික ක්‍රමයන්හි ආයෝජන සිදු කිරීමට දිරිමත් කිරීම;

(ඈ) පුනර්ජනනීය බලශක්ති-පාදක විදුලිබල උත්පාදනය, සම්ප්‍රේෂණය, බලශක්ති ගබඩා කිරීම සහ අවසාන භාවිතකරුගේ බලශක්ති කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම ඇතුළු විදුලිබල කර්මාන්තයේ මූල්‍ය ශක්‍යතාව සහ විදුලිබල කර්මාන්තය වෙත පෞද්ගලික අංශයේ ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ අවශ්‍යතාව සහතික කිරීම;

(ඉ) විදුලිබලය උත්පාදනය සහ සැපයීම සම්බන්ධයෙන් අදියරෙන් අදියර ආකාරයකින් තරගකාරීත්වයක් හඳුන්වාදීම සහ පාරිභෝගිකයන් වෙත වරණයක් සපයනු ලබන තරගකාරී විදුලිබල වෙළෙඳපොළක් ස්ථාපිත කිරීම සඳහා පූර්ව කොන්දේසි සහ වැදගත් අවස්ථා නිශ්චිතව දැක්වීම;

(ඊ) විදුලිබලයෙහි ජාතික ඉලක්ක මුදුන් පමුණුවා ගැනීම පිණිස විදුලිබල කර්මාන්තයෙහි අඛණ්ඩ ආර්ථික වර්ධනයක් සඳහා අවශ්‍ය වන ආයෝජනයන් රැස්කිරීම;

(උ) විදුලිබල සැපයුම් මිල ජාලය සහ අවදානමක් සහිත කණ්ඩායම්වල විදුලිබලය ලබා ගැනීමේ හැකියාව හරහා විදුලිබල කර්මාන්තයේ මූල්‍යමය ශක්‍යතාව සහතික කිරීම සඳහා කලින් කල, ප්‍රතිශෝධනය කළ යුතු ජාතික ගාස්තු ප්‍රතිපත්තියක් ඇතුළත් කිරීම; සහ

(ඌ)මේ පනතේ පරමාර්ථ සපුරාලීම සඳහා ආණ්ඩුව විසින් හඳුනාගත යුතු ප්‍රමුඛතා සහ පියවර හඳුනාගැනීම.

(4) (අ) (2) වන උපවගන්තිය ප්‍රකාරව සභාව විසින් ජාතික විදුලිබල ප්‍රතිපත්ති කෙටුම්පත සකස් කිරීම අවසන් කිරීමෙන් පසුව, අමාත්‍යවරයා විසින්, එම ප්‍රතිපත්ති කෙටුම්පත මේ පනතේ විධිවිධාන සමඟ සහ රජයේ සමස්ත ප්‍රතිපත්තිය සමඟ අනුකූල වන බවට සෑහීමට පත්වීමෙන් පසුව, එම විදුලිබල ප්‍රතිපත්ති

කෙටුම්පත අමාත්‍ය මණ්ඩලයේ අනුමතය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) එම ප්‍රතිපත්තියට අනුමතය ප්‍රදානය කිරීමට පෙරාතුව අමාත්‍ය මණ්ඩලය විසින්, (අ) ඡේදය යටතේ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද එම කෙටුම්පත සමාලෝචනය කරනු ලැබිය හැකි අතර, ඒ සඳහා සංශෝධන ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(5) අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ලැබීමෙන් පසුව, අමාත්‍යවරයා විසින්, එම අනුමතය ලද දින සිට මාසයක කාලසීමාවක් ඇතුළත ජාතික විදුලිබල ප්‍රතිපත්තිය ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(6) ජාතික විදුලිබල ප්‍රතිපත්තිය, මේ වගන්තිය ප්‍රකාරව අනුමත කරනු ලැබීමෙන් සහ ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසුව, විදුලිබලය උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම, වෙළෙඳාම් කිරීම, සැපයීම සහ ප්‍රසම්පාදනය පිළිබඳ සියලු පූර්ව ප්‍රතිපත්ති ලේඛන ඒ යටතේ නිසි පරිදි කලින් සිදු කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, අභිබවා බලපැවැත්විය යුතු ය.

(7) (4) වන උපවගන්තිය මගින් නියම කර ඇති ආකාරයට අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ලබා ගැනීමෙන් පසුව, නියාමක විසින් බලපත්‍රලාභීන් වෙත මාර්ගෝපදේශ නිකුත් කිරීම හරහා ජාතික විදුලිබල ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහතික කරනු ලැබිය යුතු ය.

(8) අමාත්‍යවරයා විසින්, සෑම අවුරුදු පහකට වරක්ම සභාවේ උපදෙස් මත සහ පරදු දරන්නන් විමසීමෙන් පසු ජාතික විදුලිබල ප්‍රතිපත්තියේ සමාලෝචනයක් පැවැත්වීමට කටයුතු සලස්වනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, ඉහත කී අවුරුදු පහක කාලසීමාව සම්පූර්ණ වීමට පෙරාතුව, ජාතික විදුලිබල ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීමේ හදිසි අවශ්‍යතාවක් ඇති වුවහොත්, අමාත්‍යවරයා විසින්, ජාතික විදුලිබල ප්‍රතිපත්තියේ සමාලෝචනයක් පැවැත්වීමට කටයුතු සලස්වන ලෙස සභාව වෙත විධාන කරනු ලැබිය හැකි ය.

(9) සභාව විසින්, එම සමාලෝචනයෙන් රැස්කර ගන්නා ලද සියලු තොරතුරු විශ්ලේෂණය කර, අවශ්‍ය බවට පෙනී යන්නේ

නම් එම සමාලෝචන පවත්වනු ලබන දිනට ජාතික විදුලිබල ප්‍රතිපත්තිය යාවත්කාලීන කර, අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(10) (1) සිට (5) දක්වා වූ උපවගන්තිවල නිශ්චිතව දක්වා ඇති කාර්යපටිපාටිය, ජාතික විදුලිබල ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් අනුකූල කර ගන්නා බවට අමාත්‍යවරයා විසින් සහතික විය යුතු ය.

(11) අමාත්‍යවරයා විසින්, ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ විෂයය පවරනු ලැබ ඇත්තා වූ අමාත්‍යවරයා විමසා, එම ප්‍රතිපත්තියේ ජාතික ක්‍රමෝපාය සහ ජාතික ඉලක්ක ඇතුළු ජාතික විදුලිබල ප්‍රතිපත්තියේ මූලධර්ම ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ, කලින් කල, ලිඛිතව නිකුත් කරනු ලැබිය හැකි ය. එවැනි මාර්ගෝපදේශ මගින්-

(අ) නියාමක වෙත පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන්, එසේ වුව ද, එම කරුණුවලට සීමා නොවන, පහත සඳහන් දේ සම්බන්ධයෙන් මාර්ගෝපදේශ සපයනු ලැබිය යුතු ය. එනම් -

(i) විදුලිබල වර්ධනයේ අඛණ්ඩ සංවර්ධනය වෙනුවෙන් ජාතික ඉලක්ක කරා එළඹීම සඳහා සහ මේ පනත මගින් නියම කර ඇති ආකාරයට බලපත්‍ර ප්‍රදානය කිරීමේ, නියාමනය කිරීමේ සහ පරීක්ෂණ කටයුතුවලට අදාළ අධීක්ෂණය කිරීමේ යාන්ත්‍රණ වෙනුවෙන් ශ්‍රී ලංකාවේ විදුලිබල අවශ්‍යතාවය තක්සේරු කිරීම;

(ii) පුනර්ජනනීය බලශක්ති වැඩි කිරීම සඳහා ජාතික ඉලක්ක හඳුනාගැනීම සහ ළඟාකර ගත හැකි සහ අඛණ්ඩ ආකාරයකින් රටෙහි බලශක්ති සුරක්ෂිතතාවය වැඩිදියුණු කිරීම;

(iii) නව උත්පාදන ධාරිතාවය, නව උත්පාදකයන් සඳහා අනුමතය ප්‍රදානය කිරීමේ දී සහ තරගකාරී ලංසු

තැබීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියක් හරහා නව ධාරිතා සපයන්නන් තෝරා ගැනීමේ දී අනුගමනය කරනු ලැබිය යුතු කාර්යපටිපාටිය නිශ්චිතව දැක්වීම, භාවිත කිරීමට නියමිත ශිල්ප ක්‍රම සහ ආකෘති නියම කරනු ලබන පරිදි විය යුතු අතර, ජාතික පද්ධති ක්‍රියාකරු විසින් එම ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු ය;

(iv) ශ්‍රී ලංකාවේ විදුලිබලය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදා හැරීම, වෙළෙඳාම් කිරීම, සැපයීම සහ ප්‍රසම්පාදනය කිරීම සම්බන්ධයෙන් වූ ක්‍රියාකාරකම් හා සම්බන්ධිත පද්ධති ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යෑම සඳහා බලපත්‍රලාභීන් විසින් වර්ධනය කිරීමට නියමිත ජාලක කේත සංග්‍රහය සහ වෙනත් යම් කාර්යපටිපාටි පිළිබඳ අත්පොත් ඇතුළු ව්‍යවහාර සංග්‍රහ සහ තාක්ෂණික මෙන්ම මෙහෙයුම් සංග්‍රහ සහ ප්‍රමිති පිළියෙල කිරීම;

(v) 26 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ජාතික ගාස්තු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලැස්වීම සහ, කලින් කල, එම ගාස්තු සමාලෝචනයක් සිදු කිරීමට භාර ගැනීම;

(vi) තරගකාරීත්වය සහ පාරිභෝගික වරණය හඳුන්වා දීම සඳහා විදුලිබල වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ ආරම්භ කිරීමේ දී අනුගමනය කළ යුතු මූලධර්ම සහ ප්‍රතිපත්ති හඳුනාගැනීම;

(vii) විදුලිබලය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදා හැරීම, තොග අලෙවිය සහ වෙළෙඳාම් කිරීම සම්බන්ධයෙන් විදුලිබල කර්මාන්තයේ සුබ සිද්ධියට අගතිදායක නොවන ලෙස සලකනු ලබන ආකාරයට VII වන කොටසේ නිශ්චිතව දක්වා ඇති බලපත්‍ර නිකුත් කිරීම;

(viii) පාරිභෝගිකයන් වෙත සියලු අවස්ථාවල දී විශ්වසනීය සහ සාධාරණ මිල ගණන් යටතේ විදුලිබල සැපයුමක් පවතින බව සහතික කිරීම සහ බෙදා හැරීමේ පිරිවැය අවම කිරීම;

(ix) එක් එක් ලිත් වර්ෂය සම්බන්ධයෙන් විදුලිබල කර්මාන්තයේ වාර්තා සකස් කිරීම සහ පළ කිරීම; සහ

(x) විදුලිබල කර්මාන්ත ප්‍රතිසංස්කරණය සඳහා පහසුකම් සැලසීම; සහ

(ආ) පහත දැක්වෙන කරුණුවලට අදාළ වන්නා වූ ද, එසේ වුවද, ඊට සීමා නොවන්නා වූ ද කරුණු සම්බන්ධයෙන් ජාතික පද්ධති ක්‍රියාකරු වෙත මාර්ගෝපදේශ ලබා දීම; එනම්-

(i) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්, කලින් කල, නිශ්චිතව දක්වනු ලැබිය හැකි ආකාරයට පුනර්ජනනීය බලශක්තිවල සහ එම ශක්‍යතා තාක්ෂණයන්හි පෞද්ගලික අංශයේ ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා වෙළෙඳපොළ පාදක වූ සාධන පත්‍ර ඇතුළු දිරි දීමනා ප්‍රදානය කිරීම;

(ii) පහත දැක්වෙන කාරණා සඳහා, විදුලිබල උත්පාදනයේ දී මෙන්ම කලාපීය වෙළෙඳපොළ සමඟ කරනු ලබන බලශක්ති වෙළඳාමේ දී පුනර්ජනනීය බලශක්ති විභව උපරිම වශයෙන් භාවිත කිරීම සහ කාබන්හරණය ඇතුළු ඉන්ධන විවිධත්වය සහ පුනර්ජනනීය බලශක්ති විභව සංවර්ධනය කිරීම පිළිබඳ සලකා බැලීම, එනම් -

(අ) බෙදාහැරීමේ බලපත්‍රලාභීන් මත සහ විශාල පාරිභෝගිකයන් මත පුනර්ජනනීය බලශක්ති ලිපිගොනු ප්‍රමිති නියම කිරීම මගින් පුනර්ජනනීය බලශක්තිය යොදා ගැනීම සඳහා දිරිමත් කිරීම සහ වෙළෙඳාම් කළ හැකි පුනර්ජනනීය බලශක්ති සහතික පත්‍ර ස්ථාපනය කිරීම සහ ඒ සම්බන්ධ ආකෘති නියම කිරීම සඳහා;

(ආ) වෙළෙඳපොළ පාදක වූ සාධන පත්‍ර භාවිත කරමින් ස්වකීය පුනර්ජනනීය බලශක්ති ලිපි ගොනු ප්‍රමිති සපුරාලීමට එම අස්තිත්වයන්ට ශක්‍යතාව ලබා දීම සඳහා;

(ඇ) නියම කර ඇති ආකාරයට අදියරෙන් අදියර ආකාරයෙන් තරගකාරී විදුලිබල වෙළෙඳ -පොළක් පිහිටුවීම හරහා විදුලිබල කර්මාන්තයේ තරගකාරීත්වය සහ කාර්යක්ෂමතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා;

(ඈ) සුදුසුකම් ඇති පාරිභෝගිකයන් හට විදුලිබල සම්ප්‍රේෂණය සහ බෙදා හැරීමේ ජාලය වෙත

විවෘත ප්‍රවේශය සැපයීම සඳහා; සහ

(ඉ) උත්පාදන ස්ථානවලින් විදුලිබලය ඍජුව ම මිල දී ගැනීම සඳහා ශක්‍යතාව ලබා දීම සඳහා;

(iii) දීර්ඝකාලීන විදුලිබල පද්ධති සංවර්ධන සැලසුම සකස් කිරීම සම්බන්ධයෙන් ජාතික විදුලිබල ප්‍රතිපත්තියේ සැකෙවින් දක්වා ඇති මේ පනතේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය අපේක්ෂා කරනු ලබන ඉලක්ක හඳුනාගැනීම සහ ඒ සඳහා වන පියවරවලට ප්‍රමුඛතාවය ලබා දීම; සහ

(iv) අඛණ්ඩ ආර්ථික වර්ධනය සඳහා අවශ්‍ය වන ජාතික ඉලක්ක සහ ජාත්‍යන්තර බැඳීම් සපුරාලීම පිණිස යටත් පිරිසෙයින් අවම පිරිවැයකින් සහ නිශ්චිත විශ්වසනීයත්වයකින් යුතුව විදුලිබලය සැපයීමට ශක්‍යතාව ලබා දීම.

(12) (අ) අදාළ යම් ලිඛිත නීතියකට යටත්ව, නියාමක සහ ජාතික පද්ධති ක්‍රියාකරු විසින් වහාම (11) වන උපවගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද යම් ලිඛිත ප්‍රතිපත්ති මාර්ගෝපදේශ බලාත්මක කරනු ලැබිය යුතු ය.

(ආ) ප්‍රතිපත්ති මාර්ගෝපදේශ බලාත්මක කිරීමේ දී පැන නැගිය හැකි යම් දුෂ්කරතා සම්බන්ධයෙන් නියාමක සහ ජාතික පද්ධති ක්‍රියාකරු විසින් අමාත්‍යවරයා දැනුවත් කරනු ලැබිය හැකි ය. අමාත්‍යවරයා විසින්, නියාමක සහ ජාතික පද්ධති ක්‍රියාකරු විමසා, පනතේ මූලික ව්‍යූහය තුළ සහ අදාළ ප්‍රතිපත්ති මාර්ගෝපදේශවලට අදාළ මූලධර්ම තුළ එම දුෂ්කරතාවලට මුහුණදීමේ දී යොදාගත යුතු පියවර නිශ්චය කරනු ලැබිය යුතු අතර, ඒ සම්බන්ධව නියාමකට සහ ජාතික පද්ධති ක්‍රියාකරුට දැනුම් දෙනු ලැබිය යුතු ය.

## III වන කොටස

### විදුලිබල කර්මාන්තය සඳහා වූ නියාමක

**ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විදුලිබල කර්මාන්තයේ නියාමක විය යුතු බව**

5. (1) මේ පනතේ "මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනත යටතේ පිහිටුවන ලද (මේ පනතේ "නියාමක" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව, පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත් වන දින සිට විදුලිබල කර්මාන්තයේ නියාමක ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) විදුලිබල කර්මාන්තයට අදාළව නියාමකගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී, නියාමක විසින් සියලු අවස්ථාවල දී, යුක්තිසහගතව, සාධාරණ ලෙස, අපක්ෂපාති ලෙස සහ ස්වාධීනව මෙන්ම කාලානුරූපීව, විනිවිදභාවයෙන් යුතුව, වාස්තවිකව සහ මේ පනතේ මූලධර්ම සහ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කරනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, යම් නිශ්චිත කරුණක් සම්බන්ධයෙන් මේ පනතේ කිසිදු විධිවිධානයක් සලසා නොමැති අවස්ථාවක දී, නියාමක විසින් ඒ පිළිබඳව තීරණය කිරීම පිණිස ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනතේ අදාළ විධිවිධාන අදාළ කරගනු ලැබිය හැකි යඃ

එසේම තවදුරටත්, විදුලිබල කර්මාන්තයට අදාළ වන මේ පනතේ විධිවිධාන සහ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනතේ විධිවිධාන අතර යම් ගැටුමක් ඇති වන අවස්ථාවක දී, මේ පනතේ විධිවිධාන බලාත්මක විය යුතු ය.

**නියාමක විසින් රෙජිස්ටරයක් පවත්වාගෙන යා යුතු බව**

6. (1) නියාමක විසින්, මේ පනත යටතේ වූ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා නියම කරනු ලැබිය යුතු ආකෘතියකින් ස්වකීය කාර්යාලයේ රෙජිස්ටරයක් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(2) නියාමක විසින්, එම රෙජිස්ටරයේ පහත දැක්වෙන කාරණා ඇතුළත් කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු යඃ-

(අ) නිකුත් කරන ලද සෑම බලපත්‍රයකට ම සහ මේ පනත යටතේ ප්‍රදානය කරනු ලැබූ සෑම නිදහස් කිරීමකට ම අදාළ තොරතුරු;

(ආ) ප්‍රදානය කරනු ලැබූ යම් බලපත්‍රයක කොන්දේසි වෙනස් කිරීමට හෝ එවැනි යම් බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීමට අදාළ තොරතුරු;

(ඇ) සෑම නියමයක් ම, විධානයක් ම සහ තීරණයක් ම ඇතුළු නියාමකගේ සෑම තීරණයක් ම;

(ඈ) මේ පනත ප්‍රකාරව සාදනු ලබන සෑම බලාත්මක කිරීමේ නියමයක් ම;

(ඉ) නියාමකගේ මුද්‍රාව තබා ඇති වෙනත් යම් සාධන පත්‍රයක් හෝ ලේඛනයකට අදාළ තොරතුරු; සහ

(ඊ) මේ පනත ප්‍රකාරව පවත්වනු ලබන යම් මහජන අදහස් විමසීමක කටයුතු පිළිබඳ වාර්තා.

(3) රෙජිස්ටරයේ අන්තර්ගත කරුණු දවසේ සාධාරණ කාලයක් තුළ දී ජනතාව විසින් පරීක්ෂා කර බැලීම සඳහා ඉදිරිපත් කර තබනු ලැබිය යුතු ය. රෙජිස්ටරයේ අන්තර්ගත යම් තොරතුරක් පිළිබඳ සහතික පිටපත් නියමිත ගාස්තුවක් ගෙවා ඉල්ලුම් කිරීමේ දී ඉල්ලුම්කරු වෙත සපයනු ලැබිය යුතු ය. රෙජිස්ටරයේ අන්තර්ගත තොරතුරු නියාමකගේ වෙබ් අඩවියේ ද පළ කරනු ලැබිය හැකි ය.

තොරතුරු ඉල්ලා සිටීම සඳහා නියාමක සතු බලතල

7. (1) නියාමක විසින්, මේ පනත යටතේ වූ ස්වකීය කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ සහ ඉටු කිරීමේ කාර්යය සඳහා, ලිඛිත දැන්වීමක් මගින්, එකී දැන්වීමේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් කාලසීමාවක් ඇතුළත නියාමක වෙත හෝ නියාමක විසින් තත්කාර්යය සඳහා බලය පවරන ලද වෙනත් යම් තැනැත්තකු වෙත, අවස්ථාවෝචිත පරිදි, යම් බලපත්‍රලාභියකුගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ භාරයේ ඇති එකී දැන්වීමේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි සියලු තොරතුරු හෝ ලේඛන සපයන ලෙස එකී සෑම බලපත්‍රලාභියකු සහ වෙනත් යම් තැනැත්තන් වෙත නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් මගින් සපයන ලෙස නියම කොට ඇති යම් තොරතුරු හෝ ලේඛන, එම තොරතුරු හෝ ලේඛන සපයන ලෙස නියම කොට ඇති

තැනැත්තා හෝ බලපත්‍රලාභියා විසින් එම තොරතුරු හෝ ලේඛන සැපයීම තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක් ප්‍රකාරව තහනම් කර ඇත්නම් මිස, එකී නියමයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත, එම නියමයට අනුකූලව කටයුතු කිරීම, එම බලපත්‍රලාභියාගේ හෝ තැනැත්තාගේ වගකීම වන්නේ ය.

(3) 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධානවලට යටත්ව, එම තොරතුරු හෝ ලේඛන සපයනු ලබන බලපත්‍ර ලාභියාගේ හෝ තැනැත්තාගේ කැමැත්ත ඇතිව මිස, (1) වන උපවගන්තිය යටතේ සපයන ලද කිසිදු තොරතුරක් හෝ ලේඛනයක් නියාමක විසින් පළ කිරීම හෝ වෙනත් යම් තැනැත්තකු වෙත හෙළිදරව් කිරීම කරනු නොලැබිය යුතු ය.

(4) නියාමක විසින්, (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද යම් තොරතුරු හෝ ලේඛන, එම තොරතුරු හෝ ලේඛන සපයනු ලබන බලපත්‍රලාභියාගේ හෝ තැනැත්තාගේ කැමැත්තෙන් තොරව එකී තොරතුරක් හෝ ලේඛනයක් -

(අ) යම් අධිකරණයක් විසින් එම තොරතුරු හෝ ලේඛන ඉදිරිපත් කරන ලෙස නියම කිරීමේ දී, එම අධිකරණය වෙත; හෝ

(ආ) මේ පනත මගින් නියාමක වෙත පවරා ඇති යම් කර්තව්‍යයක් ඉටු කිරීමේ කාර්ය සඳහා; හෝ

(ඇ) මේ පනත යටතේ ප්‍රදානය කරන ලද බලපත්‍රයක යම් තොරතුරක් සපයන ලෙසට නියම කරමින් වන කොන්දේසියකට අනුකූලව ක්‍රියා කිරීමට ඉඩ සැලැස්වීමේ කාර්ය සඳහා; හෝ

(ඈ) 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම සඳහා,

එම තොරතුරු සපයන ලද තැනැත්තාගේ කැමැත්තෙන් තොරව හෙළිදරව් කිරීම, (3) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කිරීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

විදුලි පරීක්ෂකවරුන්

8. (1) නියාමක විසින්, මේ පනතේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි යථා පරිදි සුදුසුකම්ලත් තැනැත්තන් යම් සංඛ්‍යාවක් විදුලි පරීක්ෂකවරුන් ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(2) පහත දැක්වෙන කර්තව්‍ය ද ඇතුළුව මේ වගන්තිය ප්‍රකාරව හෝ මේ පනතේ අනෙකුත් විධිවිධාන ප්‍රකාරව තමා වෙත පවරන ලද කර්තව්‍ය ඉටු කිරීම (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද විදුලි පරීක්ෂකවරයකුගේ කාර්යය විය යුතු යː-

(අ) විදුලිබලය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, තොග මිල දී ගැනීම් සහ තොග අලෙවිය ඇතුළු වෙළෙඳාම් කිරීම, බෙදාහැරීම හෝ සැපයීම සඳහා බලපත්‍රයක් මගින් බලය දී ඇත්තා වූ හෝ බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබ ඇත්තා වූ තැනැත්තන්ට අයත් විදුලි මාර්ග සහ විදුලි පිරියත සෝදිසි කිරීම සහ පරීක්ෂා කිරීම;

(ආ) පාරිභෝගිකයකුගේ පරිශ්‍රය තුළ වූ යම් විදුලි මාර්ගයක් සහ විදුලි පිරියතක්, එම විදුලි මාර්ගය හෝ පිරියතය සම්බන්ධයෙන් හෝ එම විදුලි මාර්ගය හෝ පිරියතය හරහා හෝ එමගින් විදුලිබලය සැපයීම සම්බන්ධයෙන් මේ පනත හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් ප්‍රකාරව පනවා ඇති යම් නියමයක් සමග අනුකූල වී ඇද්ද යන්න සොයා දැනගැනීම සඳහා යම් පාරිභෝගිකයකු විසින් ඉල්ලා සිටින්නේ නම් සහ එසේ ඉල්ලා සිටින අවස්ථාවක, එම විදුලි මාර්ගය හෝ විදුලි පිරියතය පරීක්ෂා කිරීම සහ සෝදිසි කිරීම ;

(ඇ) නියාමක විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි (අ) හෝ (ආ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති කර්තව්‍යවලට අදාළ වෙනත් යම් ආනුෂංගික කර්තව්‍ය ඉටු කිරීම.

(3) (අ) විදුලි පරීක්ෂකවරුන් විසින්, මේ වගන්තිය ප්‍රකාරව ඔවුන් වෙත පවරා ඇති පරීක්ෂණයකට හෝ සෝදිසි කිරීමකට අදාළ කර්තව්‍ය නියාමකගේ අධීක්ෂණය යටතේ සිදු කරනු ලැබිය යුතු ය. මේ වගන්තිය ප්‍රකාරව සිදු කරනු ලැබූ පරීක්ෂණයක් හෝ සෝදිසි කිරීමක් සම්පූර්ණ කිරීමෙන් පසු, එම විදුලි පරීක්ෂකවරුන් විසින්, සිදු කරන ලද සෑම විදුලි මාර්ග හෝ විදුලි පිරියත පරීක්ෂා කිරීමකට ම හෝ සෝදිසි කිරීමකට ම අදාළව එකී පරීක්ෂකවරුන් විසින් ඔවුන්ගේ සොයා ගැනීම් පිළිබඳ වාර්තාවක් නියාමක වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) එසේ ඉදිරිපත් කරනු ලැබූ යම් වාර්තාවක් සමාලෝචනය කිරීමෙන් පසු, නියාමක විසින්, විදුලි පරීක්ෂකවරයකුගේ සොයා ගැනීම් සමග එකඟ වීම හෝ එකඟ නොවීම කරනු ලැබිය හැකි ය. එම සොයා ගැනීම් සමග එකඟ නොවන අවස්ථාවක දී, එම

වාර්තාව ක්‍රියාත්මක කිරීමට පෙර, එම වාර්තාවට අවශ්‍ය වෙනස් කිරීම් සිදු කරන ලෙස නියාමක විසින් අදාළ විදුලි පරීක්ෂකවරයාට නියම කරනු ලැබිය හැකි ය.

(4) පහත දැක්වෙන කාරණා සියල්ල හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් මේ වගන්තියේ කාර්ය සඳහා නියාමක විසින් රීති සාදනු ලැබිය හැකි යː-

(අ) විදුලි පරීක්ෂකවරුන් ලෙස පත් කරනු ලබන තැනැත්තන්ගේ සුදුසුකම්;

(ආ) විදුලි පරීක්ෂකවරුන් වෙත පනවා ඇති කාර්ය ඉටු කරනු ලැබිය යුතු ආකාරය සහ එසේ ඉටු කරනු ලැබිය යුතු කාලසීමාවන් දැක්වීම;

(ඇ) විදුලිබලය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, වෙළෙඳාම් කිරීම, බෙදා හැරීම හෝ සැපයීම සඳහා බලපත්‍රයක් මගින් බලය පවරනු ලැබ ඇති හෝ බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇති තැනැත්තන්ට -

(i) විදුලි පරීක්ෂකවරුන් වෙත වාර්තා හෝ වෙනත් අදාළ තොරතුරු සපයන ලෙස; සහ

(ii) එම විදුලි පරීක්ෂකවරුන් වෙත, පරිශ්‍ර වෙත ප්‍රවේශ වීමට සහ විදුලි පිරියත සහ වෙනත් පහසුකම් භාවිත කිරීම සඳහා ඉඩ ලබා දෙන ලෙස,

නියම කිරීම;

(ඈ) එකී විදුලි පරීක්ෂකවරුන් වෙත ගාස්තු වශයෙන් ගෙවිය යුතු යම් මුදලක් වේ නම්, එම මුදල සහ එම ගාස්තු ගෙවිය යුතු තැනැත්තන් නිශ්චිතව දැක්වීම;

(ඉ) විදුලි පරීක්ෂකවරුන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ විගණනයක් සිදු කිරීමේ දී ජාතික පද්ධති ක්‍රියාකරු විසින් අනුගමනය කරනු ලැබිය යුතු කාර්යපටිපාටිය දැක්වීම;

(ඊ) විදුලිබලය සැපයීමේ ස්වකීය වගකීමෙන් බලපත්‍රලාභියකු නිදහස් කරනු ලැබිය හැකි අවස්ථානුගත කරුණු හඳුනාගැනීම; සහ

(උ) (2) වන උපවගන්තියේ (අ) හෝ (ආ) ඡේදවල විධිවිධාන සලස්වා ඇති පරිදි විදුලි මාර්ග හෝ විදුලි පිරියත පරීක්ෂා කිරීමට හෝ සෝදිසි කිරීමට අදාළව විදුලි පරීක්ෂකවරයකු සහ පාරිභෝගිකයකු හෝ බලපත්‍රලාභියකු අතර නොඑකඟතාවයක් ඇති වූ අවස්ථාවක අනුගමනය කළ යුතු කාර්යපටිපාටිය දැක්වීම.

(5) මේ වගන්තිය යටතේ විදුලි පරීක්ෂකවරයාට ලැබෙන යම් ගාස්තුවක් ශ්‍රී මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනතේ 31 වන වගන්තිය යටතේ පිහිටුවන ලද නියාමකගේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

## IV වන කොටස

### ජාතික පද්ධති ක්‍රියාකරු පිහිටුවීම

ජාතික පද්ධති ක්‍රියාකරු බලපත්‍රය නිකුත් කිරීම සඳහා වන යෝග්‍යතාවය

9. 2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව සංස්ථාගත කරන ලද්දා වූ ද, කොටස්වලින් සියයට සියයක් ශ්‍රී ලංකා රජය විසින් දරනු ලබන්නා වූ ද, පොදු සමාගමක් මේ පනත ප්‍රකාර ජාතික පද්ධති ක්‍රියාකරු බලපත්‍රය නිකුත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමට යෝග්‍යතාවය ලැබිය යුතු ය.

ජාතික පද්ධති ක්‍රියාකරු වෙත බලපත්‍රය නිකුත් කිරීම සහ කර්තව්‍ය

10. (1) 9 වන වගන්තියේ දක්වා ඇති සමාගමක් (මෙහි මින් මතු "ජාතික පද්ධති ක්‍රියාකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික පද්ධති ක්‍රියාකරු විය යුතු අතර, නියමිත දිනෙන් මාස නවයක් ඇතුළත එකී සමාගම වෙත ජාතික පද්ධති ක්‍රියාකරු බලපත්‍රය නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) ජාතික පද්ධති ක්‍රියාකරු පහත දැක්වෙන කරුණු සඳහා වගකිව යුතු යː-

(අ) ජාතික පද්ධති ක්‍රියාකරුගේ අධීක්ෂණය යටතේ ජාතික විදුලි ප්‍රේෂණ මධ්‍යස්ථානයක් පිහිටුවීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම සහ ශ්‍රී ලංකා ජාතික ජාලකය තථ්‍ය කාලයේ ක්‍රියාත්මක කිරීමේ කර්තව්‍යය

ජාතික විදුලි ප්‍රේෂණ මධ්‍යස්ථානය වෙත පැවරීම සහ එය ජාතික පද්ධති ක්‍රියාකරුගේ අධීක්ෂණය යටතේ සිදු කිරීම;

(ආ) ජාතික පද්ධති ක්‍රියාකරු විසින්, එළඹෙන වර්ෂය තුළ දී නිෂ්පාදනය කිරීමට අපේක්ෂිත නව උත්පාදන ධාරිතාව ඇතුළුව, පවත්නා උත්පාදන ධාරිතාවෙන් ප්‍රක්ෂේපිත විදුලි ඉල්ලුම සපුරා ගැනීමට අපේක්ෂා කරන ආකාරය දැක්වෙන වාර්ෂික විදුලිබල ප්‍රසම්පාදන සැලැස්මක් සෑම වර්ෂයක ම සැප්තැම්බර් මස තිස්වන දින හෝ එදිනට පෙර නියාමක වෙත ඉදිරිපත් කිරීම;

(ඇ) වාර්ෂික විදුලිබල ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රක්ෂේපිතයන් මත පදනම්ව රටේ විදුලිබල පද්ධතියේ ඒකාබද්ධ ක්‍රියාකාරිත්වය සහ වාර්ෂික විදුලිබල ප්‍රසම්පාදන සැලැස්මෙන් බැහැරව සිදුව ඇති විචලනයන් අධීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම අවශ්‍ය පරිදි සිදු කිරීම සහතික කිරීම;

(ඇ) තථ්‍ය කාලය තුළ විදුලිබල සම්ප්‍රේෂණය, සැපයුම හා ඉල්ලුම අතර ඇති වෙනස සහතික කිරීම සඳහා විදුලිබල පද්ධතිය සමායෝජිතව ක්‍රියාත්මක කිරීම. සහ එකී කාර්යය සඳහා -

(i) නියම කරනු ලැබිය යුතු උපරිම උත්පාදන කාලසටහන්ගත කිරීම සහ ප්‍රේෂණය සම්බන්ධයෙන් වන මූලධර්ම, මාර්ගෝපදේශ සහ ක්‍රමවේදවලට අනුකූලව කටයුතු කිරීම සහතික කිරීම;

(ii) යම් දෙන ලද වේලාවක දී මුළු විදුලි ඉල්ලුම සපුරාලීම සඳහා වඩාත්ම ලාභදායක සහ වාසිදායක නියම මත සහ විනිවිදභාවයෙන් සහ වගකිව යුතු ආකාරයකින්, ජාතික පද්ධති ක්‍රියාකරු විසින් එළඹ ඇති හෝ ඔහු වෙත පවරා ඇති විදුලිය මිල දී ගැනීමේ ගිවිසුම් හෝ ප්‍රමාණිකෘත විදුලිය මිල දී ගැනීමේ ගිවිසුම්වලට

අනුකූලව උපරිම උත්පාදන කාලසටහන්ගත කිරීම සහ උත්පාදන පිරියතවලින් විදුලිබලය ප්‍රේෂණය කිරීම සහතික කිරීම, අනුගමනය කළ යුතු කාර්යපටිපාටීන් සහ භාවිත කළ යුතු ගිවිසුම් ආකෘති නියම කරනු ලබන පරිදි විය යුතු ය;

(iii) ජාලක ප්‍රමිතීන්ට සහ ජාලක කේත සංග්‍රහයට අනුකූලව ශ්‍රී ලංකාවේ ජාතික ජාලකය සුරක්ෂිතව සහ ලාභදායක ලෙස ක්‍රියාත්මක කිරීම මගින් ජාලකයේ පාලනය සඳහා වන තථ්‍ය කාල මෙහෙයුම් සහ දෛනික විදුලිබල ප්‍රේෂණය සිදු කිරීම, ජාලකයේ මෙහෙයුම් අධීක්ෂණය කිරීම සහ නියම කරනු ලබන ආකාරයෙන්, ප්‍රේෂණ විගණනය සිදු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සහ දත්ත නියාමක වෙත ලබා දීම සහතික කිරීම;

(ඉ) විචයනීය නොවන සම්ප්‍රේෂණ තදබදය කළමනාකරණය කිරීම කාලෝචිත සහ සඵලදායී ආකාරයකින් සිදු කිරීම සහතික කිරීම;

(ඊ) විදුලිය ආනයනය කිරීම සහ අපනයනය කිරීම අධීක්ෂණය කිරීම ඇතුළුව, විදුලිය මිල දී ගැනීමේ ගිවිසුම් හෝ ප්‍රමාණීකෘත විදුලිය මිල දී ගැනීමේ ගිවිසුම් මගින් උත්පාදන බලපත්‍රලාභියකුගෙන් විදුලිබලය තොග වශයෙන් මිල දී ගැනීම සහ විදුලිය විකිණීමේ ගිවිසුම් මගින් බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ට හෝ නියාමකගේ පූර්ව අනුමතය ඇතිව වෙනත් පාරිභෝගිකයන්ට හෝ විදුලිය විකිණීම හෝ කලාපීය වෙළෙඳපොළ සමඟ විදුලිය වෙළෙඳාම් කිරීම සම්බන්ධයෙන් වන සියලු මූල්‍ය ගනුදෙනු වාර්තාගත කිරීම සඳහා තොග සැපයුම් ගිණුමක් පිහිටුවීම: අනුගමනය කළ යුතු

කාර්යපටිපාටීන් සහ තොග සැපයුම් ගිණුමේ ආකෘති සහ භාවිත කළ යුතු ගිවිසුම් ආකෘති නියම කරනු ලබන පරිදි විය යුතු ය;

(උ) ශ්‍රී ලංකාවේ ජාතික ජාලකය මගින් සම්ප්‍රේෂණය කරනු ලබන විදුලිබලයේ ප්‍රමාණය සහ ගුණාත්මකභාවය පිළිබඳ වාර්තා පවත්වාගෙන යාම;

(ඌ) ශ්‍රී ලංකාවේ ජාතික ජාලකයේ සමස්ත ක්‍රියාකාරිත්වය විෂයයෙහි අධීක්ෂණය සහ පාලනය ක්‍රියාත්මක කිරීම;

(එ) මතු දිනයක දී විදුලිබල පද්ධතියට පුනර්ජනනීය බලශක්තිය වඩාත් වැඩි ලෙස ඒකාබද්ධ කිරීම මගින් ජනිත වන පුනර්ජනනීය බලශක්තියේ සවිරාම ස්වභාවය කළමනාකරණය කිරීම සඳහා, නියාමකගේ අනුමතය ඇතිව, කලින් කල, ජාතික පද්ධති ක්‍රියාකරු විසින් තීරණය කරනු ලබන්නා වූ, බලශක්තිය ගබඩා කිරීමේ සහ ආනුෂංගික සේවා සපයා ගැනීම සඳහා වගකිය යුතු යඃ

එසේ වුව ද, ජාතික පද්ධති ක්‍රියාකරු විසින්, නියම කරනු ලබන ආකාරයෙන් සහ නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව මිස, යම් වාණිජමය කටයුත්තක නොයෙදිය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින්, ඔහු විසින් අවශ්‍ය යයි සලකනු ලබන පරිදි නියාමක විමසීමෙන් පසු, ජාතික පද්ධති ක්‍රියාකරු විසින් (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාරණා ක්‍රියාත්මක කළ යුතු කාර්යපටිපාටිය, ආකෘතිය සහ ආකාරය නියම කරනු ලැබිය යුතු ය.

(4) සැක දුරු කිරීම සඳහා, නියමිත දින සිට සහ ඉන්පසු, 17 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇතිඃ-

(අ) උත්පාදන පිරියතවල උත්පාදන කාලසටහන්ගත කිරීම, පවරා දීම සහ යෝග්‍යතා ක්‍රමයට අනුව ලාභදායක ලෙස ප්‍රේෂණය කිරීම;

(ආ) පිරිවැය, ආර්ථික වටිනාකම සහ කාබන්හරණ පරමාර්ථ සැලකිල්ලට ගනිමින් විදුලි ඉල්ලුම සපුරාලීම සඳහා

අනාගත විදුලිබල පද්ධතිය උපරිම ලෙස සැලසුම් කිරීම;

(ඇ) ජාතික විදුලි ප්‍රේෂණ මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම; සහ

(ඈ) උත්පාදන බලපත්‍රලාභීන්ගෙන් තොග වශයෙන් විදුලිබලය ලබා ගැනීම සහ එසේ තොග වශයෙන් ලබාගත් විදුලිබලය බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ට සහ දේශීය, කලාපීය හෝ ජාත්‍යන්තර වෙළෙඳපොළේ වෙළෙඳාම් කරන වෙනත් පාරිභෝගිකයන්ට විකිණීම,

සම්බන්ධයෙන් වන ලංකා විදුලිබල මණ්ඩලයේ කර්තව්‍ය පැවරීම ඉහත කී ලංකා විදුලිබල මණ්ඩලයේ කර්තව්‍ය ජාතික පද්ධති ක්‍රියාකරු වෙත පැවරීමට ආනුෂංගිකව සිදු කරනු ලැබිය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

(5) ජාතික පද්ධති ක්‍රියාකරු විසින්, වසර පහක කාලසීමාවක් ආවරණය වන දීර්ඝකාලීන විදුලිබල පද්ධති සංවර්ධන සැලැස්ම පිළියෙල කරනු ලැබිය යුතු අතර, එයට උත්පාදන සහ සම්ප්‍රේෂණ ධාරිතාව යන දෙවර්ගය ම, බලශක්තිය ගබඩා කිරීම සහ ආනුෂංගික සේවා එකතු කිරීම් ඇතුළත් විය යුතු ය. තව ද, එය 4 වන වගන්තිය යටතේ සකස් කරන ලද යථා පරිදි අනුමත කළ ජාතික විදුලිබල ප්‍රතිපත්තියට අනුකූලව (6) වන, (7) වන සහ (8) වන උපවගන්තිවල නිශ්චිතව දක්වා ඇති කාරණාවලින් සහ විදුලිබල පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා වන ආණ්ඩුවේ ඉලක්ක සහ පරමාර්ථ දැක්වෙන වසර දහයක සිට වසර පහළොවක වැඩිදුර කාලසීමාවක් සඳහා වන පර්යාලෝක සැලැස්මකින් ද සමන්විත විය යුතු ය.

(6) ජාතික පද්ධති ක්‍රියාකරු විසින්, එකී දීර්ඝකාලීන විදුලිබල පද්ධති සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීමේ දී, ආර්ථික වශයෙන් වඩාත්ම වාසිදායක විදුලිබල උත්පාදන ධාරිතාවේ උපයෝජ්‍යතාව සැලකිල්ලට ගනු ලැබිය යුතු අතර, එය නියාමක වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(7) උත්පාදන බලපත්‍රලාභීන්, ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු සහ අදාළ පරදු දරන්නන් විමසීමෙන් පසු, නියාමක විසින්, එකී සකස් කළ සැලැස්ම අවසන් කර එය අමාත්‍යවරයාගේ අනුමතය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එකී අනුමතයට අමාත්‍යවරයා විසින් යෝජනා කරනු ලැබිය හැකි යම් සංශෝධන ඇතුළත් විය යුතු ය.

(8) ජාතික පද්ධති ක්‍රියාකරු අනුමත දීර්ඝකාලීන විදුලිබල පද්ධති සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු ලෙස සලකනු ලැබිය යුතු ය.

(9) ජාතික පද්ධති ක්‍රියාකරු විසින් අනුමත සැලැස්මෙන් බැහැරව සිදු කරන ලද විචලනයන් අමාත්‍යවරයා වෙත නොපමාව දැනුම් දෙනු ලැබිය යුතු ය.

(10) ජාතික පද්ධති ක්‍රියාකරු විසින්, සිදු කරන ලද විචලනයන් සහ එකී විචලනයන් සඳහා වන හේතු නිශ්චිතව දක්වන වාර්තාවක් අමාත්‍යවරයාගේ අනුමතය සඳහා වාර්ෂිකව ඔහු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(11) නියාමකගේ අනුමතය ඇතිව, අලුත් උත්පාදන පිරියතයක ආකාරයෙන් හෝ පවත්නා උත්පාදන පිරියතයක් විශාලනය කිරීම මගින් හෝ බලශක්තිය ගබඩා කිරීමේ සහ ආනුෂංගික සේවා සපයන්නන්ගෙන් අනුමත දීර්ඝකාලීන විදුලිබල සංවර්ධන සැලැස්මට අනුකූලව, විදුලිබල උත්පාදන ධාරිතා, බලශක්තිය ගබඩා කිරීමේ ධාරිතා හෝ වෙනත් යම් ආකාරයක ආනුෂංගික සේවා ධාරිතාවක්, අවස්ථාවෝචිත පරිදි, ප්‍රසම්පාදනය කිරීම සඳහා දීර්ඝකාලීන විදුලිබල සංවර්ධන සැලැස්මට -

(අ) අඩුම ආර්ථික පිරිවැයකින් යුත් උත්පාදන තාක්ෂණයන්, බලශක්ති පරිවර්තන සහ ගබඩා කිරීමේ තාක්ෂණයන් සහ වෙනත් ඉල්ලුම් අංශ පිළිබඳ තාක්ෂණයක් ඇතුළුව උත්පාදනය පුළුල් කිරීම සහ සම්ප්‍රේෂණ ජාලය සංවර්ධනය කිරීම යන දෙවර්ගය ම සඳහා වන සාධාරණ තක්සේරුගත විදුලි ඉල්ලුම සපුරාලීම සඳහා උත්පාදන පිරියතවල ප්‍රමාණවත් ධාරිතාවක් ඇති බව සහතික කිරීමේ සැලසුම් ඇතුළත් විය යුතු ය;

(ආ) ජාතික විදුලිබල ප්‍රතිපත්තියේ සැකෙවින් දක්වා ඇති ප්‍රමුඛතා සහ වෙනත් සලකා බැලීම් මත පදනම්ව අපේක්ෂිත විදුලි ඉල්ලුම සපුරාලීම සඳහා අවශ්‍ය විදුලිබල උත්පාදන ධාරිතා එකතු කිරීම් හඳුනාගනු ලැබිය යුතු ය;

(ඇ) විදුලිබල පද්ධතියේ විශ්වසනීයත්වය සහ උත්පාදන බලපත්‍රලාභීන්ගෙන් විදුලිබලය හිස්කිරීම සහතික කිරීම සඳහා විදුලිබල සම්ප්‍රේෂණ ධාරිතා එකතු කිරීම් ඇතුළත් විය යුතු ය; එකී ප්‍රසම්පාදනය ශ්‍රී ලංකා ආණ්ඩුවේ ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව සිදු කරනු ලැබිය යුතු අතර, ඍජු ප්‍රසම්පාදනය සහ රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරය යන දෙවර්ගය සඳහාම එය අදාළ විය යුතු ය. තව ද, එකී ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් වන කාර්යපටිපාටිය සහ ඒ සඳහා අවශ්‍ය ආකෘති නියම කරනු ලබන පරිදි විය යුතු යඃ

එසේ වුව ද, (11) වන උපවගන්තියේ විධිවිධාන ජාතික පද්ධති ක්‍රියාකරු බලපත්‍රලාභියා විසින් විදුලිබල උත්පාදන සහ බලශක්ති ගබඩා කිරීමේ ධාරිතාව ප්‍රසම්පාදනය කිරීම සඳහා පමණක් අදාළ විය යුතු අතර, එමගින් උත්පාදන බලපත්‍රලාභීන් සහ විවෘත ප්‍රවේශ කාර්යපටිපාටි භාවිත කරන පාරිභෝගිකයන් සහ වෙනත් ගනුදෙනුකරුවන් අතර වන විදුලිබලය මිල දී ගැනීමේ ගනුදෙනු සම්බන්ධයෙන් කිසිදු බලපෑමක් ඇති නොවිය යුතු ය;

(ඈ) නියාමක විසින් අනුමත කරනු ලබන නියම හා කොන්දේසිවලට යටත්ව සහ අනුමත දීර්ඝකාලීන විදුලිබල පද්ධති සංවර්ධන සැලැස්මට අනුකූලව 14 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ශ්‍රී ලංකාවේ ජාතික ජාලකය වර්ධනය කිරීම සඳහා නව සම්ප්‍රේෂණ ධාරිතාවක් සහ සම්ප්‍රේෂණ වත්කම් හඳුනාගැනීම සහ නව විදුලි පිරියතවලට සම්බන්ධතාව ලබා දීම හෝ කලාපීය වෙළෙඳපොළවල්වලට සම්බන්ධතාව ලබා දීම කරනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, ජාතික පද්ධති ක්‍රියාකරු බලපත්‍රලාභියා විසින්, නියාමකගේ අනුමතය ඇතිව, ඉහත සඳහන් කාර්ය සඳහා, පෞද්ගලික ආයෝජකයන්ගෙන් නව සම්ප්‍රේෂණ වත්කම් ප්‍රසම්පාදනය කිරීම සඳහා ඉදිරි කටයුතු කරනු ලැබිය හැකි ය. එකී ප්‍රසම්පාදනය ශ්‍රී ලංකා ආණ්ඩුවේ ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව සිදු කරනු ලැබිය යුතු අතර, ඍජු ප්‍රසම්පාදනය සහ රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර යන දෙවර්ගය සඳහාම එය අදාළ විය යුතු ය. තව ද, එකී ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් වන කාර්යපටිපාටිය සහ ඒ සඳහා අවශ්‍ය ආකෘති නියම කරනු ලබන පරිදි විය යුතු ය;

(ඉ) නව උත්පාදන ධාරිතාව, බලශක්තිය ගබඩා කිරීමේ සහ ආනුෂංගික සේවාවන් සහ සම්ප්‍රේෂණ ධාරිතාව ප්‍රසම්පාදනය කිරීම ශ්‍රී ලංකා ආණ්ඩුවේ ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව සිදු කරනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, මේ ඡේදය ප්‍රකාරව රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර ලෙස යම් ආයෝජන සිදු කිරීම සඳහා අතිරේක කාර්යපටිපාටීන් අවශ්‍ය විය හැකි අවස්ථාවක, ප්‍රසම්පාදනය ආණ්ඩුවේ ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව සිදු කරනු ලැබිය යුතු අතර, ඍජු ප්‍රසම්පාදනය සහ රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර යන දෙවර්ගය සඳහාම එය අදාළ විය යුතු ය. තව ද, එකී ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් වන කාර්යපටිපාටිය සහ ඒ සඳහා අවශ්‍ය ආකෘති නියම කරනු ලබන පරිදි විය යුතු ය;

(ඊ) 11 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි උත්පාදන බලපත්‍රලාභීන් සමඟ විදුලිය මිල දී ගැනීමේ ගිවිසුම්වලට ද සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන් සමඟ සම්ප්‍රේෂණ සේවා ගිවිසුම්වලට ද එළඹීම කරනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, ලංකා විදුලිබල මණ්ඩලය විසින් එළඹ ඇත්තා වූ ද, නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී වලංගුව සහ ක්‍රියාත්මකව පවතින්නා වූ ද, සියලු විදුලිය මිල දී ගැනීමේ ගිවිසුම් සහ ප්‍රමාණීකෘත

විදුලිය මිල දී ගැනීමේ ගිවිසුම්, එකී දින සිට සහ ඉන් පසු, මේ පනත ප්‍රකාරව එළඹී ඇත්තාක් මෙන් නියමිත දිනයේ සිට මාස නවයක කාලසීමාවක් සඳහා පමණක් දිගට ම වලංගු සහ බලාත්මක විය යුතු යː

එසේම තවදුරටත්, දීර්ඝ කරන ලද වලංගු කාලසීමාව නියාමක විසින් අනුමත කරනු ලැබිය යුතු අතර, බලපත්‍රලාභීන් විසින් ජාතික පද්ධති ක්‍රියාකරු සමඟ නව විදුලිය මිල දී ගැනීමේ ගිවිසුම්වලට සහ නව සම්ප්‍රේෂණ සේවා ගිවිසුම්වලට එළඹෙනු ලැබිය යුතු යː

එසේම තවදුරටත්, එකී මාස නවයක කාලසීමාව ඉකුත්වීමට පෙරාතුව, බලපත්‍රලාභීන් විසින්, සම්ප්‍රේෂණ බලපත්‍රලාභීන් ලෙස අඛණ්ඩව ක්‍රියාකිරීමට ඔවුන්ට අවසර දෙනු ලබන්නා වූ නව බලපත්‍ර ලබා ගැනීම සඳහා මේ පනත ප්‍රකාර නිශ්චිතව දක්වා ඇති සියලු පියවර ගනු ලැබිය යුතු ය. විදුලි උත්පාදන පිරියත සඳහා අවශ්‍ය සියලු ගිවිසුම් සඳහා වන ආකෘති නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(12) අමාත්‍යවරයා විසින්, නියාමකගේ උපදෙස් මත, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින්, ජාතික පද්ධති ක්‍රියාකරු සමඟ ප්‍රමාණිකෘත විදුලිය මිල දී ගැනීමේ ගිවිසුම්වලට එළඹීමට අවසර ලබාදිය හැකි යම් පුනර්ජනනීය බලශක්ති තාක්ෂණයක ධාරිතාව නිශ්චිතව දක්වනු ලැබිය හැකි යː

එසේ වුව ද, එකී තාක්ෂණයේ උපරිම ධාරිතාව මෙගා වොට් දහයකට නොවැඩි විය යුතු ය.

(13) (අ) 1 වන වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මකභාවයට එළඹෙන්නා වූ;

(ආ) තොග විදුලිබල වෙළෙඳපොළ ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරෙන්නා වූ,

තොග විදුලිබල වෙළෙඳපොළක් සංවර්ධනය කිරීම සඳහා දීර්ඝකාලීන විදුලිබල සංවර්ධන සැලැස්ම මඟින් විධිවිධාන

සලසුවනු ලැබිය යුතු අතර, ජාතික පද්ධති ක්‍රියාකරු විසින් තොග වශයෙන් විදුලිබලය ප්‍රසම්පාදනය කිරීම සඳහා සහ ජාතික පද්ධති ක්‍රියාකරුගෙන් විදුලිබලය විකිණීම සඳහා වන කාර්යපටිපාටිය සහ ආකෘති නියම කරනු ලබන පරිදි විය යුතු ය:

එසේ වුව ද, ආණ්ඩුව විසින්, ජාතික ආර්ථිකයේ යහපත උදෙසා, තොග විදුලිබල වෙළෙඳපොළ පිහිටුවීමට පෙරාතුව උත්පාදන බලපත්‍රලාභීන් සමඟ විදුලිය මිල දී ගැනීමේ ගිවිසුම්වලට එළඹීම සඳහා බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ට අවසර දෙනු ලැබිය හැකි ය;

(ඇ) ජාතික පද්ධති ක්‍රියාකරුගේ කර්තව්‍ය හා සම්බන්ධ සියලු සාධාරණ වියදම් අයකර ගනු ලැබිය යුතු අතර, නියාමක විසින් අනුමත කරනු ලබන බදු, ගාස්තු සහ අයකිරීම්, බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ගෙන් අයකර ගැනීම සහ එකතු කිරීම කරනු ලැබිය හැකි ය ; සහ

(ඈ) ජාතික පද්ධති ක්‍රියාකරු විසින් ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු සමඟ ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරුගේ පාලනය යටතේ සම්ප්‍රේෂණ සහ ජාල පහසුකම් සම්බන්ධයෙන් වන ක්‍රියාත්මක කිරීමේ අධිකාරි බලය ජාතික පද්ධති ක්‍රියාකරු වෙත ලබා දෙන්නා වූ සම්ප්‍රේෂණ ක්‍රියාත්මක කිරීමේ ගිවිසුමකට එළඹෙනු ලැබිය යුතු ය.

ගෘහීත උත්පාදන පිරියත සහ සමර්පිත සම්ප්‍රේෂණ මාර්ග

11. (1) මේ කොටසේ පටහැනිව කුමක් සඳහන් වුව ද, යම් තැනැත්තකු විසින්, ගෘහීත උත්පාදන පිරියතක් සහ සමර්පිත සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම, පවත්වාගෙන යාම සහ ක්‍රියාත්මක කිරීම කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද,-

(අ) ශ්‍රී ලංකාවේ ජාතික ජාලකය මාර්ගයෙන් ගෘහීත උත්පාදන පිරියතකින් විදුලිබලය සැපයීම උත්පාදන

බලපත්‍රලාභියකුගේ උත්පාදන ස්ථානයක ආකාරයෙන් ම නියාමනය කරනු ලැබිය යුතු ය;

(ආ) විදුලිබලය උත්පාදනය සහ සම්ප්‍රේෂණය සම්බන්ධයෙන් නියාමක විසින් නිකුත් කරනු ලබන ආරක්ෂක නියෝග, නියාමක විසින් සාදනු ලබන රීති මගින් නියම කරනු ලබන්නා වූ පර්යන්ත ධාරිතාව ඉක්මවන ගෘහීත උත්පාදන පිරියත සම්බන්ධයෙන් පමණක් අදාළ විය යුතු අතර, පර්යන්ත ධාරිතාව ඉක්මවන එවැනි පිරියත සම්බන්ධයෙන් නියාමකගෙන් බලපත්‍ර ලබා ගනු ලැබිය යුතු ය;

(ඇ) එකී ගෘහීත උත්පාදන පිරියත සහ සමර්පිත සම්ප්‍රේෂණ මාර්ග ශ්‍රී ලංකාවේ ජාතික ජාලයට සම්බන්ධ කර ඇත්නම්, එකී ගෘහීත උත්පාදන පිරියත මගින් අවස්ථාවෝචිත පරිදි, ගෘහීත උත්පාදන හෝ සම්ප්‍රේෂණ බලපත්‍රයක් ලබාගනු ලැබිය යුතු ය. ශ්‍රී ලංකාවේ ජාතික ජාලයට සම්බන්ධ කර ඇති එකී ගෘහීත උත්පාදන පිරියත මගින් ජාලක කේත සංග්‍රහයට සහ නියාමක විසින් සහ ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු විසින් නියම කරනු ලබන වෙනත් තාක්ෂණික පරාමිතීන්ට සහ ආරක්ෂණ පියවරවලට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

(2) නියම කරනු ලබන පරිදි ගෘහීත උත්පාදන පිරියතයක් ඉදිකර එකී පිරියතය පවත්වාගෙන යනු ලබන සහ ක්‍රියාත්මක කරනු ලබන සෑම තැනැත්තකු විසින් ම, විවෘත ප්‍රවේශය සම්බන්ධයෙන් නියම කරනු ලබන්නා වූ මාර්ගෝපදේශවලට අනුකූලව සහ ඒ සම්බන්ධයෙන් නිශ්චිතව දක්වනු ලබන අයකිරීම් ගෙවීමෙන් පසුව, එකී පිරියතයේ සිට භාවිත කිරීමට නියමිත ස්ථානය දක්වා විදුලිය ගෙන යාමේ කාර්යය සඳහා විවෘත ප්‍රවේශය ලැබීමේ අයිතිවාසිකම භුක්ති විඳිනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, එකී විවෘත ප්‍රවේශය ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු සහ අදාළ බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් න්ශ්චය කරනු ලබන්නා වූ, ප්‍රමාණවත් සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ ධාරිතාවේ උපයෝජ්‍යතාවයට යටත් විය යුතු ය.

(3) සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ ධාරිතාවේ උපයෝජ්‍යතාවය සම්බන්ධයෙන් වන යම් ආරාවුලක් නියාමක විසින් නිරාකරණය කරනු ලැබිය යුතු ය.

විවෘත ප්‍රවේශය

12. (1) නියාමක, ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු සහ බෙදා හැරීමේ බලපත්‍රලාභියා විමසා, අමාත්‍යවරයා විසින්, මේ පනතේ 1 වන වගන්තිය ප්‍රකාරව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චය කරනු ලබන දිනයක සිට විවෘත ප්‍රවේශය අදාළ වීම ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය. එකී විවෘත ප්‍රවේශය අදියරෙන් අදියර ආකාරයෙන් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු අතර, අනුයාත අදියරවල විවෘත ප්‍රවේශ ප්‍රමාණය නියම කරනු ලබන ආකාරයෙන් සිදු කරනු ලැබිය යුතු අතර, හරස් සහනාධාර ගෙවීම සහ නියම කරනු ලබන වෙනත් මෙහෙයුම් සීමාවන් ඇතුළු කොන්දේසිවලට යටත් විය යුතු ය. විවෘත ප්‍රවේශ අයකිරීම් සහ ඒ සම්බන්ධයෙන් ගෙවිය යුතු යම් අධිභාරයක් VIII වන කොටසේ විධිවිධාන ප්‍රකාරව නියාමක විසින් නිශ්චය කරනු ලබන මුදල් ප්‍රමාණයකින් ගෙවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාරව ලැබුණු අධිභාරය බෙදා හැරීමේ බලපත්‍රලාභියාගේ සැපයුම් ප්‍රදේශය ඇතුළත හරස් සහනාධාරය පියවා ගැනීම සඳහා යොදා ගනු ලැබිය යුතු යඃ

එසේ වුව ද,-

(අ) එකී අධිභාරය සහ හරස් සහනාධාර ජාතික බදු ප්‍රතිපත්තියේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට අනුක්‍රමිකව අඩු කරනු ලැබිය යුතු ය; සහ

(ආ) ස්වකීය භාවිතය සඳහා යම් නියමිත ස්ථානයකට විදුලිබලය රැගෙන යාම සඳහා ගෘහීත උත්පාදන පිරියතයක් පිහිටුවා ඇති තැනැත්තකුට විවෘත ප්‍රවේශය ලබා දෙන්නේ නම්, එකී අධිභාරය අයකරනු නොලැබිය යුතු ය.

## V වන කොටස

### ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු

ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු ලෙස බලපත්‍ර සඳහා ඉල්ලුම් කිරීම සඳහා වන යෝග්‍යතාවය

13. (1) 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කර ඇත්තා වූ ද, එහි කොටස්වලින් සියයට පනහකට වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකා රජය විසින් දරනු ලබන්නා වූ ද, පොදු සමාගමක් නොවන කිසිම තැනැත්තකු ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු ලෙස බලපත්‍රය නිකුත් කිරීම සඳහා මේ පනත ප්‍රකාර ඉල්ලුම් කිරීම සඳහා යෝග්‍යතාවය නොලැබිය යුතු ය.

(2) 10 වන වගන්තියේ (11) වන උපවගන්තියේ (ඇ) ඡේදයට අනුකූලව සම්ප්‍රේෂණ මාර්ගයක් ඉදිකිරීම සඳහා ජාතික පද්ධති ක්‍රියාකරු විසින් ප්‍රදාන ලිපියක් නිකුත් කර ඇති යම් නෛතික තැනැත්තකු විසින් අතිරේක සම්ප්‍රේෂණ බලපත්‍රයක් සහ අදාළ ජාලක කේත සංග්‍රහයට සහ වෙනත් තාක්ෂණික ප්‍රමිතීන්ට සහ පරාමිතීන්ට අනුකූලව ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා අනුමතය ලබා ගැනීම පිණිස නියාමක වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

(3) සැක දුරු කිරීම සඳහා, (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති සීමාව මේ වගන්තිය යටතේ අතිරේක සම්ප්‍රේෂණ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති නෛතික තැනැත්තකු සඳහා අදාළ නොවිය යුතු බව සඳහන් කරනු ලැබේ.

ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු ආදීන්ගේ වගකීම

14. (1) ("ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු" යනුවෙන් සඳහන් කරනු ලබන) 13 වන වගන්තියේ (1) වන උපවගන්තියේ දක්වා ඇති සමාගමක්, ලංකා විදුලිබල මණ්ඩලය විසින් දැනට හිමිකාරීත්වය දරනු ලබන සහ ක්‍රියාත්මක කරනු ලබන සම්ප්‍රේෂණ උපපොළවල ඉහළ වෝල්ටීයතාවයකින් යුතු ස්විච්යතුරු ආම්පන්න ඇතුළුව කි.වො. 33 ට වැඩි වෝල්ටීයතාවයකින් ක්‍රියාත්මක වන (මේ පනතේ "ශ්‍රී ලංකාවේ ජාතික ජාලකය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික සම්ප්‍රේෂණ ජාලය පවත්වාගෙන යාම සඳහා වගකිව යුතු ය.

(2) (අ) ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු, ශ්‍රී ලංකාවේ ජාතික ජාලකයේ භෞතික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, පුළුල් කිරීම සහ නඩත්තු කිරීම හා සම්බන්ධ ලංකා

විදුලිබල මණ්ඩලයේ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා සහ බෙදා හැරීමේ බලපත්‍රලාභීන් සහ දේශීය, කලාපීය හෝ ජාත්‍යන්තර වෙළෙඳපොළේ වෙනත් සුදුසුකම්ලත් අස්තිත්වයන් වෙත තොග වශයෙන් විදුලිබලය සම්ප්‍රේෂණය කිරීම සඳහා වගකිව යුතුය :

එසේ වුව ද, ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු විසින්, යම් ගිවිසුමකට එළඹීම හෝ අන්‍යාකාරයකින් විදුලිබලය උත්පාදනය කිරීම, බෙදා හැරීම, සැපයීම හෝ විකිණීමෙහි යෙදීම කරනු නොලැබිය යුතු ය.

(ආ) මේ උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාරණා ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු විසින් ක්‍රියාත්මක කළ යුතු ආකාරය සහ කාර්යපටිපාටීන් සහ ආකෘතීන්, එසේ විමසීමට අවශ්‍ය යයි අමාත්‍යවරයා විසින් සලකනු ලබන අවස්ථාවක, නියාමක විමසීමෙන් පසු නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(3) නියමිත දිනයට පෙරාතුව ම වන දිනයේ දී -

(අ) ශ්‍රී ලංකාවේ ජාතික ජාලකයේ භෞතික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, පුළුල් කිරීම සහ නඩත්තු කිරීම සහ ශ්‍රී ලංකාව පුරාම කාර්යක්ෂම, සමායෝජිත, විශ්වසනීය සහ පිරිමැසුම්දායක ඒකාබද්ධ සම්ප්‍රේෂණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සහතික කිරීම ;

(ආ) අදාළ බලපත්‍ර ප්‍රකාරව විදුලිබලය සම්ප්‍රේෂණය කිරීම හා සම්බන්ධිත බදු සහ වෙනත් අයකිරීම් අයකර ගැනීම මගින් බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ට සහ සම්ප්‍රේෂණ පද්ධතියට සම්බන්ධ වී සිටින ඉහළ වොල්ටීයතා පාරිභෝගිකයන්ට තොග වශයෙන් විදුලිබල සම්බන්ධතාවය ලබාදීම සහ සම්ප්‍රේෂණය කිරීම,

සම්බන්ධයෙන් 17 වන වගන්තිය ප්‍රකාර ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඉටු කරනු ලබන කර්තව්‍ය පැවරීම (අ) සහ (ආ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති ලංකා විදුලිබල මණ්ඩලයේ කර්තව්‍ය ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරුට පැවරීමට

ආනුෂංගිකව සහ මේ වගන්තියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන්, අවශ්‍ය ජාතික සම්ප්‍රේෂණ පද්ධති ක්‍රියාකරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසුව සිදු කරනු ලැබිය යුතු ය.

(4) ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු විසින් -

(අ) බලපත්‍රයේ නියම සහ මේ පනතේ විධිවිධාන සහ තත්කාර්යය සඳහා ඒ යටතේ සාදන ලද නියෝග සහ රීතිවලට අනුකූලව ජාතික පද්ධති ක්‍රියාකරුගේ අධීක්ෂණය යටතේ, ශ්‍රී ලංකාවේ ජාතික ජාලකය මාර්ගයෙන් විදුලිය සම්ප්‍රේෂණය කිරීම ආරම්භ කරනු ලැබිය යුතු ය;

(ආ) සම්ප්‍රේෂණ ධාරිතාව පිළිබඳ අවශ්‍යතා හඳුනාගැනීම සඳහා සහ දීර්ඝකාලීන විදුලිබල පද්ධති සංවර්ධන සැලැස්ම සකස් කිරීමට පහසුකම් සැලසීම සඳහා ජාතික පද්ධති ක්‍රියාකරුට ආදානයන් සපයනු ලැබිය යුතු ය;

(ඇ) නව සම්ප්‍රේෂණ ධාරිතාවක් සඳහා පෞද්ගලික අංශයේ ආයෝජන ලබා ගැනීම පිණිස ආයෝජනය කිරීම සහ ජාතික ආර්ථිකයේ යහපත උදෙසා වන අවස්ථාවක, එකී ආයෝජන ලබා ගැනීම සඳහා ජාතික පද්ධති ක්‍රියාකරුට පහසුකම් සැලසීම කරනු ලැබිය යුතු ය. එකී ප්‍රසම්පාදනය රජයේ ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව සිදු කරනු ලැබිය යුතු අතර, ඍජු ප්‍රසම්පාදනය සහ රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර යන දෙවර්ගයට ම එය අදාළ විය යුතු ය. තව ද, එකී ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් වන ක්‍රියාපටිපාටිය සහ ඒ සඳහා අවශ්‍ය ආකෘතීන් නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(ඈ) පෞද්ගලික ආයෝජකයන් විසින් ගොඩනගන ලද එකී සම්ප්‍රේෂණ වත්කම්වල පරීක්ෂණ සිදු කිරීමේ දී භෞතිකව සාක්ෂි දැරීම සහ ඉන්පසුව ජාලක කේත සංග්‍රහය සහ අනෙකුත් අදාළ සියලු තාක්ෂණික ප්‍රමිතීන් හෝ පරාමිතීන් අනුගමනය කර ඇති බවට සහතික කරමින් අනුකූලතා සහතිකයක් නිකුත් කළ යුතු ය. අනුකූලතා සහතිකය නිකුත් කිරීමෙන් පසුව,

ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු විසින් පෞද්ගලික ආයෝජකයන් විසින් ගොඩනඟන ලද එකී සම්ප්‍රේෂණ වත්කම් මගින් වෙනස්කොට නොසැලකීමේ පදනමක් මත ශ්‍රී ලංකාවේ ජාතික ජාලකයට සම්බන්ධ කිරීම සිදු කිරීම;

(ඉ) මුළු රට පුරාම කාර්යක්ෂම, සමායෝජිත, විශ්වසනීය සහ පිරිමැසුම්දායක ඒකාබද්ධ සම්ප්‍රේෂණ පද්ධතියක් වැඩිදියුණු කිරීම, පුළුල් කිරීම සහ පවත්වාගෙන යාම;

(ඊ) නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකින් උත්පාදන බලපත්‍රලාභීන්ගෙන් සහ කලාපීය වෙළෙඳපොළවලින්, බෙදා හැරීමේ බලපත්‍රලාභීන්, කලාපීය වෙළෙඳපොළවල් සහ ශ්‍රී ලංකාවේ ජාතික ජාලකයට සම්බන්ධිත වෙනත් සුදුසුකම්ලත් පාරිභෝගිකයන් වෙත තොග වශයෙන් විදුලිය සම්බන්ධ කිරීම සහ සම්ප්‍රේෂණය කිරීම සහ සම්ප්‍රේෂණ ගාස්තු හෝ නියම කරනු ලැබිය හැකි යම් වෙනත් ගාස්තු අයකර ගැනීම;

(උ) සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ බලපත්‍රලාභීන් විසින් හිමිකාරීත්වය දරනු ලබන සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ වත්කම් භාවිතය වෙනුවෙන් වන පිරිවැය ආවරණය කරගැනීම සඳහා නියාමක විසින් නිශ්චය කරනු ලබන පරිදි වන විවෘත ප්‍රවේශ ගාස්තු ගෙවීමට යටත්ව, විවෘත ප්‍රවේශය ප්‍රදානය කිරීම සඳහා නියමිත පූර්ව-කොන්දේසිවලට අනුකූල වීමෙන් පසු ශ්‍රී ලංකාවේ ජාතික ජාලකයේ සියලු සුදුසුකම්ලත් පාරිභෝගිකයන්ට සම්ප්‍රේෂණ සේවාවන්හි විවෘත ප්‍රවේශය සැපයීම;

(ඌ) ශ්‍රී ලංකාවේ ජාතික ජාලකය සම්බන්ධයෙන් වන ජාලක කේත සංග්‍රහය සහ අනෙකුත් තාක්ෂණික සහ මෙහෙයුම් කේත මෙන්ම ප්‍රමිතීන් කෙටුම්පත් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමට ජාතික පද්ධති ක්‍රියාකරු සමඟ සම්බන්ධීකරණය වීම:

එසේ වුව ද, ජාලක කේත සංග්‍රහය නියම කරනු ලැබිය යුතු විධිමත් ආකාරයකට යාවත්කාලීන කරනු ලැබිය යුතු ය;

(එ) ජාලක කේත සංග්‍රහය සහ නිසි පරිදි අනුමත කරන ලද දීර්ඝකාලීන විදුලිබල පද්ධති සංවර්ධන සැලැස්ම ප්‍රකාරව ජාලය පුළුල් කිරීම සඳහා අවශ්‍යතාවයක් ඇති වන කවර හෝ අවස්ථාවක, නියාමක විමසා ඒ සඳහා පහසුකම් සැලසීම;

(ඒ) සම්ප්‍රේෂණ බදු සහ වෙනත් ගාස්තු අයකර ගැනීම සම්බන්ධයෙන් වන යෝජනා, කලින් කලට, නියාමක වෙත ඉදිරිපත් කිරීම; සහ

(ඔ) සම්ප්‍රේෂණ බලපත්‍රය ප්‍රකාරව කරගෙන යනු ලබන සම්ප්‍රේෂණ ව්‍යාපාරය සඳහා වෙනම ගිණුම් පවත්වාගෙන යාම සහ ජාතික පද්ධති ක්‍රියාකරු සමඟ සම්ප්‍රේෂණ ක්‍රියාත්මක කිරීමේ ගිවිසුමකට ඇතුළත් වීම,

කරනු ලැබිය යුතු ය.

සම්ප්‍රේෂණ මාර්ග සහ ජාලක උපපොළ

15. (1) නිසි පරිදි අනුමත කරන ලද දීර්ඝකාලීන බල පද්ධති සංවර්ධන සැලැස්ම ප්‍රකාරව ශ්‍රී ලංකා භූමි ප්‍රදේශය තුළ සම්ප්‍රේෂණ මාර්ග, ජාලක උපපොළවල් සහ වෙනත් ආශ්‍රිත සම්ප්‍රේෂණ පිරියත සහ උපකරණ ගොඩනැඟීමට සහ ජාතික පද්ධති ක්‍රියාකරුගේ ඉල්ලීමක් මත අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව කලාපීය සම්ප්‍රේෂණ ජාල සමඟ සම්බන්ධ කිරීමට ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරුට බලය තිබිය යුතු ය:

එසේ වුව ද, ජාතික පද්ධති ක්‍රියාකරු විසින්, ශ්‍රී ලංකාවේ ජාතික ජාලකය පුළුල් කිරීම සඳහා පහසුකම් සැලැස්වීම පිණිස පෞද්ගලික අංශයේ ආයෝජන රැස් කරනු ලැබිය හැකි අතර, ප්‍රසම්පාදනය කිරීම රජයේ ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව කරගෙන යනු ලැබිය යුතු ය. තවද, එම රජයේ ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ, ඍජු ප්‍රසම්පාදනය හෝ රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර යන දෙකට ම අදාළ කරගනු ලැබිය යුතු අතර ප්‍රසම්පාදනය සඳහා වන කාර්යපටිපාටිය සහ ඒ සඳහා අවශ්‍ය කරන ආකෘති නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(2) නිසි පරිදි අනුමත කරන ලද දීර්ඝකාලීන විදුලිබල පද්ධති සංවර්ධන සැලසුමේ ඇතුළත් කළ යුතු කාරණා 10 වන වගන්තියේ (11) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් කර ඇති පරිද්දෙන් විය යුතු ය.

(3) ජාතික පද්ධති ක්‍රියාකරු විසින් සම්ප්‍රේෂණ ජාලය ක්‍රියාත්මක කිරීමට සහ අධීක්ෂණය කිරීමට අදාළ කර්තව්‍ය සිදු කරනු ලැබිය යුතු ය.

## VI වන කොටස

### 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පොදු සමාගම් සංස්ථාගත කිරීම

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පොදු සමාගම් සංස්ථාගත කිරීම සහ ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රතිව්‍යුහගත කරන ලද කටයුතු එම සමාගම් සතු කිරීම

16. (1) උපලේඛනයේ විස්තර කර ඇති විදුලිබල කර්මාන්තයේ ව්‍යුහය ප්‍රකාරව අවශ්‍ය විය හැකි පරිදි වූ පොදු සමාගම් යම් සංඛ්‍යාවක් 2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව සංස්ථාගත කරනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, ඒ එක් එක් පොදු සමාගමේ සාංගමික සංස්ථා පත්‍රය සහ සාංගමික ව්‍යවස්ථාවලිය නියම කරනු ලබන ආකෘතියට සාරානුකූලව සකස් කරනු ලැබිය යුතු ය. මේ කොටසේ කාර්ය සඳහා 17 වන වගන්තිය යටතේ සකස් කරන ලද පැවරුම් සැලැස්ම ප්‍රකාරව එසේ සංස්ථාගත කරන ලද එක් එක් පොදු සමාගම්වලට නීතිය ක්‍රියාත්මක වීමෙන් පැවරීමට ඇති කටයුතු එකී එක් එක් පොදු සමාගම්වල සාංගමික සංස්ථා පත්‍රයේ සහ සාංගමික ව්‍යවස්ථාවලියේ සවිස්තරාත්මකව නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(2) 17 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පැවරුම් සැලැස්මේ සඳහන් කර ඇති යෝජනා ක්‍රමයට අනුකූලව, විදුලිය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදා හැරීම සහ සැපයීම සම්බන්ධයෙන් වන ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රතිව්‍යුහගත කරන ලද කටයුතු මේ වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීම ප්‍රකාරව නියමිත දිනයේ දී, (1) වන උපවගන්තිය ප්‍රකාරව සංස්ථාගත කරන ලද පොදු සමාගම් සතු කරනු ලැබිය යුතු ය.

(3) (1) වන සහ (2) වන උපවගන්තිවල අවශ්‍යතා සපුරාලීමෙන් පසුව ද, පැවරුම් සැලැස්ම සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමට අවශේෂ සමාගම් එකක් හෝ කිහිපයක් සංස්ථාගත කිරීම අවශ්‍ය වන බව පෙනී යන්නේ නම්, ඒ අවශ්‍ය වන අවශේෂ සමාගම් සංඛ්‍යාව 2007 අංක 07 දරන සමාගම් පනතේ ඒ සඳහා විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන් සංස්ථාගත කරනු ලැබිය යුතු අතර, මේ වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එකී සමාගම් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

**පැවරුම් සැලැස්ම පිළියෙල කිරීම**

17. (1) අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා සහ භාණ්ඩාගාර ලේකම්වරයා සහ අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවක දී, අදාළ පරදු දරන්නන්ද විමසා (මෙහි මින් මතු "පැවරුම් සැලැස්ම" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකාවේ විදුලිබල කර්මාන්තයේ සංක්‍රාන්තිය, පැවරීම සහ ප්‍රතිසංවිධානය සැලසීම සඳහා වන පැවරුම් සැලැස්මක් සකස් කරන ලෙසට මේ පනතේ 32 වන වගන්තිය යටතේ පිහිටුවනු ලබන විදුලිබල අංශයේ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලයට නියම කළ යුතු ය. පැවරුම් සැලැස්මේ විදුලිය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම සහ බෙදා හැරීම සම්බන්ධයෙන් වන ලංකා විදුලිබල මණ්ඩලයේ කටයුතු විවිධාංග කිරීම සඳහා වන සවිස්තරාත්මක සැලසුම්, යෝජනා සහ විධික්‍රම අන්තර්ගත විය යුතු ය.

(2) විදුලිබල අංශයේ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය විසින් පැවරීමේ සැලැස්ම අමාත්‍යවරයාගේ ප්‍රතිපත්ති විධානවලට යටත්ව පිළියෙල කරනු ලැබිය යුතු අතර,-

(අ) අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කිරීමෙන් පසුව, නියමිත දිනයට ඉක්බිතිව ම වූ දිනයේ දී ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු මූලික පැවරීමේ සැලැස්මට විදුලිබලය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම සහ බෙදා හැරීම ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් වන කටයුතු සතු කිරීම පිළිබඳව වන සියලු විස්තර මෙන්ම මෙහෙයුම් ආරම්භ කිරීම සඳහා අනුප්‍රාප්ත සමාගම්වලට මූලිකව ම අවශ්‍ය වන වත්කම් සතු කිරීම සඳහා වන මූල්‍යමය සැලැස්මක් ද අන්තර්ගත විය යුතු ය; සහ

(ආ) එයට අවසාන පැවරීමේ සැලැස්මක් ඇතුළත් විය යුතු අතර, එය නියමිත දින සිට අවුරුදු දෙකකට පසු නොවන දිනයක සකස් කර අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඉක්බිතිව ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය. අවසාන පැවරීමේ සැලැස්ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු විදුලිබල කර්මාන්තය ප්‍රතිව්‍යුහගත කිරීම සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය ශේෂව පවතින සියලු කාරණා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය අන්තර්ගතව ඇති බවට සලකනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පිළියෙල කරන ලද පැවරීමේ සැලැස්ම මගින්-

(අ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ලංකා විදුලිබල මණ්ඩලය මගින් කරන ලද කාර්ය සහ කර්තව්‍ය හඳුනාගනු ලැබිය යුතු ය;

(ආ) ලංකා විදුලිබල මණ්ඩලයේ පවත්නා මූල්‍ය වගකීම් සම්බන්ධයෙන් වන විට දී, සැපයුම් වගකීම් ඇතුළත් වන්නා වූ එකී වගකීම්වල කොටසක්, ලංකා විදුලිබල මණ්ඩලයේ ජල විදුලිබල උත්පාදන වත්කම් පවරා දෙනු ලබන සහ ශ්‍රී ලංකා රජය විසින් සියයට සියයක ප්‍රතිශතයකින් හිමිකාරීත්වය දරන සමාගමක් වන්නා වූ අනුප්‍රාප්තික සමාගම වෙත පවරා දෙනු ලබන අතර, එකී වගකීම්වල ශේෂ වන කොටස පැවරීමේ සැලැස්මේ නිශ්චිතව දක්වනු ලබන යම් අනුපාතවලින්, වෙනත් අනුප්‍රාප්තික සමාගම් අතර බෙදා හරිනු ලබන බව නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය;

(ඇ) පහත දැක්වෙන කාර්ය සහ කර්තව්‍ය සහ ලංකා විදුලිබල මණ්ඩලයේ සේවානියුක්තයන් 16 වන වගන්තියේ සඳහන් කර ඇති අනුප්‍රාප්තික සමාගම් වෙත බෙදා හැරීම සහ පසුව සතු කිරීම් කිරීමට හැකියාව ලබා දීමට ලංකා විදුලිබල මණ්ඩලයේ යම් කාර්ය සහ කර්තව්‍ය පහත දැක්වෙන වර්ගවලට වෙන් කිරීම කළ යුතු ය;-

(i) ජලය, තාපය සහ පුනර්ජනනීය බලශක්ති ප්‍රභව මත පදනම්ව විදුලිබලය උත්පාදනය කිරීම;

(ii) විදුලිය සම්ප්‍රේෂණය කිරීමේ සේවාවන් සහ ශ්‍රී ලංකාවේ ජාතික ජාලකය නඩත්තු කිරීම;

(iii) විදුලිබල ඉල්ලුම පුරෝකථනය කිරීම සහ සැලසුම් කිරීම, විදුලිබලය ප්‍රසම්පාදනය කිරීම සහ තොග වශයෙන් විදුලිබලය විකිණීම, විදුලිබලය පිරිමැසුම්දායක ලෙස ප්‍රේෂණය කිරීම, ජාතික විදුලි ප්‍රේෂණ මධ්‍යස්ථානය සහ ශ්‍රී ලංකාවේ ජාතික ජාලකය ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම ඇතුළුව කළමනාකරණය කිරීම සහ සම්ප්‍රේෂණ ජාල ව්‍යාප්ත කිරීමට සැලැසුම් කිරීම; සහ

(iv) විදුලිබලය බෙදා හැරීම හෝ සැපයීම;

(ඇ) 16 වන වගන්තියේ සඳහන් අවශේෂිත සමාගම් සතු කළ යුතු සහ ඒ සමාගම් විසින් කරනු ලැබිය යුතු සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් සහ සේවානියුක්තයන්ගේ අර්ථසාධක අරමුදල කළමනාකරණය, සහාය සේවා සහ පවත්නා මානව සම්පත විභජනය කිරීම ඇතුළුව, එහෙත් ඊට සීමා නොවූ (ආ) වන ඡේදයේ සඳහන් කර ඇති කාර්ය සහ කර්තව්‍යවලට ඍජුව සම්බන්ධ නොවන්නා වූ ලංකා විදුලිබල මණ්ඩලයේ කාර්ය, කර්තව්‍ය සහ කටයුතු හඳුනා ගනු ලැබිය යුතු ය;

(ඉ) එකම කොටස්කරු ශ්‍රී ලංකා රජය වන 16 වන වගන්තියේ දක්වා ඇති සමාගමකට හෝ සමාගම්වලට -

(i) විදුලිය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම සහ බෙදා හැරීම සමඟ සම්බන්ධ නොවන ලංකා විදුලිබල මණ්ඩලයේ සියලු අවශේෂ වත්කම්, (ඇ) වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති කර්තව්‍යයන්ට අදාළ වත්කම් අත්කර

ගැනීමට සෘජුව අදාළ නොවන ලංකා විදුලිබල මණ්ඩලයේ සියලු අවශේෂ වගකීම් සහ (ඇ) වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති කර්තව්‍යයන්ට අදාළ කටයුතු ඉටු කිරීමෙහි සෘජුව නියැලෙනු නොලබන ලංකා විදුලිබල මණ්ඩලයේ තථ්‍ය සේවානියුක්තයන්, වෙන් කරනු ලැබිය යුතු ය; සහ

(ii) ලංකා විදුලිබල මණ්ඩලයේ සේවක අර්ථසාධක අරමුදලේ සහ විශ්‍රාම වැටුප් අරමුදලේ රක්ෂකයා සහ භාරකරු ලෙස කර්තව්‍ය වෙන් කිරීම සහ එකී සේවක අර්ථසාධක අරමුදල සහ විශ්‍රාම වැටුප් අරමුදල කළමනාකරණය කිරීමට වෙන් කරනු ලැබිය යුතු ය;

(ඊ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ලංකා විදුලිබල මණ්ඩලයේ ධුර දරන සියලුම නිලධරයන් සහ සේවකයන්, එකී දිනයට පසු දින සිට බලාත්මක වන පරිදි-

(i) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඔවුන් ලංකා විදුලිබල මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් ලෙස භුක්ති විඳින ලද සහ යම් ලිඛිත නීතියක් යටතේ ඔවුන් හිමිකම් කියන ලද නියම සහ කොන්දේසිවලට වඩා වාසිදායක බවින් අඩු නොවන නියම සහ කොන්දේසි මත, 16 වන වගන්තියේ සඳහන් යම් එක් අනුප්‍රාප්තික සමාගමක නිලධරයන් සහ සේවකයන් ලෙස සලකනු ලබන බවට සහතික විය යුතු ය ;

(ii) 16 වන වගන්තියේ දක්වා ඇති අනුප්‍රාප්තික සමාගම් සංස්ථාගත කිරීමේ අවසාන පැවරීමේ සැලැස්ම සම්පූර්ණ කිරීමට පෙර, එකී අනුප්‍රාප්තික සමාගම්වල සේවයේ නියුතු වීමට ඔවුන් තෝරා ගත්තේ ද යන්න 32 වන වගන්තිය යටතේ පිහිටුවනු ලබන විදුලිබල අංශ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලයට දැනුම් දීමට අවශ්‍ය බවට සහතික විය යුතු අතර, එසේ වරක් දැනුම් දුන් විට එකී තෝරා ගැනීම අවසානාත්මක විය යුතු ය;

එසේ වුව ද, නිලධරයන්ගේ සහ සේවකයන්ගේ වැටුප හෝ වෙනත් දීමනා හෝ සේවා හෝ නියම සහ කොන්දේසි කිසිවක් අනුප්‍රාප්තික සමාගමක් විසින් එකී නිලධරයන්ව සහ සේවකයන්ව සේවා නියුක්ත කර ගැනීම හේතුවෙන් ඔවුන්ට අවාසිදායක ලෙස වෙනස් නොකළ යුතු ය,

(4) යම් නිලධරයකු හෝ සේවකයකු 16 වන වගන්තියේ සඳහන් අනුප්‍රාප්තික සමාගමක සේවයට සම්බන්ධ වීමට තෝරාගනු ලබන අවස්ථාවක දී, එකී නිලධරයා හෝ සේවකයා -

(අ) විශ්‍රාම හිමිකම සහ වෙනත් විශ්‍රාම ප්‍රතිලාභ ගණනය කිරීමේ කාර්යය සඳහා පමණක්, එකී නිලධරයා හෝ සේවකයා ලංකා විදුලිබල මණ්ඩලය මගින් සේවා නියුක්ත කර ගන්නා ලද දින සිට 16 වන වගන්තියේ සඳහන් අනුප්‍රාප්තික සමාගම්වල ඔහුගේ සේවා කාලය අවසන් කරන තෙක් ලංකා විදුලිබල මණ්ඩලයේ රජයේ සේවකයකු ලෙස අඛණ්ඩව ම සේවයේ නියුතු වී ඇති බවට සලකනු ලැබිය යුතු අතර, එවැනි යම් නිලධරයකුගේ හෝ සේවකයකුගේ අනුප්‍රාප්තික සමාගමක සේවා කාලය ඔහුගේ ලංකා විදුලිබල මණ්ඩලයේ පෙර සේවා කාලයට එකතු කළ විට, වසර විස්සක් හෝ ඊට වැඩි වන්නේ නම්, අනුප්‍රාප්තික සමාගමක ඔහුගේ සේවා කාලය අවසානයේදී විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාව ඇතුළුව වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ එකී නිලධරයන්ට සහ සේවකයන්ට අදාළ විය හැකි විශ්‍රාම වැටුප සහ විශ්‍රාම ප්‍රතිලාභ ප්‍රදානය කිරීම සඳහා සුදුසුකම් ලැබිය යුතු ය;

(ආ) ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදලේ රීති හෝ නියෝග ප්‍රකාරව ඔවුන් විසින් සිදු කළ යුතු අර්ථසාධක අරමුදලේ යම් දායක මුදල් ගෙවීම් අඛණ්ඩව කරනු ලැබිය යුතු ය.

(5) (අ) අනුප්‍රාප්තික සමාගමක සේවා නියුක්ති අර්පණය පිළිබඳ දැනුම් දුන් දින සිට ස්වේච්ඡාවෙන් ඉල්ලා අස්වීමට

තීරණය කරන ලද ලංකා විදුලිබල මණ්ඩලයේ නිලධරයකු හෝ සේවකයකු, එහි සකස් කිරීම නියම කරනු ලැබිය යුතු වූ ස්වේච්ඡා විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමයක් ප්‍රකාරව ගෙවනු ලැබිය යුතු වන යම් වන්දියකට හිමිකම් ලැබිය යුතු අතර, එකී නිලධරයා හෝ සේවකයා විසින් ලංකා විදුලිබල මණ්ඩලයේ සේවා කාලය වසර දහඅටක් සම්පූර්ණ කර ඇත්නම්, එවැනි නිලධරයන්ට හෝ සේවකයන්ට ලංකා විදුලිබල මණ්ඩලයේ විශ්‍රාම වැටුප් අරමුදලේ රීති සහ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාව ඇතුළු යම් ලිඛිත නීතියක රීතිවලට අනුකූලව අදාළ විය හැකි විශ්‍රාම වැටුපට සහ වෙනත් විශ්‍රාම ප්‍රතිලාභවලට එකී නිලධරයා හෝ සේවකයා හිමිකම් ලැබිය යුතු ය.

(ආ) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, භාණ්ඩාගාර ලේකම්වරයා විසින් -

(i) නියමිත දිනයට පෙර ලංකා විදුලිබල මණ්ඩලයේ සේවයේ සිට ඒ දිනයට පෙර සේවයෙන් විශ්‍රාම ගිය ලංකා විදුලිබල මණ්ඩලයේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ;

(ii) ලංකා විදුලිබල මණ්ඩලයේ සේවයෙන් ස්වේච්ඡාවෙන් ඉවත් වීමට තීරණය කරන ලද ලංකා විදුලිබල මණ්ඩලයේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ;

(iii) 16 වන වගන්තියේ සඳහන් අනුප්‍රාප්තික සමාගම්වල සේවාවලට සම්බන්ධ වීමට තෝරා ගත් සහ අනුප්‍රාප්තික සමාගම සමඟ වන සේවා ගිවිසුම ප්‍රකාරව විශ්‍රාම ගැනීමේ වයස එළඹීමෙන් පසුව අනුප්‍රාප්තික සමාගමක සේවයෙන් විශ්‍රාම යනු ලබන ලංකා විදුලිබල මණ්ඩලයේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ,

විශ්‍රාම වැටුප් අරමුදලට අදාළ වන රීති සහ නියෝග ප්‍රකාරව මාසික විශ්‍රාම වැටුප් ගෙවීමේ වගකීම අඛණ්ඩව සම්පූර්ණ කිරීමට එකී විශ්‍රාම වැටුප් අරමුදලට හැකියාව ලබා දීම සඳහා විශ්‍රාම වැටුප් අරමුදලේ අරමුදල් හිඟය පිරවීමට, කලින් කලට, මූල්‍යමය දායක මුදල් සම්පාදනය කරනු ලැබිය යුතු ය.

## VII වන කොටස

### බලපත්‍ර දීම

බලපත්‍ර නොලත් විදුලිය උත්පාදනය සහ බෙදා හැරීම වරදක් බව

18. (1) යම් තැනැත්තකු විසින් -

(අ) විදුලිය උත්පාදනය කිරීම;

(ආ) උත්පාදන බලපත්‍රලාභියකුගෙන් බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ට හෝ සම්ප්‍රේෂණ ජාලයට සම්බන්ධ වී ඇති වෙනත් යම් සුදුසුකම්ලත් පාරිභෝගිකයකුට හෝ දේශීය, කලාපීය හෝ අන්තර්ජාතික වෙළෙඳපොළේ යම් අස්තිත්වයකට හෝ අස්තිත්වයකින් තොග වශයෙන් විදුලිය සම්ප්‍රේෂණය කිරීම;

(ඇ) 10 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි ජාතික පද්ධති ක්‍රියාකරුගේ කාර්ය ඉටු කිරීම;

(ඈ) යම් පරිශ්‍රයකට හෝ යම් පාරිභෝගිකයකුට හෝ අලෙවිකරුවකුට විදුලි සම්බන්ධතාවක් ලබා දීමේ කාර්යය සඳහා විදුලිය බෙදා හැරීම සහ සැපයීම හෝ බෙදා හැරීම,

එකී තැනැත්තාට මේ පනත ප්‍රකාරව ඔහුට ප්‍රදානය කළ බලපත්‍රයක් ප්‍රකාරව එසේ කිරීමට බලය දී ඇත්නම් හෝ විදුලි සැපයුම අනන්‍යයෙන් ම පෞද්ගලික භාවිතය සඳහා භාවිත කරන්නේ නම් හෝ 25 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇති තැනැත්තකු නම් මිස, එසේ නොකළ යුතු ය.

(2) මේ පනත යටතේ තත්කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාර බලය යටතේ හෝ මේ පනත යටතේ ප්‍රදානය කළ නිදහස් කිරීමක් යටතේ හැර -

(අ) යම් පාරිභෝගිකයකුට හෝ පරිශ්‍රයකට විදුලි සම්බන්ධතාවයක් ලබා දීමේ

කාර්යය සඳහා විදුලිය උත්පාදනය කරන, සම්ප්‍රේෂණය කරන හෝ බෙදා හරින; හෝ

(ආ) විදුලිය අපනයනය කරන හෝ ආනයනය කරන, යම් තැනැත්තකු, මේ පනත යටතේ වරදක් සිදු කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව, වරදකරු කිරීමේ දී රුපියල් ලක්ෂ තුනකට නොඅඩු දඩයකට හෝ මාස හයකට නොඅඩු සහ වසරකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයකින් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම යටත් විය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වරදක් සඳහා තැනැත්තකුට නඩු පවරනු ලබන අවස්ථාවක දී, ඒ උපවගන්තිය යටතේ පනවන දඬුවමට අමතරව, අධිකරණය විසින්, වරදකරු කළ තැනැත්තාට, (1) වන උපවගන්තිය යටතේ එකී තැනැත්තා විසින් කරගෙන යාම තහනම් කළ කටයුත්ත, ඒ වගන්තියෙන් නියම කර ඇති පරිදි එකී තැනැත්තා විසින්, ඒ කටයුත්ත සඳහා බලපත්‍රයක් ලබා ගන්නා තෙක්, වහාම ක්‍රියාත්මක වන පරිදි කරගෙන යාමෙන් වළකින ලෙස තවදුරටත් නියෝග කළ යුතු ය.

(4) නියාමකගේ ලිඛිත අනුමතය ඇතිව මිස, මේ වගන්තිය යටතේ වන වරදක් සම්බන්ධයෙන් කිසිදු නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුතු ය.

බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීමේ යෝග්‍යතාවය

19. (1) ඕනෑම තැනැත්තකු උත්පාදන බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමට යෝග්‍ය විය යුතු ය.

(2) පහත සඳහන්, -

(අ) අවස්ථාවෝචිත පරිදි, 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ රජයට අයිති ව්‍යාපාර ව්‍යවසායන් පොදු සමාගම් බවට පරිවර්තනය කිරීම පනත යටතේ හෝ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ හෝ සංස්ථාපිත කළ සමාගමක්;

(ආ) පළාත් පාලන ආයතනයක්;

(ඇ) 1972 අංක 5 දරන ජාතික රාජ්‍ය සභාවේ සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කළ සමිතියක්,

බෙදා හැරීමේ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමට යෝග්‍ය විය යුතු ය.

(3) 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත, ශ්‍රී ලංකා රජය විසින් -

(අ) සියයට සියයක ප්‍රතිශතයකින් එහි කොටස් දරන පොදු සමාගමක් පමණක් ජාතික පද්ධති ක්‍රියාකරු බලපත්‍රය නිකුත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමට යෝග්‍ය විය යුතු ය;

(ආ) සියයට පනහකට නොඅඩු ප්‍රතිශතයකින් එහි කොටස් දරන පොදු සමාගමක් පමණක් ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු බලපත්‍රය නිකුත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමට යෝග්‍ය විය යුතු ය.

(4) නියමිත දිනයේ දී -

(අ) උත්පාදන කාලසටහන්ගත කිරීම, උත්පාදන පිරියතවල වගකීම සහ ආර්ථික ප්‍රේෂණය, අනාගත විදුලි ඉල්ලුම් සැලසුම, ජාතික විදුලි ප්‍රේෂණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරීත්වය සහ නඩත්තුව, උත්පාදන බලපත්‍රලාභීන්ගෙන් විදුලිබලය තොග වශයෙන් ප්‍රසම්පාදනය කිරීම සහ එකී තොග වශයෙන් ප්‍රසම්පාදිත විදුලිබලය බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ට සහ දේශීය හෝ කලාපීය වෙළෙඳපොළේ යම් අලෙවිකරුවන්ට හෝ පාරිභෝගිකයන්ට විකිණීම ඇතුළුව ජාතික පද්ධති ක්‍රියාකරු බලපත්‍රයට අදාළ ලංකා විදුලිබල මණ්ඩලයේ සියලු කර්තව්‍යයන්;

(ආ) දේශීය හෝ කලාපීය වෙළෙඳපොළේ යම් පාරිභෝගිකයකුට විදුලිබලය තොග වශයෙන් සම්ප්‍රේෂණය කිරීම සඳහා කරනු ලබන ශ්‍රී ලංකාවේ ජාතික ජාලකය සමන්විත වන භෞතික යටිතල පහසුකම්වල නඩත්තුව ඇතුළුව ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරුට අදාළ ලංකා විදුලිබල මණ්ඩලයේ සියලු කර්තව්‍යයන්,

(3) වන උපවගන්තියේ (අ) ඡේදය ප්‍රකාරව, සංස්ථාපිත කරන ලද අනුප්‍රාප්තික සමාගමට පැවරිය යුතු ය.

(5) (4) වන උපවගන්තියේ (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති සීමා කිරීමට යටත්ව, 10 වන වගන්තියේ (11) වන උපවගන්තියේ (ඇ) ඡේදයට සහ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියට අනුකූලව සම්ප්‍රේෂණ වත්කමක් ඉදිකිරීමට අයිතිවාසිකමක් අත්පත් කරගත් යම් නෛතික තැනැත්තකුට අතිරේක සම්ප්‍රේෂණ බලපත්‍ර ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(6) පහත දැක්වෙන කවර හෝ බලපත්‍ර දෙකක සංයෝජනයක් කිසිදු තැනැත්තකුට ප්‍රදානය කරනු නොලැබිය යුතු යː-

(අ) ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු බලපත්‍රය සහ උත්පාදන බලපත්‍රය;

(ආ) ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු බලපත්‍රය සහ බෙදා හැරීමේ බලපත්‍රය;

(ඇ) ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු බලපත්‍රය සහ ජාතික පද්ධති ක්‍රියාකරු බලපත්‍රය;

(ඈ) ජාතික පද්ධති ක්‍රියාකරු බලපත්‍රය සහ බෙදා හැරීමේ බලපත්‍රය;

(ඉ) ජාතික පද්ධති ක්‍රියාකරු බලපත්‍රය සහ උත්පාදන බලපත්‍රය; හෝ

(ඊ) උත්පාදන බලපත්‍රයක් සහ බෙදා හැරීමේ බලපත්‍රයක්.

බලපත්‍රයක් සඳහා වන අයදුම්පත සහ බලපත්‍රය ප්‍රදානය

20. (1) විදුලිබලය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදා හැරීම, සැපයීම හෝ වෙළෙඳාම් කිරීම සඳහා බලපත්‍රයක් ප්‍රදානය කිරීමට හෝ එකී කුමන හෝ බලපත්‍රයක දීර්ඝ කිරීමක් සඳහා වන අයදුම්පතක් නියම කරනු ලැබිය යුතු පරිදි යම් ආකෘතියකින් නියාමක වෙත ලිඛිතව ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එය නියම කළ යුතු පරිදි යම් තොරතුරු සහ ලේඛන සහ යම් ගාස්තුවලින් එය සමන්විත විය යුතු ය.

(2) අයදුම්පත ලැබුණු පසු, අදාළ අයදුම්පත මගින් හෙළිදරව් කළ තොරතුරු මත පදනම්ව අයදුම්කරුට බලපත්‍රයක් නිකුත් කිරීමට කිසිදු බාධාවක් නොමැති බව පෙනී යන බවට නියාමකගේ මතය වන්නේ නම්, නියාමක විසින්, ඒ බව අමාත්‍යවරයා වෙත දැනුම් දී-

(අ) බලපත්‍රය නිකුත් කිරීමෙන් හෝ එය දීර්ඝ කිරීමෙන් බලපෑම් ඇති විය හැකි තැනැත්තන්ට දැනුම් දීම පිණිස අරමුණු කරන ලද ව්‍යාපෘතියේ තොරතුරු සමඟ බලපත්‍රය හෝ අයදුම් කරන ලද දීර්ඝ කිරීම ප්‍රදානය කිරීමට එය අදහස් කරන බවට නියාමකගේ නිල වෙබ් අඩවියේ හෝ ගැසට් පත්‍රයේ හෝ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවෙන් දේශීය පුවත් පතක දැන්වීමක් පළ කිරීම; සහ

(ආ) අයදුම්පතට අදාළ සියලු අදාළ දැන්වීම් සහ ලේඛන අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම,

ඇතුළුව එකී බලපත්‍රය හෝ අයදුම් කරන ලද දීර්ඝ කිරීම ප්‍රදානය කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම ආරම්භ කළ යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වන සෑම දැන්වීමක ම-

(අ) බලපත්‍රය අයදුම් කරන්නේ කවර කාර්යයක් සඳහා ද යන්න සහ අයදුම්කරුට බලපත්‍රය හෝ දීර්ඝ කිරීම ප්‍රදානය කිරීමට නියාමක විසින් අදහස් කරන බව;

(ආ) එකී බලපත්‍රය හෝ දීර්ඝ කිරීම ප්‍රදානය කිරීමට අරමුණු කරන හේතු; සහ

(ඇ) එකී අරමුණු කරන ලද ව්‍යාපෘතියේ කටයුතුවලට හෝ එකී ව්‍යාපෘතියේ තත්ත්වයට හෝ එකී බලපත්‍රය ප්‍රදානය කිරීමට විරුද්ධ වීමට අදාළව තැනැත්තන්ගේ සැලකිරීම් ප්‍රකාශ කරමින් නියාමක වෙත සිදු කළ හැකි ලිඛිත කරුණු දැක්වීමේ කාලසීමාව දැන්වීම පළ කරන දින සිට දින විසි අටකට නොඅඩු නොවිය යුතු බවට,

ප්‍රකාශ කළ යුතු ය.

(4) එම බලපත්‍රය ප්‍රදානය කිරීමට එරෙහිව ලිඛිත කරුණු දැක්වීම් ලැබුණු පසුව, නියාමක විසින්, කාරණය විභාග කිරීමට නීති සහ ඉංජිනේරු ක්ෂේත්‍රවල වසර දහයකට නොඅඩු පළපුරුද්ද සහ විශිෂ්ටත්වය ඇති සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලයක් පත් කළ යුතු ය. (3) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් අදාළ තැනැත්තන්ට ඔවුන්ගේ කරුණු දැක්වීම් සිදු කිරීමට අවසර දී යම් විභාග සිදු කර, ස්ථාන පරීක්ෂණයෙන් පසුව විනිශ්චය මණ්ඩලය විසින් ලිඛිතව එහි නිර්දේශය නියාමක වෙත දැනුම් දිය යුතු ය.

(5) නියාමක විසින්, (4) වන උපවගන්තිය යටතේ විනිශ්චය මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයට අනුකූලව, නිර්දේශය ලැබුණු දින සිට දින අනූවක් ඇතුළත ඉල්ලුම්කරුට ඒ සම්බන්ධයෙන් දැනුම් දිය යුතු එහි තීන්දුව ලබා දිය යුතු ය.

(6) (අ) නියාමකගේ තීන්දුව මගින් කරුණු දැක්වීම නිෂ්ප්‍රභ කරන්නේ නම්, එවිට, නියාමක විසින් අයදුම් කරන ලද බලපත්‍රය ප්‍රදානය කිරීමට කටයුතු කළ යුතු අතර, එකී බලපත්‍රය අදාළ එක් එක් බලපත්‍ර කාණ්ඩය ඒ සම්බන්ධයෙන් නියම කරනු ලැබිය යුතු ආකෘතියකින් විය යුතු ය.

(ආ) එක් එක් බලපත්‍ර කාණ්ඩයට අදාළ නියමයන් සහ කොන්දේසි ද නියම කළ යුතු පරිදි විය යුතු අතර, අයදුම්කරුට නිකුත් කරන ලද බලපත්‍රයට ප්‍රදානය කරනු ලබන අදාළ බලපත්‍රයට අදාළ නියමයන් සහ කොන්දේසි නිශ්චිතව දක්වනු ලබන උපලේඛනයක් ඇතුළත් විය යුතු ය.

(7) මේ කොටස ප්‍රකාරව නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම, නියම කළ යුතු පරිදි,-

(අ) බලපත්‍රවල කොන්දේසිවලට;

(ආ) අදාළ බලපත්‍ර කාණ්ඩවල බලතල සහ කාර්යයන්ට;

(ඇ) බලපත්‍රලාභීන් විසින් භාරගන්නා ලද ඉදිකිරීමේ සහ නඩත්තු කටයුතු ක්‍රියාවට නැංවීම සඳහා වන අවසර පත්‍ර සහ නිෂ්කාශන ලබා ගැනීමට අදාළ වන විධිවිධානවලට;

(ඈ) බෙදා හැරීමේ බලපත්‍රලාභීන් විසින් අනුකූල විය යුතු විදුලිය සැපයීමට අදාළ ප්‍රමිතීන්ට සහ කාර්යපටිපාටිවලට; සහ

(ඉ) විදුලි පරිභෝජනය මනු කියවීමට අදාළ කාර්ය පටිපාටියට,

යටත් විය යුතු අතර, එකී එක් එක් බලපත්‍රලාභියාට අදාළ විය යුතුය.

බලපත්‍ර පැවරීම

21. (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, බලපත්‍රයක් පැවරීමේ දී ඒ පැවරීමට බලය ලබා දෙන යම් කොන්දේසියක් සහිතව හෝ රහිතව පැවරීමේ හැකියාව තිබිය යුතු ය.

(2) නියාමකගේ පූර්ව එකඟත්වය ඇතිව මිස, බලපත්‍රයක් පවරනු ලැබීමේ හැකියාව නොතිබිය යුතු ය.

(3) 20 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කළ අයදුම් පත්‍රය අනුමත කරන්නේ ද නොකරන්නේ ද යන්න තීරණය කිරීමේ දී නියාමක විසින් පැවරුම්ලාභියාට අනුරූප බලපත්‍රයක් හෝ අනුරූප බලපත්‍රයක කොටසක් ප්‍රදානය කරන්නේ ද නොකරන්නේ ද යන්න තීරණය කිරීමේ දී අදාළ කරගනු ලැබිය හැකි සමාන නිර්ණායක ම අදාළ කරගනු ලැබිය යුතු ය.

(4) පැවරුම්ලාභියා විසින්,-

(අ) පාරිභෝගිකයන්ගේ අයිතීන් සුරැකීමේ කාර්යය සඳහා නියාමක විසින් අවශ්‍ය යයි සලකනු ලබන බලපත්‍රයේ කොන්දේසි විකරණය කිරීමට හෝ යම් වැඩිදුර කොන්දේසි පැනවීමට; සහ

(ආ) නියාමක විසින් අවශ්‍ය යයි සලකනු ලබන කොන්දේසිවල යම් අතුරු හෝ ආනුෂංගික විකරණවලට,

එකඟ වීමට යටත්ව (3) වන උපවගන්තිය ප්‍රකාරව අනුමතය ලබා දිය හැකි ය.

(5) නිශ්චිතව දක්වනු ලබන යම් කොන්දේසිවලට පැවරුම්ලාභියා විසින් අනුකූල වන බවට යටත්ව, බලපත්‍රයක පැවරීමට බලය දෙන කොන්දේසි ඇතුළත් කරනු ලැබිය හැකි ය.

(6) (අ) බලපත්‍රය පැවරීමට හැකියාවක් නොමැති නම්;

(ආ) පැවරීම හෝ අපේක්ෂිත පැවරීම බලපත්‍රයේ කොන්දේසියක් උල්ලංඝනය කරන්නේ නම්; හෝ

(ඇ) (2) වන උපවගන්තිය යටතේ එකඟත්වය ලබා දුන්නේ යම් කොන්දේසියකට යටත්ව ද එකී කොන්දේසිය පැවරීමට හෝ අපේක්ෂිත පැවරීමට පෙර උල්ලංඝනය කරනු ලැබ තිබේ නම්,

බලපත්‍රයක පැවරීමක් හෝ අපේක්ෂිත පැවරීමක් බල රහිත විය යුතු ය.

බලපත්‍ර විකරණය හෝ අවලංගු කිරීම සහ බලාත්මක කිරීමේ නියෝග

22. (1) නියාමක විසින්, ජාතික යහපත සඳහා යම් බලපත්‍රයක් විකරණය කිරීමට අවශ්‍ය යයි පෙනී යන්නේ නම්, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, නියම කරනු ලැබිය යුතු පරිදි සාමාන්‍ය අයදුමක අවස්ථානුගත කාරණාවල දී සහ විවිධ බලපත්‍ර කාණ්ඩවලට අදාළව නියම කරනු ලැබිය යුතු පරිදි යම් ආකාරයකින් සහ ආකෘතියකින් බලපත්‍රලාභියාගේ එකඟත්වය සහිතව හෝ රහිතව ප්‍රදානය කරනු ලබන නියමිත බලපත්‍රයේ කොන්දේසි විකරණය කිරීමට කටයුතු කළ යුතු ය.

(2) නියාමක විසින්, (3) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි පළ කරන ලද දැන්වීමකට ප්‍රතිචාර වශයෙන් එය වෙත ඉදිරිපත් කළ යම් කරුණු දැක්වීම් සලකා බැලීමෙන් පසුව සහ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, උත්පාදන බලපත්‍රයක් හෝ ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු බලපත්‍රය හෝ බෙදා හැරීමේ බලපත්‍රය හෝ ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු බලපත්‍රය එකී බලපත්‍ර අවලංගු කිරීමට අදාළ නියමයන්ට අනුකූලව අවලංගු කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය ප්‍රකාරව යම් බලපත්‍රයක් අවලංගු කිරීමට පෙරාතුව නියාමක විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින් සහ එකී අවලංගු කිරීම මගින් බලපෑම් ඇති විය හැකි තැනැත්තන්ගේ අවධානයට යොමු කිරීම පිණිස සුදුසු යයි එය සලකන වෙනත් යම් ආකාරයන්ගෙන් දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති බලපත්‍රය අවලංගු කිරීමට අදහස් කරන බවට සහ එසේ අදහස් කිරීමට හේතු සහ එකී අවලංගු කිරීමට එරෙහිව කරුණු දැක්වීම් ඉදිරිපත් කළ යුතු නිශ්චිත කාලසීමාවක් ප්‍රකාශ කළ යුතු ය. බලපත්‍රයක් අවලංගු කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්යපටිපාටිය නියම කරනු ලබන පරිදි විය යුතු ය.

(4) (අ) බලපත්‍රලාභියා විසින් -

(i) අදාළ බලපත්‍රය නිකුත් කරනු ලැබුවේ යම් නියම සහ කොන්දේසිවලට අනුව ද එකී නියම සහ කොන්දේසි උල්ලංඝනය කරන හෝ උල්ලංඝනය කිරීමක් විය හැකි බවට; හෝ

(ii) යම් ව්‍යාවස්ථාපිත නියමයක් උල්ලංඝනය කරන හෝ උල්ලංඝනය කිරීමක් විය හැකි බවට,

නියාමකට පෙනී යන අවස්ථාවක, අවස්ථානුගත කරුණුවල දී අවශ්‍ය යයි සලකනු ලබන පරිදි එකී බලපත්‍රලාභියාගේ අනුකූල වීම ලබා ගැනීම සඳහා එකී බලපත්‍රලාභියාට එරෙහිව එහි නිශ්චිතව දක්වා ඇති කාලසීමාවක් සඳහා ක්‍රියාත්මක වන බලාත්මක කිරීමේ නියෝගයක් සිදු කරනු ලැබිය හැකි අතර, ඒ පිළිබඳව අමාත්‍යවරයාට දැනුම් දෙනු ලැබිය යුතු ය.

(ආ) එකී බලාත්මක කිරීමේ නියෝගය බලාත්මක වන කාලසීමාව තුළ දී, ඒ නියෝගයේ නිශ්චිතව දක්වා ඇති කාරණාවලට අදාළව යම් ක්‍රියාමාර්ගයක් ගැනීම නතර කිරීමට සහ ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් වැළකීමට බලාත්මක කිරීමේ නියෝගය මගින් අදාළ බලපත්‍රලාභියාට නියම කළ යුතු ය.

(ඇ) බලාත්මක කිරීමේ නියෝගයක් නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඉකුත් වීමේ දී, බලාත්මක වීම නතර විය යුතු අතර, එය එහි ක්‍රියාත්මක කාලසීමාව තුළ ඕනෑම වේලාවක දී විකරණය කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.

(ඈ) එකී බලාත්මක කිරීමේ නියෝගයක් සිදු කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්යපටිපාටිය නියම කළ පරිදි විය යුතු ය.

උත්පාදන බලපත්‍රලාභීන් සඳහා අතිරේක කොන්දේසි

23. උත්පාදන බලපත්‍රලාභියකුට -

(අ) උත්පාදන මධ්‍යස්ථාන, බැඳි මාර්ග, උපපොළවල් සහ සමර්පිත සම්ප්‍රේෂණ මාර්ග සහ එයට සම්බන්ධිත වෙනත් යම් ආශ්‍රිත උපකරණ පිහිටුවීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යෑමට;

(ආ) ජාතික පද්ධති ක්‍රියාකරු සහ ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු අවශ්‍ය හෝ යෝග්‍ය යයි සලකන පරිදි උත්පාදන පද්ධතියට අදාළ යම් තාක්ෂණික හෝ මෙහෙයුම් කේත, ප්‍රමිති හෝ පරාමිතීන් ක්‍රියාවේ යෙදවීමට සහ පවත්වාගෙන යාමට;

(ඇ) තැනැත්තන්, විදුලිබල පිරියත සහ උපකරණ හානි සහ අලාභහානිවලින් වැළැක්වීමට අවශ්‍ය සියලු පියවර ගැනීමට;

(ඈ) විදුලි මාර්ග, කේබල්, විදුලිබල පිරියත සහ ඉන්ධන පාලන හා ආශ්‍රිත උපකරණ වැඩිදියුණු කිරීමට සහ නඩත්තු කිරීමට;

(ඉ) බලපත්‍රය මගින් හඳුනාගත් වෙනත් යම් බලපත්‍රලාභියකුට හෝ පාරිභෝගිකයකුට විදුලිය අලෙවි කිරීමට;

(ඊ) එහි උත්පාදන මධ්‍යස්ථානවලට අදාළ තාක්ෂණික තොරතුරු නියාමකට භාරදීමට; සහ

(උ) එකී බලපත්‍රලාභියා විසින් උත්පාදනය කළ විදුලිය සම්ප්‍රේෂණය කිරීම සඳහා ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු සහ ජාතික පද්ධති ක්‍රියාකරු බලපත්‍රලාභියා සමඟ සම්බන්ධීකරණය වීමට,

හිමිකම් ලැබිය යුතු ය.

බෙදා හැරීමේ බලපත්‍ර සඳහා වන අතිරේක කොන්දේසි

24. (1) මේ පනත ප්‍රකාරව විදුලි සැපයුමක් අවශ්‍ය කරන යම් තැනැත්තකුට, ඒ සැපයුම සම්බන්ධයෙන් පහත කරුණු පිළිගන්නා ලෙස බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් නියම කළ හැකි යः-

(අ) අවම කාලසීමාවක් සඳහා සහ අවම පරිභෝජන අවශ්‍යතාවයන්ට යටත්ව, එකී විදුලි සැපයුම අඛණ්ඩව ලබාගෙන ඒ සඳහා ගෙවීම කරගෙන යාමට එකී තැනැත්තාට නියම කරන යම් නියම;

(ආ) මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයකට හෝ මේ පනතේ කාර්ය සඳහා නියම කරනු ලැබිය යුතු වන විදුලි සැපයුම් සංග්‍රහයට අනුකූල වීමට එකී බලපත්‍රලාභියාට හැකියාව ඇති කිරීමේ කාර්යය සඳහා පනවනු ලැබීමට අවශ්‍ය කරනු ලැබිය හැකි යම් සීමා කිරීම්; සහ

(ඇ) සියලු අවස්ථානුගත කරුණුවල දී ඒ තැනැත්තා විසින් පිළිගැනීම සාධාරණ වන්නා වූ, කවරාකාරයකින් හෝ උද්ගත වන එකී තැනැත්තා විසින් අත්විඳින යම් ආර්ථික, ආනුෂංගික හෝ වෙනත් වක්‍රාකාර පාඩුවක් සඳහා එකී බලපත්‍රලාභියාගේ යම් වගකීමක් සීමා කිරීමේ යම් නියම.

(2) බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින්, ඔහුගේ සැපයුම් ප්‍රදේශය තුළ බලපත්‍රලාභියාගේ පිරිවැයෙන් කාර්යක්ෂම, සම්බන්ධීකරණය කරන ලද සහ ආර්ථිකමය වශයෙන් ශක්‍යතාවයකින් යුත් බෙදා හැරීමේ පද්ධතියක් වැඩිදියුණු කර පවත්වාගෙන යාම සහ එකී ප්‍රදේශයේ පරිශ්‍රවල අයිතිකරුවන්ට හෝ පදිංචිකරුවන්ට, එකී අයිතිකරුවන් හෝ පදිංචිකරුවන් විසින් බෙදා හැරීමේ මාර්ග පිහිටුවීම සහ වෙනත් ආශ්‍රිත සම්බන්ධ කිරීමේ පහසුකම් වෙනුවෙන් මූලික වියදම් ගෙවීමේ අවශ්‍යතාවයෙන් තොරව, එකී සේවා සම්බන්ධතා ගාස්තු ගෙවීමෙන් බෙදා හැරීමේ මාර්ගයේ ආසන්නම සම්බන්ධතා ස්ථානයේ සිට එකී පරිශ්‍රයේ මීටර් පෙට්ටිය දක්වා විදුලි සැපයුම් සම්බන්ධතාවක් ලබා ගැනීමට හැකි වන පරිදි මේ පනත ප්‍රකාරව විදුලිය සැපයීම, බෙදා හැරීමේ බලපත්‍රලාභියාගේ කාර්යය වන්නේ ය.

(3) (අ) බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින්, වෙනස්කොට නොසැලකීමේ පදනමක් මත, පියසි මුදුනේ සූර්ය ජනක යන්ත්‍රය ඇතුළු කාවද්දන ලද ජනක යන්ත්‍රයකට සම්බන්ධ කිරීමකට එහි බෙදා හැරීමේ ජාලයට ඉඩ දිය යුතු ය;

(ආ) එකී ජාලයේ අන්තර් සම්බන්ධතාවය තාක්ෂණික සහ ආරක්ෂක අවශ්‍යතාවන්ට සහ නියම කළ හැකි පරිදි වෙනත් කොන්දේසිවලට අනුකූල වීමට යටත් විය යුතු ය.

(4) නියාමක විසින් 12 වන වගන්තිය ප්‍රකාරව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් තීරණය කරනු ලබන පරිදි යම් දිනයක සිට විවෘත ප්‍රවේශය ක්‍රියාත්මක කළ යුතු ය.

(5) (අ) (2) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි විවෘත ප්‍රවේශය හරහා බෙදා හැරීමේ බලපත්‍රලාභියකුගේ සැපයුම් ප්‍රදේශය තුළ ස්වකීය පරිශ්‍රය පිහිටා තිබෙන යම් තැනැත්තකුට එකී බෙදා හැරීමේ බලපත්‍රලාභියා නොවන උත්පාදන සමාගමක් හෝ යම් බලපත්‍රලාභියකුගෙන් විදුලි සැපයුමක් ලබා ගැනීමට අවශ්‍ය කරන අවස්ථාවක, ඒ තැනැත්තා විසින්, දැන්වීමක් මගින්, නියාමක විසින් සාදනු ලබන රීතිවලට අනුකූලව, එකී විදුලිබල සැපයුමට විවෘත ප්‍රවේශය බෙදා හැරීමේ බලපත්‍රලාභියාගෙන් ඉල්ලා සිටිය හැකි අතර, එකී සැපයුම සම්බන්ධයෙන් බෙදා හැරීමේ බලපත්‍රලාභියාගේ කාර්ය වෙනස්කොට නොසැලකීමේ විවෘත ප්‍රවේශය සපයන පොදු වාහකයකුගේ කාර්ය විය යුතු ය.

(ආ) නියාමක විසින් පාරිභෝගිකයකුට හෝ පාරිභෝගිකයන් කාණ්ඩයකට ඔහුගේ සැපයුම් ප්‍රදේශයේ බෙදා හැරීමේ බලපත්‍රලාභියකු නොවන තැනැත්තකුගෙන් විදුලි සැපයුමක් ලබා ගැනීමට අවසර ලබා දෙන අවස්ථාවක, එකී බෙදා හැරීමේ බලපත්‍රලාභියාගේ සැපයුම් වගකීමෙන් උද්ගත වන ස්ථාවර ගාස්තු පියවීමට, නියාමක විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි, 12 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි විවෘත ප්‍රවේශ ගාස්තු ගෙවීමට එකී පාරිභෝගිකයා යටත් විය යුතු ය.

(ඇ) සෑම බෙදා හැරීමේ බලපත්‍රලාභියකු ම, නියමිත දිනය හෝ බලපත්‍රය ප්‍රදානය කරන දිනය යන දිනයන්ගෙන් කවර

හෝ කලින් එළඹෙන දිනයේ සිට මාස හයක කාලයක් තුළ, නියාමක විසින් සාදනු ලබන රීතිවලට අනුකූලව පාරිභෝගිකයන්ගේ දුක්ගැනවිලි විමසීමට සහ ඒ සඳහා සහනය සැලසීම සඳහා වේදිකාවක් සැපයීමට සංසදයක් පිහිටුවනු ලැබිය යුතු ය.

**ව්‍යවස්ථාපිත නිදහස් කිරීම්**

25. යම් තැනැත්තකු හෝ තැනැත්තන් කාණ්ඩයක් විදුලිය උත්පාදනයේ සහ බෙදා හැරීමේ නිරත වන අවස්ථාවකදී සහ එසේ උත්පාදනය කළ විදුලිබල ධාරිතාවය හෝ ප්‍රමාණය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි වූ යම් ප්‍රමාණයකට වඩා පහළ මට්ටමක පවතින අවස්ථාවක දී, එකී තැනැත්තා හෝ තැනැත්තන් කාණ්ඩය, නීතිය ක්‍රියාත්මක වීම ප්‍රකාරව, ඒ සඳහා බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් ව්‍යවස්ථාපිතව නිදහස් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු යː

එසේ වුව ද, එකී ව්‍යවස්ථාපිත නිදහස් කිරීම භුක්ති විඳින තැනැත්තා හෝ තැනැත්තන් කාණ්ඩය විසින් එකී ව්‍යවස්ථාපිත නිදහස් කිරීම හා බැඳුණු කොන්දේසි උල්ලංඝනය කර තිබෙන බවට නියාමකගේ අවධානයට යොමුව ඇත්නම්, නියාමක විසින් නොපමාව එකී තැනැත්තාට හෝ තැනැත්තන් කාණ්ඩයට එකී උත්පාදනයට සහ බෙදා හැරීමට සම්බන්ධ සියලු කටයුතු නවතා නොපමාව එකී කාර්යය සඳහා භාවිත කරන සියලු උපකරණ විසන්ධි කරන ලෙසට දැනුම් දෙනු ලැබිය යුතු ය.

## VIII වන කොටස

## බදු

**බදු**

26. (1) ජාතික විදුලිබල ප්‍රතිපත්තියේ කොටසක් ජාතික බදු ප්‍රතිපත්තිය සකස් කිරීමේ දී ඇතුළත් කිරීම සඳහා ජාතික බදු ප්‍රතිපත්තියට අදාළව 4 වන වගන්තියේ (2) උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි ප්‍රතිපත්තිමාර්ගෝපදේශ, අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි ය. (3) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති බදු පැනවීමේ දී නියාමක විසින් යොදාග නු ලැබිය යුතු මූලධර්ම සහ ක්‍රමවේද ජාතික බදු ප්‍රතිපත්තියේ අන්තර්ගත විය යුතු ය.

(2) බදු පැනවීමේ දී නියාමනය කරන ලද අස්තිත්වයන්හි ආයෝජනය මත වූ සාධාරණ ලාභයක් ඇතුළත් කරමින් නියාමක විසින් මූල්‍ය අඛණ්ඩත්වය තහවුරු කරනු ලැබිය යුතු ය.

(3) ජාතික බදු ප්‍රතිපත්තියට අනුව නියාමක විසින් නියම කරනු ලබන පරිදි පහත දැක්වෙන බදු පැනවීමට අවශ්‍ය වේ:-

(අ) 10 වන වගන්තියේ (12) වන උපවගන්තියට අනුව, ජාතික පද්ධති ක්‍රියාකරු වෙත විදුලිබලය සපයන විදුලි උත්පාදකයන් වෙත ගෙවනු ලැබිය යුතු වන, සම්මත විදුලිබල මිල දී ගැනීමේ ගිවිසුම්වල ඇතුළත් කළ යුතු සැපයීම් බද්ද;

(ආ) 10 වන වගන්තියේ (11) වන උපවගන්තියේ (අ), (ඉ) සහ (ඊ) ඡේදවලට අනුකූලව ප්‍රසම්පාදනය කරන ලද නව උත්පාදන ධාරිතාව වෙනුවෙන් වන විදුලිබලය මිල දී ගැනීමේ බදු;

(ඇ) බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ගේ විදුලිබල මිල දී ගැනීමේ බදු;

(ඈ) සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ට ගෙවිය යුතු සම්ප්‍රේෂණ බද්ද සහ විවෘත ප්‍රවේශ ගාස්තු;

(ඉ) බෙදා හැරීමේ බද්දෙන් සහ සැපයුම් බද්දෙන් සමන්විත වන අවසන් පරිශීලක පාරිභෝගික බද්ද; සහ

(ඊ) සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ බලපත්‍රලාභීන් විසින් අයකර ගත යුතු මුළු ආදායම් අවශ්‍යතාවය.

(4) මේ වගන්තිය -

(අ) අවශ්‍ය වන විට, (මෙහි මින් මතු "තොග මිල දී ගැනීමේ බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) උත්පාදකයන්ගෙන් හෝ කලාපීය වෙළෙඳපොළේ සැපයුම්කරුවන්ගෙන් විදුලිබලය ආනයනය කිරීම ඇතුළුව උත්පාදන බලපත්‍රලාභීන්ගෙන් තොග වශයෙන් විදුලිබලය ප්‍රසම්පාදනය කිරීම සඳහා;

(ආ) (මෙහි මින් මතු "තොග විකුණුම් බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ට හෝ යම් පාරිභෝගිකයන්ට හෝ වෙළෙන්දන්ට හෝ අපනයන වෙළෙඳපොළේ ගනුදෙනුකරුවන්ට තොග වශයෙන් විදුලිය විකිණීම සඳහා,

ජාතික පද්ධති ක්‍රියාකරු විසින් අයකරගත යුතු "බදු" සහ "වෙනත් ගාස්තු" සඳහා අදාළ විය යුතු යː

එසේ වුව ද, IX වන කොටස ප්‍රකාරව විධිවිධාන සලසා ඇති ආකාරයෙන් "තොග විදුලිබල වෙළෙඳපොළ" පිහිටුවීම සහ 1 වන වගන්තිය ප්‍රකාරව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් තීරණය කරනු ලැබිය යුතු පරිදි යම් දිනයක සිට එය ක්‍රියාත්මක කිරීමත් සමග (3) වන උපවගන්තියේ නිශ්චිතව දක්වන ලද බදු, අදියරෙන් අදියර ආකාරයෙන් බලාත්මකව පැවතීම අවසන් විය යුතු ය.

(5) කාර්යක්ෂම ආකාරයකින් බලපත්‍ර මගින් බලය පවරන ලද කටයුතු කරගෙන යාමේ දී දැරීමට සිදු වූ යෝග්‍ය සාධාරණ පිරිවැය අයකර ගැනීමට බලපත්‍රලාභීන්ට අවසර දෙමින් ජාතික බදු ප්‍රතිපත්තියේ දක්වා ඇති ක්‍රමවේදයට අනුකූලව පිරිවැය පිළිබිඹු කිරීමේ යාන්ත්‍රණයකට අනුව සියලු බදු පනවනු ලැබිය යුතු ය.

(6) විදුලිය බෙදා හැරීම සහ සැපයීම හෝ විදුලිය බෙදා හැරීම හෝ සැපයීම සඳහා බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින් අයකර ගනු ලැබිය යුතු (මෙහි මින් මතු "බෙදා හැරීමේ සහ සැපයුම් බදු" යනුවෙන් සඳහන් කරනු ලබන) අවසන් පරිශීලක පාරිභෝගික බදු ය -

(අ) පාරිභෝගික සේවාවන් ඇතුළු බෙදා හැරීමේ ජාලය නඩත්තු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ සාධාරණ පිරිවැය සලකා බැලීමකින් පසු ජාතික බදු ප්‍රතිපත්තිය මත පදනම්ව නියාමක විසින් පනවනු ලැබිය යුතු බෙදා හැරීමේ බද්දෙන්; සහ

(ආ) බෙදා හැරීමේ බලපත්‍රලාභීන් විසින් ගෙවනු ලබන තොග මිල දී ගැනීමේ බද්දේ සහ සම්ප්‍රේෂණ බද්දේ පිරිවැය අයකර ගැනීම සඳහා නියාමක විසින් පනවනු ලබන සැපයුම් බද්දෙන්,

සමන්විත විය යුතු ය;

එසේ වුවද, IX වන කොටස ප්‍රකාරව විධිවිධාන සලසා ඇති ආකාරයෙන් "තොග විදුලිබල වෙළෙඳපොළ" පිහිටුවීම සහ 1 වන වගන්තිය ප්‍රකාරව එය ක්‍රියාත්මක කිරීමත් සමඟ, සැපයුම් බද්ද, වෙළෙඳපොළේ බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ගේ විදුලිබලය ප්‍රසම්පාදනය කිරීමේ පිරිවැය යන පදනම මත තීරණය කරනු ලැබිය යුතු ය.

(7) සැකය දුරු කිරීම සඳහා,-

(අ) බෙදා හැරීමේ බලපත්‍රලාභීන් විසින් පනවනු ලබන අවසන් පරිශීලක පාරිභෝගික බද්ද, එකිනෙකට වෙනස් බදු දෙකකින් එනම්, "විදුලිය බෙදා හැරීමේ බද්ද" සහ "සැපයුම් බද්ද" යන බදුවලින් සමන්විත බව;

(ආ) විවෘත ප්‍රවේශය තෝරා ගන්නා උත්පාදන බලපත්‍රලාභීන් සහ සුදුසුකම්ලත් වෙළෙන්දන් හෝ පාරිභෝගිකයන් අතර පවතින වාණිජමය ගිවිසුම් මත පදනම්ව විවෘත ප්‍රවේශ ගාස්තු තීරණය කරනු ලැබිය යුතු බැවින්, අනාගතයේ දිනයක විවෘත ප්‍රවේශය ක්‍රියාත්මක කිරීමත් සමඟ විවෘත ප්‍රවේශය තෝරා ගන්නා පාරිභෝගිකයන්ට අදාළ විය යුතු සැපයුම් බද්ද නතර විය යුතු බව,

ප්‍රකාශ කරනු ලැබේ:

එසේ වුව ද, විවෘත ප්‍රවේශය ප්‍රයෝජනයට ගන්නා යම් පාරිභෝගිකයන්ගෙන් විවෘත ප්‍රවේශ ගාස්තුවල කොටසක් ලෙස බෙදා හැරීමේ බද්ද අයකර ගැනීමට, බෙදා හැරීමේ බලපත්‍රලාභියා හිමිකම් ලැබිය යුතු ය.

(8) සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ බලපත්‍රලාභීන් විසින් අයකර ගනු ලැබිය යුතු විවෘත ප්‍රවේශ ගාස්තු, විවෘත ප්‍රවේශ ගාස්තු තීරණය කිරීමට අදාළ වන ජාතික බදු ප්‍රතිපත්තියේ අදාළ විධිවිධාන ප්‍රකාරව නියාමක විසින් පනවනු ලැබිය යුතු ය.

(9) අවස්ථාවෝචිත පරිදි, තොග මිල දී ගැනීමේ බද්ද, තොග විකිණීමේ බද්ද, සම්ප්‍රේෂණ බද්ද, විවෘත ප්‍රවේශ ගාස්තු සහ බෙදා හැරීමේ බද්ද සහ සැපයුම් බදු නියාමක විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර, ජාතික බදු ප්‍රතිපත්තියට සහ අදාළ බලපත්‍රවල නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට අනුව නියම කර ඇති පරිදි බලපත්‍රලාභීන් විසින් සිදු කරනු ලබන බදු ගොනු කිරීම් -

(අ) එකී බලපත්‍රලාභියාට ප්‍රදානය කරන ලද බලපත්‍රය මගින් බලය දෙන ලද සියලු කටයුතු කාර්යක්ෂම පදනමක් මත ක්‍රියාවට නැංවීමේ දී දරන ලද සියලු සාධාරණ පිරිවැය අයකර ගැනීමට අදාළ බලපත්‍රලාභියාට අවසර දිය යුතු ය;

(ආ) 4 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද ජාතික විදුලිබල ප්‍රතිපත්තිය මත පදනම් වූ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සහ ජාතික බදු ප්‍රතිපත්තියේ විධිවිධාන සලසා ඇති ආකාරයෙන් නියාමක විසින් අනුමත කරනු ලැබිය යුතු ය; සහ

(ඇ) පුළුල් මහජන දැනුම්වත්කම සහතික කරමින් නියාමක විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින් පළ කරනු ලැබිය යුතු ය.

(10) අවස්ථාවෝචිත පරිදි, ජාතික පද්ධති ක්‍රියාකරුගේ, ජාතික ජාල සේවා සැපයුම්කරුගේ හෝ බෙදා හැරීමේ බලපත්‍රලාභියකුගේ බලපත්‍රවල, අවස්ථාවෝචිත පරිදි, තොග ප්‍රසම්පාදනය කිරීමේ බද්ද සඳහා හෝ තොග විකිණීමේ බද්ද සහ වෙනත් ගාස්තු සඳහා හෝ සම්ප්‍රේෂණ බද්ද සහ වෙනත් ගාස්තු සඳහා හෝ විවෘත ප්‍රවේශ ගාස්තු සහ වෙනත් ගාස්තු සහ බෙදා හැරීමේ බද්ද සහ සැපයුම් බද්ද සහ වෙනත් ගාස්තු සඳහා විධිවිධාන ඇතුළත් විය යුතු අතර, මෙම බදු පිරිවැය පිළිබිඹු කරන බව සහතික කිරීම සඳහා, එම බලපත්‍ර, නියම කර ඇති ආකාරයෙන් නියාමක විසින් සිදු කරනු ලබන සමාලෝචනයකට යටත් විය යුතු ය. එසේම, එමගින් -

(අ) සම්ප්‍රේෂණ බද්ද සහ බෙදා හැරීමේ බදු, විවෘත ප්‍රවේශ ගාස්තු සහ වෙනත් ගාස්තු සමාලෝචනය කිරීම සඳහා වාර්ෂික කාල සටහන සඳහා;

(ආ) තොග විකිණීමේ බද්ද, තොග මිල දී ගැනීමේ බද්ද සහ සැපයුම් බද්ද සමාලෝචනය කිරීම සඳහා ත්‍රෛමාසික කාල සටහනක් සඳහා; සහ

(ඇ) පාරිභෝගිකයන්ට සහ වෙනත් උනන්දුවක් ඇති පාර්ශ්වයන්ට සමාලෝචන කාර්ය සඳහා වූ කාර්යපටිපාටියේ දී සහභාගී විය හැකි ආකාරය සඳහා ද,

විධිවිධාන සලස්වනු ලැබිය යුතු ය.

(11) මේ පනතේ වෙනත් යම් විධිවිධානයක කුමක් සඳහන් වුව ද, නියාමක විසින්,-

(අ) ඇතැම් පාරිභෝගිකයන්ට සහනාධාර දීමට රජය විසින් අනුමත කළ යම් සහනාධාරයක පිරිවැය දැරීමට රජය විසින් සපයනු ලබන අරමුදල්වල ප්‍රමාණවත් බව පිළිබඳ සෑහීමට පත් වීමෙන් පසු; සහ

(ආ) ජාතික බදු ප්‍රතිපත්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි යම් පාරිභෝගික කාණ්ඩයන්ගෙන් අයකර ගත හැකි යම් හරස් සහනාධාරයක් සලකා බැලීමෙන් පසු,

එකී සහනාධාර පිළිඹිබු වන, අදාළ බලපත්‍රලාභීන්ගෙන් අයකර ගනු ලැබිය යුතු බදු සහ ගාස්තු පනවනු ලැබිය හැකි ය.

## IX වන කොටස

## තොග විදුලිබල වෙළෙඳපොළ

තොග විදුලිබල වෙළෙඳපොළ පිහිටුවීම

27. (1) 1 වන වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්, එහි සඳහන් කරනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව, තොග විදුලිබල වෙළෙඳපොළ ක්‍රියාත්මක වීම ආරම්භ කරනු ලැබිය යුතු දිනය නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(2) තොග විදුලිබල වෙළෙඳපොළ ක්‍රියාත්මක කිරීමෙන් පසුව එය සම්පූර්ණයෙන් ම ස්වාධීන සහ තරඟකාරී විය යුතු

අතර, ජාතික පද්ධති ක්‍රියාකරු තොග විදුලිබල වෙළෙඳපොළ ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් වගකියනු ලැබිය යුතු ය. අදාළ පරදු දරන්නන්, එකී තොග විදුලිබල වෙළෙඳපොළ ක්‍රියාත්මක වීම පිළිබඳ දැනුම සහ පළපුරුද්ද සහිත විදුලිබල වෙළෙඳපොළේ ප්‍රවීණයන් සම්බන්ධීකරණයට අදාළ කරුණු සමඟ සහ එකී තොග විදුලිබල වෙළෙඳපොළ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අනුගමනය කරනු ලැබිය යුතු කාර්යපටිපාටිය නියම කරනු ලබන ආකාරයට විය යුතු ය.

(3) ජාතික පද්ධති ක්‍රියාකරු විසින් සම්පූර්ණ ස්වාධීන තොග විදුලිබල වෙළෙඳපොළක් ක්‍රියාත්මක කිරීම සඳහා (1) වන උපවගන්තිය ප්‍රකාරව යම් නියෝගයක් සිදු කිරීමට පෙරාතුව, මෙහෙයුම්, තාක්ෂණ, වාණිජමය සහ ආර්ථික පරාමිතීන් හඳුනා ගනිමින් සහ නිශ්චිතව දක්වමින් තොග විදුලිබල වෙළෙඳපොළ කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලැස්වීම පිණිස අවශ්‍ය වන නියෝග, නියම සහ කොන්දේසි, මාර්ගෝපදේශ, සහ රීති සාදනු ලැබ ඇති බවට සහ තොග විදුලිබල වෙළෙඳපොළ කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලැස්වීම පිණිස අවශ්‍ය වන වෙළෙඳපොළ අධීක්ෂණ ක්‍රියාවලි සහ නියම සහ කොන්දේසි, මාර්ගෝපදේශ, නියෝග සහ රීති මේ පනත ප්‍රකාරව සාදනු ලැබ ඇති බවට අමාත්‍යවරයා විසින් සහතික විය යුතු ය.

තරඟකාරී භාවිතයන්ට අදාළ ප්‍රතිශක්ති මාර්ගෝපදේශ

28. අමාත්‍යවරයා විසින්, නියාමක විමසා, විදුලිබල කර්මාන්තයේ තරඟකාරීත්වයට බලපාන තරඟකාරී නොවන භාවිතයන්, ඒකාධිකාරීන්, වංචනික හවුල්වීම් හා ආධිපත්‍යයේ අනිසි භාවිතයන් සහ ආනුෂංගික ඒකාබද්ධ කිරීමේ තත්ත්වයන් වැළැක්වීම සඳහා ගත යුතු පියවර සම්බන්ධයෙන් ප්‍රතිපත්ති මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබිය යුතු ය.

## X වන කොටස

## විවිධ

ඉහළ සහ භූගත විදුලි මාර්ග සඳහා අවශ්‍ය වන බලපත්‍රය

29. (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, යම් තැනැත්තකු විසින්, මේ පනත ප්‍රකාරව තත්කාර්යය සඳහා ලබාගත් බලපත්‍රයක් අනුව මිස, පොළවට ඉහළින් හෝ පොළොව යටින් විදුලි මාර්ගයක් සවි කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන -

(අ) කිලෝ වොට් තිස් තුනක් නොඉක්මවන නාමික වෝල්ටීයතාවක් සහිත හෝ නියාමක විසින් තීරණය කරනු ලබන වෙනත් යම් ඉහළ වෝල්ටීයතාවක් සහිත විදුලි මාර්ගයක් හෝ භූගත විදුලි කේබලයක් සඳහා; සහ

(ආ) එම විදුලි මාර්ග සවි කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු තැනැත්තා වාසය කරන හෝ ඔහුගේ පාලනය යටතේ පවතින පරිශ්‍රයක් ඇතුළත පවතින හෝ පැවතිය හැකි යම් විදුලි මාර්ගයක කොටසක් සඳහා,

අදාළ නොවිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද බලපත්‍රයක් -

(අ) නියාමකට යෝග්‍ය යයි පෙනී යන (විදුලි මාර්ගයක අයිතිය සහ ක්‍රියාකාරීත්වයට අදාළ කොන්දේසි ඇතුළු) යම් කොන්දේසි ඇතුළත් වී තිබිය හැකි ය;

(ආ) බලපත්‍රයේ නිශ්චිතව දැක්විය හැකි යම් කාලසීමාවක් අවසන් වීමෙන් පසු ඕනෑම අවස්ථාවක දී, නියාමක විසින් වෙනස් කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය; සහ

(ඇ) (ආ) ඡේදයට යටත්ව, බලපත්‍රය යටතේ හෝ මගින් නිශ්චිතව දක්වනු ලබන හෝ නිශ්චය කරනු ලබන යම් කාලසීමාවක් සඳහා අඛණ්ඩව බලාත්මක විය යුතු ය.

(4) මේ පනතේ කාර්ය සඳහා නියාමක විසින් යම් විදුලි මාර්ගයක් "අධිබල වෝල්ටීයතා මාර්ගයක්" වශයෙන් නම් කරන ලෙස විධාන කරනු ලැබිය හැකි ය.

බලශක්ති උත්පාදන සහ සම්ප්‍රේෂණ ව්‍යාපෘති සඳහා දේපළ අත්කර ගැනීම

30. මේ පනතේ විධිවිධාන ප්‍රකාරව විදුලිබල කර්මාන්තයට සම්බන්ධිත යම් ව්‍යාපෘතියක් සඳහා අවශ්‍ය ඉඩම් අත්කර ගැනීමේ දී, (295 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනත ප්‍රකාරව

සහ එම පනතේ අර්ථානුකූලව එකී ව්‍යාපෘතිය පොදු කාර්යයක් සඳහා වන්නේ නම්, එම ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්කර ගැනීම සම්බන්ධයෙන් එකී ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන අදාළ කරගනු ලැබිය හැකි ය.

බලශක්ති උත්පාදන සහ සම්ප්‍රේෂණ ව්‍යාපෘති සඳහා ඉඩම් මිල දී ගැනීම

31. (1) නිශ්චිත කාලයක් ඇතුළත ආරම්භ කළ විදුලිබල උත්පාදන ව්‍යාපෘතියක් හෝ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතියක් පැවතීමේ භව්‍ය ප්‍රතිලාභය මහජනතාවගේ පොදු සුබසාධනය සහ ප්‍රතිලාභය සැලසීම පිණිස වන බවට අමාත්‍යවරයාගේ අදහස වන අවස්ථාවක දී, පහත දැක්වෙන නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට යටත්ව, අමාත්‍යවරයා විසින්, පහත දැක්වෙන අවශ්‍යතාවලට අනුකූල වීමට යටත්ව, අදාළ ඉඩමට අදාළ පිඹුරේ විස්තර කර ඇති පරිදි, යම් ඉඩමක් හෝ එම ඉඩමේ යම් අයිතිවාසිකමක් මිල දී ගැනීම සඳහා අනුමතය ප්‍රදානය කරනු ලැබිය හැකි යː-

(අ) ඉඩමේ අයිතිකරුගේ හෝ එම ඉඩමේ යම් අයිතිවාසිකමකට හිමිකම් ලද තැනැත්තාගේ කැමැත්ත ලබා ගෙන තිබීම;

(ආ) සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් නොවන බලශක්ති ප්‍රභවයන් භාවිත කිරීම මගින් විදුලිබල උත්පාදනය කිරීම සඳහා වූ ව්‍යාපෘතියක් සඳහා හෝ දීර්ඝකාලීන විදුලිබල පද්ධති සංවර්ධන සැලැස්ම තුළට ගැනෙන සම්ප්‍රේෂණ යටිතල පහසුකම් ව්‍යාපෘතියක් සැපයීම සඳහා වන ඉඩමක් හෝ ඉඩමක අයිතිවාසිකමක් අවශ්‍ය වන අවස්ථාවක දී, එවැනි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා, අවස්ථාවෝචිත පරිදි, ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු හෝ ජාතික පද්ධති ක්‍රියාකරු බලපත්‍රලාභියා විසින් නියාමකගේ පූර්ව අනුමතය ලබා ගත යුතු වේ;

(ඇ) ඉඩමේ හෝ ඉඩමේ යම් අයිතිවාසිකමක ගැනුම් මිල ප්‍රධාන තක්සේරුකරු විසින් නිශ්චය කරනු ලබන පරිදි ඉඩමේ වෙළෙඳපොළ වටිනාකම විය යුතු අතර, වෙළෙඳපොළ වටිනාකම සඳහා එම ඉඩමේ අයිතිකරු හෝ ඉඩමේ යම් අයිතිවාසිකමක් ලද තැනැත්තා එකඟ නොවන අවස්ථාවක දී, නියම

කරනු ලැබිය හැකි ආකාරයෙන්, මිල ගිවිස ගැනීමට (ඇ) ඡේදයේ නිශ්චිතව දක්වනු ලබන මිල ගිවිස ගැනීමේ කමිටුව වෙත බලය  පවරා ඇත;

(ඇ) මේ වගන්තියේ කාර්ය සඳහා මිල ගිවිස ගැනීමේ කමිටුව -

(i) කමිටුවේ සභාපතිවරයා විය යුතු භාණ්ඩාගාර ලේකම්වරයා ;

(ii) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා;

(iii) ප්‍රධාන තක්සේරුකරු හෝ ඔහු විසින් නම් කරන තක්සේරු දෙපාර්තමේන්තුවේ යම් ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවකු; සහ

(iv) ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනය විසින් නම් කරනු ලබන එකී ආයතනයේ සාමාජිකයකු,

යන අයගෙන් සමන්විත විය යුතු ය.

(2) ඉඩමේ අයිතිකරුගේ හිමිකම හෝ එකී ඉඩමේ යම් අයිතිවාසිකමක් පිළිබඳව සෑහීමට පත් වීමේ වගකීමක් මිල ගිවිස ගැනීමේ කමිටුවට තිබිය යුතු ය.

(3) මිල දී ගැනීමට අපේක්ෂිත අදාළ ඉඩම හෝ එකී ඉඩමේ යම් අයිතිවාසිකමක් සියලු බැඳීම්වලින් නිදහස් බවට සහ එකී ඉඩමට හෝ එහි යම් අයිතිවාසිකමක් සඳහා අයිතිකරුට හෝ තැනැත්තාට  නිරවුල් හිමිකමක් පවතින බවට සහතික කරමින්, අවස්ථාවෝචිත පරිදි,  ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු විසින් හෝ ජාතික පද්ධති ක්‍රියාකරු බලපත්‍රලාභියා විසින් ඉදිරිපත් කරනු ලබන එකී ඉඩමේ හිමිකමට අදාළ හිමිකම් වාර්තාව, හිමිකම පිළිබඳ සාක්ෂියක් ලෙස පිළිගනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී අනුගමනය කරනු ලැබිය යුතු කාර්යපටිපාටිය නියම කර ඇති පරිදි විය යුතු ය.

## XI වන කොටස

### සාමාන්‍ය

විදුලිබල අංශ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය පිහිටුවීම

32. (1) මේ පනතේ විධිවිධාන සලස්වා ඇති පරිදි ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ දී අමාත්‍යවරයාට සහාය වීමේ කාර්යය සඳහා විදුලිබල අංශ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය යනුවෙන් කියනු ලබන සහ හඳුන්වනු ලබනු ලබන ලේකම් කාර්යාලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින්, අවංකත්වයෙන් යුතු වූ ද, පරිපාලනය හෝ මූල්‍ය විෂයයෙහි වසර දහයකට නොඅඩු පළපුරුද්දක් ඇත්තා වූ ද තැනැත්තන් තිදෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක් විදුලිබල අංශ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලයේ සාමාජිකයන් ලෙස පත් කරනු ලැබිය යුතු ය. අමාත්‍යවරයා විසින්, විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පළපුරුද්දක් ඇති තැනැත්තකු විදුලිබල අංශ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ සඳහන් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා මඟපෙන්වීම සහ අධීක්ෂණය කිරීම සඳහා විදුලිබල අංශ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලයට බලය තිබිය යුතු ය. අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින්, මේ පනතින් අපේක්ෂිත ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ දී, සෑම අවස්ථාවක දී ම අමාත්‍යවරයාගේ විධානයට සහ පාලනයට යටත්ව, විදුලිබල අංශ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය අධීක්ෂණය කරනු ලැබිය යුතු ය.

(4) විදුලිබල අංශ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය විසින්-

(අ) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී සහ 16 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති 2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව සංස්ථාගත කරන ලද අලුත් සමාගම් පනතින් විධිවිධාන සලස්වා ඇති පරිදි ස්වකීය මෙහෙයුම් ආරම්භ කරන බවට සහතික කිරීමේ දී අමාත්‍යවරයාට සහාය වීම;

(ආ) මේ පනත ප්‍රකාරව ප්‍රතිපත්ති මාර්ගෝපදේශ පිළියෙල කිරීම සම්බන්ධීකරණය කිරීම;

(ඇ) විදුලිබල කර්මාන්තයේ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා, පනතේ විධිවිධාන යටතේ සාදනු ලැබිය යුතු නියෝග පිළියෙල කිරීම සඳහා ප්‍රමුඛතාව ලබා දීමෙන් සහ පහසුකම් සැලසීමෙන් අමාත්‍යවරයාට සහාය වීම;

(ඈ) ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය අවසන් කිරීම සඳහා අවශ්‍ය වන මූලික පැවරීමේ සැලැස්ම සහ අවසාන පැවරීමේ සැලැස්ම කඩිනමින් සැකසීම සඳහා පහසුකම් සැලසීම;

(ඉ) 17 වන වගන්තිය ප්‍රකාරව පිළියෙල කරනු ලබන පැවරීමේ සැලැස්මේ හඳුනාගෙන ඇති කටයුතු ලංකා විදුලිබල මණ්ඩලයෙන් ඉවත් කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම ඇතුළුව, ලංකා විදුලිබල මණ්ඩලයේ වගකීම් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා යොදාගනු ලැබිය යුතු ක්‍රමවේදය හඳුනාගනු ලබන සම්පූර්ණ සහ කාර්යක්ෂම මූල්‍යමය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියක් සකස් කිරීම සම්බන්ධීකරණය කිරීම; සහ

(ඊ) ප්‍රතිසංස්කරණය කරන ලද විදුලිබල කර්මාන්තය ක්‍රියාකර වීම සහ තරඟකාරී, විනිවිදභාවයෙන් යුත් සහ වගකිවයුතු කාර්යපටිපාටි භාවිත කරමින් නව උත්පාදන ධාරිතාව ලබා ගැනීම සඳහා ජාතික පද්ධති ක්‍රියාකරුගේ ධාරිතා වර්ධනය ආරම්භ කිරීම,

සිදු කළ යුතු ය.

පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත් වන දිනයේ සිට වසර දෙකක කාලසීමාවක් අවසන් වූ විට, විදුලිබල අංශ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය සම්බන්ධයෙන් වන විධිවිධාන ක්‍රියාත්මක වීම අවසන් විය යුතු යඃ

(5) එසේ වුවද, එකී වසර දෙකක කාලසීමාව අවසන් වීමට දින තිහකට පෙරාතුව, අමාත්‍යවරයා විසින්, ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ලබා ගැනීමට යටත්ව, විදුලිබල අංශ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය ක්‍රියාත්මක වීම වසරකට වරක් බැගින් දීර්ඝ කළ හැකිය:

එසේම තවදුරටත්, විදුලිබල අංශ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය, එසේ දීර්ඝ කරනු ලැබිය හැකි සමුච්චිත කාලසීමාව පනත් කෙටුම්පත පාර්ලිමේන්තු පනතක් බවට පත් වන දිනයේ සිට වසර පහක කාලසීමාවක් නොඉක්මවිය යුතු ය.

ලංකා විදුලිබල මණ්ඩලය විසින් ස්වකීය සන්තකයේ ඇති සියලු දත්ත සහ තොරතුරු විදුලිබල අංශ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය වෙත ලබා දිය යුතු බව

33. (1) මේ පනත ප්‍රකාරව සිදු කරනු ලබන ප්‍රතිව්‍යුහගත කිරීම් කටයුතුවල දී, ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විදුලිබල අංශ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය සමඟ සහයෝගයෙන් කටයුතු කරනු ලැබිය යුතු ය. ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීවරයා විසින්, මණ්ඩලය වෙනුවෙන්, නියමිත දින සිට දින තිහක් ඇතුළත -

(අ) එකී මණ්ඩලය සන්තකයේ ඇත්තා වූ ද, සියලු දත්ත සහ ලේඛන සහ ලංකා විදුලිබල මණ්ඩලය විසින් සිදු කරනු ලබන සියලු කටයුතුවලට අදාළ තොරතුරු ඇතුළත් කවරාකාර හෝ වෙනත් යම් සැලකිය යුතු තොරතුරු;

(ආ) ලංකා විදුලිබල මණ්ඩලයේ පාලනය යටතේ ඇති උත්පාදන සහ සම්ප්‍රේෂණ උපකරණවල තාක්ෂණික පරාමිතීන් ඇතුළුව සියලු වත්කම් පිළිබඳ තොරතුරු;

(ඇ) ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය තත්ත්වයට අදාළ වූ තොරතුරු;

(ඈ) ලංකා විදුලිබල මණ්ඩලයේ සියලු සේවානියුක්තයන් සම්බන්ධයෙන් වන සම්පූර්ණ මානව සම්පත් විගණනයක්;

(ඉ) ලංකා විදුලිබල මණ්ඩලයේ විභාග වෙමින් පවත්නා සියලු නඩු පිළිබඳ තොරතුරු;

(ඊ) 17 වන වගන්තිය මගින් නියම කර ඇති පැවරීමේ සැලැස්ම සම්පූර්ණ කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය

වන ලංකා විදුලිබල මණ්ඩලය විසින් එළඹ ඇත්තා වූ ගිවිසුම්ගත බැඳීම් පිළිබඳ තොරතුරු,

විදුලිබල අංශ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු යː

එසේ වුව ද, විදුලිබල අංශ ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය විසින් ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබුණු සියලු තොරතුරු සම්බන්ධයෙන් රහස්‍යභාවය පවත්වා ගත යුතු අතර, මේ පනතේ විධිවිධාන ප්‍රකාරව එහි බලතල සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමේ සහ සිදු කිරීමේ කාර්යය සඳහා පමණක් එකී තොරතුරු භාවිත කළ යුතු ය.

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ ඇතැම් විධිවිධාන මේ පනතට අදාළ වීම

34. 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ III වන කොටසේ I වන පරිච්ඡේදයේ "අල්ලස් හෝ දූෂණවලට අදාළ වැරදි" යන ශීර්ෂය යටතේ වන විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ පනතේ විධිවිධාන සඳහා හෝ ඒ සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

විදුලිබලය නිස්සාරණය කිරීම වරදක් විය යුතු බව

35. (1) (අ) සම්ප්‍රේෂණ හෝ බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින් සම්ප්‍රේෂණය කරනු ලබන හෝ බෙදා හරිනු ලබන අතරතුර; සහ

(ආ) බෙදා හැරීමේ බලපත්‍රලාභියකු හෝ වෙනත් සම්ප්‍රේෂණ බලපත්‍රලාභියකු සමඟ ඇති කරගන්නා ලද ගිවිසුමක් අනුව මිස,

විදුලිය ලබා ගන්නා වූ, භාවිත කරන්නා වූ හෝ නිස්සාරණය කරන්නා වූ සෑම තැනැත්තකු ම වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට සහ ඒ වරද සැදුනා වූ ක්‍රියාවේ හෝ පැහැරහැරීමේ ප්‍රතිඵලයක් වශයෙන් බලපත්‍රලාභියාට සිදු වූ පාඩුවේ හෝ අලාභහානියේ අගයට සමාන මුදලකින් වූ අමතර දඩයක් හෝ මාස තුනක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම

හෝ යටත් විය යුතු ය. එකී අමතර දඩය වශයෙන් අයකර ගනු ලබන මුදල, බලපත්‍රලාභියා විසින් අධිකරණය වෙත කරනු ලබන ඉල්ලීමක් මත ඒ බලපත්‍රලාභියාට ගෙවිය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ දඬුවම් කළ හැකි යම් වරදක් සිදු කිරීමට ආධාර දෙන්නා වූ හෝ අනුබල දෙන්නා වූ යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, එකී වරද සඳහා විධිවිධාන සලස්වා ඇති දඬුවමට ම යටත් විය යුතු ය.

(3) තැනැත්තන් දෙදෙනෙකු හෝ වැඩි සංඛ්‍යාවක් විසින් ප්‍රධාන වරදකරු ලෙස හෝ අනුබල දෙන්නා ලෙස එකම වරද සිදු කර ඇති බවට වරදකරු කරනු ලැබූ අවස්ථාවක දී, එකී පාඩුවේ හෝ අලාභයේ වටිනාකම එම තැනැත්තන් අතර විභජනය කරනු ලැබිය හැකි අතර, එසේ විභජනය කරන ලද මුදල එකී එක් එක් තැනැත්තා වෙත දඩයක් ලෙස පනවනු ලැබිය යුතු ය.

(4) පටහැනිව සාක්ෂි නොමැති අවස්ථාවක, බලපත්‍රලාභියා විසින් නිකුත් කරනු ලබන සහතිකයක් එකී පාඩුවේ හෝ අලාභයේ වටිනාකම පිළිබඳ සාක්ෂියක් ලෙස භාරගනු ලැබිය යුතු ය. ගිවිසුමක් නොමැති අවස්ථාවක, බලපත්‍රලාභියකු විසින්, බලපත්‍රයේ විධිවිධාන සලස්වා ඇති ගාස්තු අය කිරීමේ ක්‍රමවේදය අනුකූලව පාරිභෝගිකයකු වෙත සපයන ලද විදුලිය මෙන් එසේ සපයන ලද විදුලිය සඳහා වරදකරුවන්ගෙන් අයකිරීම් කරගනු ලැබිය හැකි ය.

විදුලිබලය අනිසි ලෙස භාවිත කිරීම වරදක් විය යුතු බව

36. (1) මේ පනතේ විධිවිධානවලට අගතියක් නොමැතිව -

(අ) බලපත්‍රලාභියකුගේ බලයලත් නිලධරයකු නොවෙමින්, බලපත්‍රලාභියා විසින් මනුවේ, දර්ශකයේ හෝ වෙනත් උපකරණයක සිට හෝ මනුව, දර්ශකය හෝ වෙනත් උපකරණයක් වෙත විදුලිබලය සපයනු ලබන හෝ සපයනු ලැබිය හැකි යම් විදුලි මාර්ගයක් සන්ධි කරන හෝ විසන්ධි කරන;

(ආ) බලපත්‍රලාභියකුගේ කැමැත්තෙන් තොරව, යම් විදුලි මාර්ගයක් අතුරන හෝ ඇතිරීමට කටයුතු සලස්වන හෝ බලපත්‍රලාභියකුට අයත් යම් විදුලි

මාර්ගයක්, උපකරණයක් හෝ වැඩ කටයුතු සමඟ සම්බන්ධතාවක් ඇති කිරීමේ කාර්යය සඳහා යම් විදුලි මාර්ගයක්, උපාංගයක්, උපකරණයක් හෝ වැඩ කටයුතු සම්බන්ධ කරන; හෝ

(ඇ) චේතනාන්විතව හෝ නොසැලකිලිමත්ව -

(i) බෙදා හැරීමේ බලපත්‍රලාභියකු විසින් යම් පරිශ්‍රයකට සපයනු ලබන විදුලි ප්‍රමාණය මැනීම සඳහා භාවිත කරන මනුවෙහි සටහන් කර ඇති විදුලි ප්‍රමාණය වෙනස් කරන; හෝ

(ii) යම් මනුවක්, එකී මනුව මගින් සපයනු ලබන විදුලි ප්‍රමාණය යථා පරිදි සටහන් කිරීමෙන් වළක්වන,

සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂයකට නොඅඩු වූ ද රුපියල් ලක්ෂ පහකට නොවැඩි වූ ද දණ්ඩනයකට අමතරව, එම වරද සංස්ථාපනය වන ක්‍රියාවේ හෝ පැහැර හැරීමේ ප්‍රතිඵලයක් ලෙස බලපත්‍රලාභියාට සිදු වූ පාඩුවේ හෝ අලාභයේ අගයට සමාන මුදලකින් වූ දඩයකට ද යටත් විය යුතු අතර, එකී බලපත්‍රලාභියා විසින් අධිකරණය වෙත කරනු ලබන ඉල්ලීමක් මත, එකී අයකර ගත් අමතර දඩය බලපත්‍රලාභියා වෙත ගෙවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ වන වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව නඩු පවරනු ලැබූ අවස්ථාවක දී, -

(i) නඩු පවරා ඇත්තේ යම් තැනැත්තකුට විරුද්ධව ද, එකී තැනැත්තාගේ භාරයේ හෝ පාලනය යටතේ මනුව තිබූ බවට; සහ

(ii) එකී මනුවේ සටහන් කර ඇති විදුලි ප්‍රමාණය පිළිබඳ දත්ත ගබඩාවේ වෙනසක් සිදු වන පරිදි එකී මනුව පළුදු කර ඇති බවට ද එනිසා එකී

භාවිත කළ විදුලි ප්‍රමාණය සටහන් කිරීමෙන් මනුව වළක්වා ඇති බවට ද, පැහැදිලි සාක්ෂි ඇති බවට,

බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් නිකුත් කරනු ලබන සහතිකයක් සාක්ෂි ලෙස අවේශනය විය යුතු අතර, එහි අන්තර්ගත කරුණු බැලූබැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ දඬුවම් කළ හැකි යම් වරදක් සිදු කිරීම සඳහා ආධාර දෙන හෝ අනුබල දෙන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, ප්‍රධාන වරද සඳහා විධිවිධාන සලස්වා ඇති දඬුවමට ම ඒ තැනැත්තා යටත් විය යුතු ය. තැනැත්තන් දෙදෙනෙකු හෝ වැඩි සංඛ්‍යාවක් විසින්, ලෙස හෝ අනුබල දෙන්නා ලෙස ප්‍රධාන වරදකරු එකම වරද සිදු කර ඇති බවට වරදකරු කරනු ලැබූ අවස්ථාවක, එකී පාඩුවේ හෝ අලාභයේ වටිනාකම එකී තැනැත්තන් අතර විභජනය කරනු ලැබිය හැකි අතර, එසේ විභජනය කරන ලද මුදල එකී එක් එක් තැනැත්තා වෙත දඩයක් ලෙස පනවනු ලැබිය යුතු ය.

(4) පටහැනිව සාක්ෂි නොමැති අවස්ථාවක දී, බලපත්‍රලාභියා විසින් නිකුත් කරනු ලබන සහතිකයක්, එකී පාඩුවේ හෝ අලාභයේ වටිනාකම පිළිබඳ සාක්ෂියක් ලෙස භාරගනු ලැබිය යුතු ය. ගිවිසුමක් නොමැති අවස්ථාවක, බලපත්‍රලාභියකු විසින්, බලපත්‍රයේ විධිවිධාන සලස්වා ඇති අයකිරීමේ ක්‍රමවේදයකට අනුකූලව යම් පාරිභෝගිකයකු වෙත සපයන ලද බලශක්තිය සඳහා අයකිරීම් කරනු ලැබිය හැකි ය.

(5) වරදකරු කරනු ලැබීමෙන් පසු එකී වරද දිගට ම කරගෙන යනු ලබන අවස්ථාවක, වරදකරු කරනු ලැබීමෙන් පසු එකී වරද දිගට ම කරගෙන යනු ලබන එක් එක් දිනයක් සඳහා රුපියල් පන්දහසක් නොඉක්මවන තවදුරටත් වූ දඩයක් පනවනු ලැබිය යුතු ය.

(6) යම් තැනැත්තකු (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ වරදකට වරදකරු කරනු ලැබූ අවස්ථාවක, බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින්, වරදකරු කරනු ලැබූ තැනැත්තාගේ පරිශ්‍රයට විදුලි සැපයුම විසන්ධි කිරීම සහ වරද සිදු කරන ලද්දේ යම් මනුවක් සම්බන්ධයෙන් ද, එම මනුව ඉවත් කිරීම කරනු ලැබිය හැකි අතර, ඉන්පසුව, එම මනුව බැහැර කිරීම සඳහා

නියාමක විසින් බලපත්‍රලාභියාට අවසර දෙනු ලබන තෙක්, එය සුරක්ෂිත භාරයේ තබනු ලැබිය හැකි ය. එසේ වුව ද, නොගෙවූ මුදල් ප්‍රමාණය බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින් අයකර ගනු ලැබූ අවස්ථාවක, බෙදා හැරීමේ බලපත්‍රලාභියා විසින්, සාධාරණ කාලසීමාවක් ඇතුළත, විසන්ධි කළ විදුලි සැපයුම ආපසු ලබා දෙනු ලැබිය යුතු ය.

(7) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ වන වරදක් ඒ පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා සංඥෙය වරදක් සහ ඇප දිය නොහැකි වරදක් විය යුතු ය.

සාමාන්‍ය දණ්ඩනය

37. (1) මේ පනතේ යම් විධිවිධානයක් හෝ මේ පනත යටතේ සාදනු ලබන යම් නියෝගයක් හෝ උල්ලංඝනය කරන සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර, මේ පනතේ අන්‍යාකාරයකින් ප්‍රකාශිතව ම විධිවිධාන සලස්වා ඇත්නම් මිස, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකට ද, වරදකරු කරනු ලැබීමෙන් පසු එම වරද දිගට ම කරගෙන යනු ලබන අවස්ථාවක, වරදකරු කරනු ලැබීමෙන් පසු එම වරද දිගට ම කරගෙන යනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන්දහසක් නොඉක්මවන තවදුරටත් වූ දඩයකට ද යටත් විය යුතු ය.

(2) යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු කරනු ලැබූ පසු, මහෙස්ත්‍රාත්වරයකු විසින්, වරද සඳහා (1) වන උපවගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති යම් දඬුවමකට අමතරව හෝ එම දඬුවම වෙනුවට, වරද සිදු කිරීම සම්බන්ධ යම් සවි කිරීමක් හෝ වෙනත් උපකරණයක් එකී ආඥාවේ නිශ්චිතව දක්වා ඇති දිනයකට පෙර ගලවා ඉවත් කළ යුතු බවට ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(3) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, නියාමක විසින් ලිඛිතව බලය දෙන ලද යම් නිලධරයකු විසින්, මේ පනත යටතේ වන වරදක් සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයක නඩු කටයුතු පවරනු ලැබිය හැකි ය.

(4) නියාමකගේ ලිඛිත අනුමතය ඇතිව මිස, මේ පනත යටතේ වන වරදක් සම්බන්ධයෙන් කිසිදු නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

පුද්ගල මණ්ඩල විසින් සිදු කරනු ලබන වැරදි

38. මේ පනත යටතේ වන වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කර ඇති අවස්ථාවක දී -

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාපිත මණ්ඩලයක් වේ නම්, ඒ සංස්ථාපිත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු ම සහ නිලධරයකු ම; හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය හවුල් ව්‍යාපාරයක් වේ නම්, ඒ හවුල් ව්‍යාපාරයේ සෑම හවුල්කරුවකු ම,

ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, එකී තැනැත්තාගේ දැනීමෙන් තොරව එකී වරද සිදු කළ බවට නැතහොත් එකී වරද සිදු කිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය නිසි උද්‍යෝගයෙන් එකී තැනැත්තා ක්‍රියා කර ඇති බවට එකී තැනැත්තා විසින් ඔප්පු කරන්නේ නම්, ඒ සංස්ථාපිත මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු හෝ එකී හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවකු එම වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

ඇතුළු වීමේ, පරීක්ෂා කිරීමේ සහ සෝදිසි කිරීමේ බලතල

39. (1) යම් පරිශ්‍රයක් තුළ මේ පනතේ විධිවිධානවලට පටහැනි කටයුත්තක් සිදු කරගෙන යන බවට නියාමකට විශ්වාස කිරීම සඳහා සාධාරණ හේතු ඇති අවස්ථාවක, නියාමක විසින් හෝ නියාමක වෙනුවෙන් කටයුතු කරන යම් නිලධරයකු විසින් මහෙස්ත්‍රාත්වරයකුගෙන් වරෙන්තුවක් ලබා ගැනීමෙන් ද, අවශ්‍ය නම්, එම වරෙන්තුව ඉදිරිපත් කිරීමෙන් ද පසු -

(අ) දවසේ සාධාරණ වේලාවක් තුළ දී, නියාමනය කරන ලද අස්තිත්වයක් විසින් එහි ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලබන පරිශ්‍රයට හෝ ඒ හා සම්බන්ධ වෙනත් පරිශ්‍රයකට ඇතුළු වීම, පරීක්ෂා කිරීම සහ සෝදිසි කිරීම; සහ

(ආ) ඒ නියාමනය කරන ලද අස්තිත්වයේ යම් අදාළ වාර්තා හෝ ලේඛන පරීක්ෂා කිරීම, එහි පිටපත් ලබා ගැනීම හෝ එකී වාර්තා හෝ ලේඛන තහනමට ගැනීම සහ රඳවා තබා ගැනීම,

කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී නියාමකට හෝ නියාමක වෙනුවෙන් කටයුතු කරන යම් නිලධරයකුට බාධා කරන යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන්නේ ය.

දුෂ්කරතා ඉවත් කිරීම

40. (1) මේ පනතේ විධිවිධාන හෝ මේ පනත යටතේ සාදනු ලබන යම් නියමයක්, නියෝගයක්, රීතියක් හෝ නිවේදනයක් බලාත්මක කිරීමේ දී, යම් දුෂ්කරතාවක් ඇති වූ අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, යම් නිශ්චිත දුෂ්කරතාවක් ඉවත් කිරීම සඳහා අවශ්‍ය වූ ද නැතහොත් යෝග්‍ය වූ ද, මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවූ ද පියවර ගනු ලැබිය හැකි ය.

(2) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින්, එකී දුෂ්කරතාවක් ඉවත් කිරීමේ කාර්යය සඳහා ගන්නා ලද පියවර නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය.

රීති

41. (1) මේ පනත ප්‍රකාරව රීති සාදනු ලැබීමට නියම කරන ලද හෝ බලය දෙන ලද සියලු කාරණා සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය.

(2) මේ පනත ප්‍රකාරව සාදන ලද සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එකී පළ කරනු ලබන දිනයේ දී හෝ එහි නිශ්චිතව දක්වා ඇති යම් පසු දිනයක සිට එම රීති බලාත්මක විය යුතු ය.

නියම

42. (1) මේ පනත ප්‍රකාරව සාදන ලද සෑම නියමයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එකී පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මකභාවයට එළඹිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාරව ගැසට් පත්‍රයේ පළ කරන ලද සෑම නියමයක් ම, එකී පළ කිරීමේ සිට දින අනූවක් ඇතුළත, පාර්ලිමේන්තු යෝජනා සම්මතයක් මගින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) එසේ අනුමත කරනු නොලැබූ යම් නියමයනක් ඒ යටතේ නිසිලෙස කරන ලද කිසිවකට අගති විරහිතව එකී යෝජනා සම්මතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

නියෝග

43. (1) මේ පනතින් නියම කරනු ලැබිය යුතු යයි නියමිත හෝ මේ පනත මගින් නියෝග සෑදීමට බලය දෙන ලද සියලු කාරණා සම්බන්ධයෙන් මේ පනත යටතේ අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ සාදනු ලැබිය යුතුය නියෝග යක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එකී පළ කරනු ලබන දිනයේ දී හෝ එහි නිශ්චිතව දක්වනු ලබන යම් පසු දිනයක දී හෝ ක්‍රියාත්මකභාවයට එළඹිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝග යක් ම එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමේ දින සිට මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ එවැනි යම් නියෝගයක්, ඒ යටතේ නිසිලෙස කරන ලද කිසිවකට අගති විරහිතව එකී අනනුමතයේ දින සිට, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

## XII වන කොටස
## ඉවත් කිරීම් සහ අන්තර්කාලීන විධිවිධාන

44. (1) අවස්ථාවෝචිත පරිදි, 1 වන වගන්තියේ (2) වන, (3) වන හෝ (4) වන උපවගන්ති ප්‍රකාරව මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක වන දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි, 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනත ඉවත් කරනු ලැබිය යුතු ය. 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනත අවලංගු කිරීම නොතකා,- ඉවත් කිරීම් සහ අන්තර්කාලීන විධිවිධාන

(අ) ඉවත් කරන ලද 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනත යටතේ සාදන ලද සහ නියමිත දිනයට පෙරාතුව ම වන දිනයේ දී බලාත්මකව පවතින සියලු නියෝග, එකී නියෝග මේ පනතේ යම් විධිවිධානයක් සමඟ අනනුකූල නොවන තාක් දුරට, එකී නියෝග ප්‍රතියෝජනය කිරීම සඳහා මේ පනත යටතේ නියෝග සාදනු ලබන තෙක්, නියමිත දිනයේ සිට සහ ඉන්පසුව අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතු ය;

(ආ) නියමිත දිනයට පෙරාතුව ම වන දිනයේ දී බලාත්මකව පවතින ලංකා විදුලිබල මණ්ඩලයේ උසස් වීමේ පටිපාටිවල විධිවිධාන, ආචාර ධර්ම සංග්‍රහ සහ විනය සංග්‍රහ, එකී උසස් වීමේ පටිපාටිය, ආචාර ධර්ම සංග්‍රහය සහ විනය සංග්‍රහය මේ පනතේ යම් විධිවිධානයක් සමඟ අනනුකූල නොවන තාක් දුරට, අනුප්‍රාප්තික සමාගම්වල අඛණ්ඩව සේවය කරගෙන යාමට තෝරාගෙන ඇති ලංකා විදුලිබල මණ්ඩලයේ සේවානියුක්තයන්ගේ උසස් වීම් සහ විනය පාලනය සම්බන්ධයෙන් පැන නගින යම් කාරණාවක් හෝ ප්‍රශ්නයක් සම්බන්ධයෙන්, එකී සේවානියුක්තයන්ගේ උසස් වීම් සහ විනය පාලනය නියාමනය කිරීම සඳහා මේ පනත යටතේ උසස් වීමේ පටිපාටි, ආචාර ධර්ම සංග්‍රහ සහ විනය සංග්‍රහ පනවනු ලබන තෙක්, නියමිත දිනයේ සිට සහ ඉන් පසුව අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතු ය;

(ඇ) නියමිත දිනයෙන් පසුව, මේ පනත් යටතේ කිසිදු විධිවිධානයක් හෝ කිසිදු සාධනීය විධිවිධානයක් සාදනු ලැබ නොමැති, විදුලිබල කර්මාන්තයේ දී උද්ගත වන හෝ ඒ සම්බන්ධ යම් කාරණාවක් හෝ ගැටලුවක් ඉතිරිව පවතින අවස්ථාවක දී, මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනතේ විධිවිධාන, එකී කාර්යය සඳහා මේ පනතේ විධිවිධානය සාදනු ලබන තෙක්, අන් කිසිවකට නොව එකී යම් කාරණයක් හෝ ගැටලුවක් සම්බන්ධයෙන් පමණක් නියමිත දිනයේ සිට සහ ඉන් පසුව අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතු අතර, ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය;

(ඈ) නියමිත දිනයට පෙරාතුව ම වන දිනයේ දී විභාග වෙමින් පවතින ලංකා විදුලිබල මණ්ඩලය විසින් හෝ එයට එරෙහිව ගොනු කරන ලද කවරාකාර ස්වභාවයෙන් යුත් සියලු නඩුකර සහ නඩු කටයුතු නියමිත දිනයේ සිට වන පරිදි අදාළ අනුප්‍රාප්තික සමාගම විසින් හෝ එයට එරෙහිව ගොනු කරන ලද නඩුකර සහ නඩු කටයුතු ලෙස සැලකිය යුතු අතර, ඒ අනුව අඛණ්ඩව පවත්වාගෙන යා හැකි ය;

(ඉ) නියමිත දිනයට පෙර ලංකා විදුලිබල මණ්ඩලය විසින් සහ එයට එරෙහිව සිදු කරන ලද යම් අධිකරණයක සියලු නඩු තීන්දු, තීන්දු ප්‍රකාශ හෝ නියෝග එකී දිනයේ සිට සහ ඉන් පසුව අඛණ්ඩව බලාත්මකව පැවතිය යුතු බවට සලකනු ලැබිය යුතු අතර, මේ පනත ප්‍රකාරව ඒ අනුව බලාත්මක විය යුතු ය;

(ඊ) යම් දැන්වීමක, ගිවිසුමක, සාධන පත්‍රයක, වාර්තාවක, කොටස් සහතිකයක, ලේඛනයක, ඔප්පුවක, බැඳුම්කරයක, එකඟතාවයක, ඇපකරයක, ඇටර්නි බලපත්‍රයක, නීති නියෝජිත ප්‍රදානයක හෝ කවරාකාර ස්වභාවයෙන් යුත් යම් වෙනත් සාධන පත්‍රයක ලංකා විදුලිබල මණ්ඩලයට යම් යොමු කිරීමක් දැනට බලාත්මකව පවතින්නේ නම්, එම යොමු කිරීම මේ පනත ප්‍රකාරව වලංගු සහ ක්‍රියාත්මක ලෙස සැලකිය යුතු අතර ඒ අනුව අඛණ්ඩව බලාත්මක විය යුතු ය.

(2) 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත ඉවත් කරනු ලැබිය යුතු ය. 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත ඉවත් කිරීම නොතකා, -

(අ) 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ නිකුත් කරන ලද සහ නියමිත දිනයට පෙරාතුව ම වන දිනයේ දී බලාත්මකව පවතින සියලු බලපත්‍ර සහ නිකුත් කර ඇති බවට සලකන සියලු බලපත්‍ර, එකී බලපත්‍ර මගින් පහත දැක්වෙන ක්‍රියාකාරකම්වලින් යම් ක්‍රියාකාරකමක් සඳහා බලය දී ඇති තාක් දුරට, නියමිත දිනයේ සිට සහ ඉන් පසුව එකී දිනයේ සිට මාස නවයක කාලසීමාවක් සඳහා අඛණ්ඩව වලංගුව සහ බලාත්මකව පැවතිය යුතු ය :-

(i) විදුලිබලය උත්පාදනය කිරීම සඳහා නිකුත් කරන ලද සියලු උත්පාදන බලපත්‍ර සහ නිකුත් කළ ලෙස සලකන උත්පාදන බලපත්‍ර;

(ii) ("ශ්‍රී ලංකාවේ ජාතික ජාලකය" යනුවෙන් ද හඳුන්වනු ලබන) ජාතික සම්ප්‍රේෂණ ජාලයේ ක්‍රියාකාරීත්වය, නඩත්තුව, අනාගත සැලසුම්කරණය සහ සංවර්ධනය සඳහා මේ පනතේ 14 වන සහ 15 වන වගන්ති යටතේ ලැයිස්තුගත කර ඇති ක්‍රියාකාරකම් සිදු කරගෙන යාම සඳහා නිකුත් කරනු ලැබ ඇතැයි සලකනු ලබන ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු බලපත්‍රය;

(iii) ලංකා විදුලිබල මණ්ඩලයේ බෙදා හැරීමේ කොට්ඨාසවල බලයලත් ප්‍රදේශවල පාරිභෝගිකයන්ට සහ හෝ යම් පරිශ්‍රවලට විදුලිබලය බෙදා හැරීම සඳහා සහ හෝ විදුලිබලය සැපයීම සඳහා නිකුත් කරන ලද බෙදා හැරීමේ බලපත්‍ර;

(iv) ප්‍රසම්පාදනය සඳහා සහ බෙදා හැරීමේ බලපත්‍රලාභීන් සහ යම් වෙනත් ගනුදෙනුකරුවන් වෙත තොග ආකාරයෙන්

විදුලිබලය විකිණීම සඳහා 10 වන වගන්තිය යටතේ ලැයිස්තුගත කර ඇති ක්‍රියාකාරකම් සිදු කරගෙන යාම සඳහා නිකුත් කරනු ලැබ ඇතැයි සලකනු ලබන ජාතික පද්ධති ක්‍රියාකරු බලපත්‍රය;

(v) සීමාසහිත ලංකා විදුලිබල (පුද්ගලික) සමාගමේ බලයලත් ප්‍රදේශයේ පාරිභෝගිකයන්ට හෝ යම් පරිශ්‍රවලට විදුලිබලය බෙදා හැරීම සඳහා සහ හෝ විදුලිබලය සැපයීම සඳහා සීමාසහිත ලංකා විදුලිබල (පුද්ගලික) සමාගම වෙත නිකුත් කරන ලද බෙදා හැරීමේ බලපත්‍රයඃ

එසේ වුව ද, (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් කරන ලද මාස නවයක කාලසීමාව ඉකුත්වීමට පෙර මාස හයකට නොඅඩු කාලයක දී, සියලු බලපත්‍රලාභීන් සහ බලපත්‍රලාභීන් ලෙස සලකනු ලබන සියල්ලන්ටම මේ පනතේ විධිවිධාන ප්‍රකාරව බලපත්‍ර ලබා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍ර යොමු කරන ලෙසට නියම කරනු ලැබිය යුතු ය; සහ

(ආ) ඉවත් කරන ලද 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 56 වන වගන්තිය යටතේ සාදන ලද සහ නියමිත දිනයට පෙරාතුව ම වන දිනයේ දී බලාත්මකව පවතින සියලු නියෝග, එකී නියෝග මේ පනතේ යම් විධිවිධානයක් සමඟ අනනුකූල නොවන තාක් දුරට, මේ පනත යටතේ නියෝග සාදනු ලබන තෙක්, එකී දිනයේ සිට බලාත්මක වන පරිදි අඛණ්ඩව බලාත්මකව පැවතිය යුතු ය සහ බලාත්මකව පවතින බවට සලකනු ලැබිය යුතු ය.

(3) 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනතේ II වන කොටසේ විධිවිධාන ක්‍රියාත්මක වීම ප්‍රකාරව ලංකා විදුලිබල මණ්ඩලය වෙත රජයේ විදුලිබල පවරා ගැනීමේ දෙපාර්තමේන්තුව සහ පළාත් පාලන ආයතනවලින් පවරනු ලැබ ඇති සියලු

ඉඩම්, එකී සහතිකයට අමුණනු ලබන උපලේඛනයේ (සීමා සහ මායිම් සහිතව) විස්තර කර ඇති සියලු ඉඩම්වල හිමිකරු ලංකා විදුලිබල මණ්ඩලය වන බව සහ එම සියලු ඉඩම් ලංකා විදුලිබල මණ්ඩලය විසින් අත්කරගෙන ඇති බව සහතික කරමින් සාමාන්‍යාධිකාරිවරයාගේ සන්තකයේ සහ පාලනයේ පවතින එකී පැවරීම සම්බන්ධ තොරතුරු සහ ලේඛනමය සාක්ෂි මත පදනම්ව ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිවරයාගේ අත්සන යටතේ නිකුත් කරනු ලබන සහතිකයක් ඉදිරිපත් කිරීමෙන් පසුව, ලියාපදිංචි කරන ලෙසට ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා වෙත නියම කරනු ලැබිය යුතු ය.

(4) 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනතේ II වන කොටසේ විධිවිධාන ක්‍රියාත්මක වීම ප්‍රකාරව, රජයේ විදුලිබල පවරා ගැනීමේ දෙපාර්තමේන්තුව සහ යම් පළාත් පාලන ආයතනයක් විසින් හිමිකාරීත්වය සහ සන්තකය දැරූ සියලු වත්කම් සහ ඉඩම් ඇතුළු සියලු විදුලිබල කටයුතු පවරා ගැනීමේ දිනයේ සිට, ලංකා විදුලිබල මණ්ඩලය, සහතිකයට අමුණා ඇති උපලේඛනයේ සවිස්තරාත්මකව විස්තර කර ඇති ඉඩම්වල හිමිකරු සහ භුක්තිකරු බවට පත් වූ බවට සහ ලංකා විදුලිබල මණ්ඩලය විසින් සියලු විදුලිබල කටයුතු පවරා ගන්නා ලද දිනයේ සිට සහ ඉන්පසුව කිසිදු අවහිරතාවකින් තොරව ලංකා විදුලිබල මණ්ඩලයේ දේපළ ලෙස එම ඉඩම් සහ වත්කම්වල සියලු ප්‍රතිලාභ භුක්ති විඳිනු ලැබ ඇති බවට, ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිවරයාගේ අත්සන යටතේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ කාර්යය සඳහා "රෙජිස්ට්‍රාර්වරයා" යන්නෙන්, (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ පත් කරන ලද සහ එකී ඉඩම් පිහිටා ඇති දිස්ත්‍රික්ක සහ කොට්ඨාස සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා අදහස් වේ.

(6) 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනත ඉවත් කිරීම නොතකා "මහවැලි ජලාශ සංකීර්ණයේ", "ලක්ෂපාන ජලාශ සංකීර්ණයේ", "වෙනත් ජල සංකීර්ණවල" ජලාශ, ජල පොකුණු සහ ජල එකතුවක් ක්‍රියා කරවීම සහ නඩත්තු කිරීම ඇතුළුව කළමනාකරණය කිරීමට වගකිව යුතු අදාළ රජයේ නියෝජ්‍යායතන විසින්, අදාළ රජයේ නියෝජ්‍යායතන සහ එකී අනුප්‍රාප්තික සමාගම් හෝ එහි අනුබද්ධිත සමාගම් අතර

එකඟතාවයට එළඹිය හැකි නියම සහ කොන්දේසි මත, එකී ජල විදුලි පිරියත විදුලිබලය උත්පාදනය කිරීමෙහි නිරත කරවා තැබීම සඳහා අනුප්‍රාප්තික සමාගම්වල ජල විදුලි උත්පාදන පිරියතවලට අඛණ්ඩව ජලය මුදාහරිනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය

45. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ-

"බලය දීම" යන්නෙන්, බලපත්‍රයක් මගින් බලය දීමක් හෝ මේ පනත යටතේ නිදහස් කිරීමක් අදහස් වේ;

"බලයලත් ප්‍රදේශ" යන්නෙන්, බලපත්‍රයක් මගින් විදුලිබලය සම්ප්‍රේෂණයට හෝ බෙදා හැරීමට සහ සැපයීමට බලයලත් තැනැත්තකු සම්බන්ධයෙන් අදාළ කර ගැනීමේ දී, ඒ බලපත්‍රයේ නම් කර ඇති ප්‍රදේශය අදහස් වේ;

"තොග විකිණීම්" යන්නෙන්, විදුලිය විකිණීම සම්බන්ධයෙන් වන විට දී, ජාතික සම්ප්‍රේෂණ ජාලය හරහා බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ට සහ සම්ප්‍රේෂණ ජාලයට සම්බන්ධිත යයි අදාළ බලපත්‍රය මගින් හඳුනාගනු ලැබිය හැකි වෙළෙන්දන්ට සහ පාරිභෝගිකයන්ට විදුලිය තොග වශයෙන් විකිණීම අදහස් වේ;

"ගෘහිත උත්පාදන පිරියතය" යන්නෙන්, යම් තැනැත්තකු විසින් මූලික වශයෙන් ඒ තැනැත්තාගේ ස්වකීය භාවිතය සඳහා විදුලිය උත්පාදනය කිරීමට පිහිටුවන ලද විදුලි පිරියතක් අදහස් වන නමුත්, ඒ තැනැත්තා විසින් යම් අතිරික්ත විදුලිබලය මේ පනත යටතේ නිකුත් කළ බලපත්‍රයක් ප්‍රකාරව බෙදා හැරීමේ බලපත්‍රලාභීන්ට හෝ ජාතික පද්ධති ක්‍රියාකරුට විකිණිය හැකි ය;

"ලංකා විදුලිබල මණ්ඩලය" යන්නෙන්, 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනත මගින් පිහිටුවන ලද ලංකා විදුලිබල මණ්ඩලය අදහස් වේ;

"සම්බන්ධ කිරීම" යන්නෙන්, යම් පරිශ්‍රයක් සම්බන්ධයෙන් අදාළ වන විට දී, යම් පාරිභෝගිකයකු බෙදා හැරීමේ බලපත්‍රලාභියාගේ බෙදා හැරීමේ මාර්ගයට සම්බන්ධ කිරීමක් අදහස් වන අතර, "සම්බන්ධතාවය" යන යෙදුම ඒ අනුව තේරුම් ගත යුතු ය;

"පාරිභෝගිකයා" යන්නෙන්, බලපත්‍රලාභියකු හෝ ශ්‍රී ලංකා රජය හෝ මහජනතාවට විදුලිය සැපයීමේ ව්‍යාපාරයේ නියුතු වෙනත් යම් තැනැත්තකු විසින් පෞද්ගලික භාවිතය සඳහා විදුලිය සපයනු ලබන යම් තැනැත්තකු අදහස් වන අතර, විදුලිය ලබා ගැනීමේ කාර්යය සඳහා තත්කාලයේ දී සම්බන්ධ කර ඇති පරිශ්‍රයක් අයිති තැනැත්තකු ද විදුලිබලය අපේක්ෂිතව සිටින පාරිභෝගිකයකු ද ඇතුළත් විය යුතු ය;

"සමර්පිත සම්ප්‍රේෂණ මාර්ගය" යන්නෙන්, ගෘහිත උත්පාදන පිරියතයක් හෝ උත්පාදනය කිරීමේ ස්ථානයක විදුලි මාර්ග හෝ විදුලි පිරියතයක්, අවස්ථාවෝචිත පරිදි, යම් සම්ප්‍රේෂණ මාර්ගයකට හෝ උපපොළකට සම්බන්ධ කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන යම් විදුලිය සැපයීමේ මාර්ගයක් හෝ ස්ථානයෙන් ස්ථානයට වන සම්බන්ධතාවයක් අදහස් වේ;

"ඍජු ප්‍රසම්පාදනය" යන්නෙන්, පිරියතය යෙදවීම සහ පිළිගැනීම මත සම්පූර්ණ ගෙවීම සඳහා සැපයීමේ ගිවිසුමක් යටතේ විදුලි පිරියතයක් හෝ විදුලි මාර්ගයක් සැපයීම සඳහා ගිවිසුම්කරුවකුගේ හෝ සැපයුම්කරුවකුගේ නිරත වීම අදහස් වේ;

"බෙදා හැරීම" යන්නෙන්, විදුලිය සම්බන්ධයෙන් වන විට දී, අඩු වෝල්ටීය මාර්ග සහ විදුලි පිරියතයකින් සමන්විත වන්නා වූ සහ යම් පරිශ්‍රයකට හෝ වෙනත් යම් බෙදා හැරීමේ පද්ධතියකට විදුලිබලය ගෙනයාම සඳහා භාවිත කරනු ලබන පද්ධතියක් අදහස් වන අතර, "බෙදීම" සහ "බෙදා හැරීමේ පද්ධතිය" යන යෙදුම් ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය;

"බෙදා හැරීමේ මාර්ගය" යන්නෙන්, බෙදා හැරීමේ බලපත්‍රලාභියකු සම්බන්ධයෙන් වන විට දී, යම් පරිශ්‍රයකට විදුලිය සැපයීමේ කාර්යය සඳහා භාවිත කරනු ලබන බෙදා හැරීමේ බලපත්‍රලාභියාගේ බලයලත් ප්‍රදේශයේ ඇති යම් බෙදා හැරීමේ මාර්ගයක් අදහස් වේ;

"බෙදා හැරීමේ වෝල්ටීයතාවය" යන්නෙන්, කිලෝවොට් 33 ට නොවැඩි යම් වෝල්ටීයතාවයක් හෝ නියාමක විසින් තීරණය කරනු ලබන පරිදි යම් වෝල්ටීයතාවයක් අදහස් වේ;

"විදුලි පිරියතය" යන්නෙන්, විදුලිය උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම හෝ සැපයීම සඳහා හෝ ඒ සම්බන්ධයෙන් භාවිත කරන යම්

පිරියතයක්, උපකරණයක් හෝ ආම්පන්නයක් අදහස් වන අතර, පාරිභෝගිකයකුගේ පාලනය යටතේ පවතින යම් පරිශ්‍රයකට හෝ යම් විදුලි ආම්පන්නයකට සපයන ලද විදුලිය ප්‍රමාණය දැන ගැනීම සඳහා භාවිත කරන යම් විදුලි මාර්ගයක්, යම් මීටරයක් ඇතුළත් නොවිය යුතු ය;

"විදුලිබල පද්ධතිය" යන්නෙන්, විදුලි උත්පාදක යන්ත්‍රයකින් උත්පාදනය කර පාරිභෝගික ප්‍රදේශවලට හෝ යාබද විදුලිබල පද්ධතිවලට ගෙන යාම සඳහා භාවිත කරන විදුලි උත්පාදක යන්ත්‍ර (උදාඃ විදුලි පිරියත), සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ මාර්ග, උපකරණ, පරිපථ සහ ට්‍රාන්ස්ෆෝමර්වල එකතුවක් අදහස් වේ;

"විදුලි මාර්ගය" යන්නෙන්, යම් කාර්යයක් සඳහා විදුලිය රැගෙනයාම සඳහා භාවිත කරනු ලබන පොළොව යට හෝ පොළොව මතුපිට බහාලන යම් විදුලි මාර්ග යක් අදහස් වන අතර, එවැනි යම් මාර්ගයකට ආධාරකයක් ලෙස භාවිත කරන යම් උපකරණයක් ඇතුළත්ව එහෙත් එවැනි යම් මාර්ගයකට ආධාර වන්නේ, ගෙනයන්නේ හෝ එල්ලා තබන්නේ යම් ආකෘතියක්, කණුවක් හෝ වෙනත් දෙයක් තුළින් ද, ඒ මතින් ද හෝ එමගින් ද යන්නට සීමා නොවන විදුලිය ගෙනයාමේ කාර්යය සඳහා එවැනි යම් මාර්ගයකට සම්බන්ධ කරන ලද උපකරණ; සහ (එහි කොපුව, පරිවරණය හෝ වැස්ම) එවැනි යම් මාර්ගයක වටේ පිහිටා තිබෙන හෝ ආධාරක වන හෝ ඊට ආසන්නයේ ස්ථාපනය කර ඇති යම් කම්බියක්,

කේබලයක්, නලයක්, පයිප්පයක් හෝ වෙනත් සමාන දෙයක් ඇතුළත් වේ;

"විදුලිය වෙළෙඳාම් කිරීම" යන්නෙන්, නැවත විකිණීම සඳහා විදුලිය මිල දී ගැනීමක් අදහස් වන අතර "වෙළෙඳාම" යන යෙදුම ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය;

"විදුලි සැපයුම් සංග්‍රහය" යන්නෙන්, සියලු බෙදා හැරීමේ බලපත්‍රලාභීන් විසින් අනුකූල විය යුතු නියම කරන ලද ප්‍රමිතීන්ගේ සංග්‍රහයක් අදහස් වේ;

"බලාත්මක කිරීමේ නියෝගය" යන්නෙන්, මේ පනතේ 22 වන වගන්තියේ (4) වන උපවගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගයක් අදහස් වේ;

"උත්පාදනය කිරීමේ ස්ථානය" යන්නෙන්, විදුලිය උත්පාදනය කිරීමේ යම් ස්ථානයක් පිහිටුවන ලද භූමිභාගය සහ ඉහත කී කාර්ය සඳහා භාවිත කරනු ලබන යම් ගොඩනැගිල්ලක්, පිරියතයක්, ට්‍රාන්ස්ෆෝමරයක්, ස්විච් යතුරු ආම්පන්නයක්, ස්විච් යතුරු අංගනයක්, කේබල් හෝ වෙනත් අනුබද්ධ උපාංග වේ නම්, ඒ සියල්ල සහ විදුලිය උත්පාදනය කිරීමේ ස්ථානයක ක්‍රියා කිරීමේ කාර්ය මණ්ඩලය සඳහා නවාතැන් දීමට භාවිත කරන යම් ගොඩනැගිල්ලක්, සහ විදුලිය ජල බලයෙන් උත්පාදනය කරන අවස්ථාවක, කොටු දොරවල්, කවරාකාර හෝ නිර්මාණ, ප්‍රධාන සහ නියාමක ජලාශ, වේලි සහ වෙනත් ජල නිර්මාණ ඇතුළත් වන එහෙත් යම් උපපොළක් ඇතුළත් නොවන

විදුලි උත්පාදනය කිරීම සඳහා වන යම් පහසුකමක් අදහස් වේ;

"උත්පාදකයා" යන්නෙන්, උත්පාදන බලපත්‍රලාභියා හෝ උත්පාදන බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇති තැනැත්තකු අදහස් වේ;

"ජාලකය" යන්නෙන්, අන්තර් සම්බන්ධිත සම්ප්‍රේෂණ මාර්ග, උපපොළවල් සහ උත්පාදන පිරියතවල අධිවෝල්ටීයතාවයෙන් යුත් ප්‍රධාන රැකුල් පද්ධතියක් අදහස් වේ;

"ජාලක කේත සංග්‍රහය" යන්නෙන්, ශ්‍රී ලංකාවේ විදුලිබල පද්ධතිය තුළ විද්‍යුත් ශක්තිය සැලසුම් කිරීමට, කාල සටහන්ගත කිරීමට හෝ ප්‍රේෂණය කිරීමට අදාළ ක්‍රමවේදය නිශ්චිතව දක්වනු ලබන ජාතික ජාලක කේත සංග්‍රහය අදහස් වේ;

"අධිවෝල්ටීයතා මාර්ගය" යන්නෙන්, කිලෝවොට් 33 ඉක්මවන්නා වූ නාමික වෝල්ටීයතාවයකින් යුත් යුතු හෝ නියාමක විසින් කලින් කලට, නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි යම් නාමික වොල්ටීයතාවයකින් යුත් විදුලි මාර්ගයක් හෝ කේබලයක් අදහස් වේ;

"දේශීය බලශක්ති විභව" යන්නෙන්, දේශීය වශයෙන් නිෂ්පාදිත පොසිල ඉන්ධන බලශක්තිය, පුනර්ජනනීය බලශක්තියෙන් නිෂ්පාදනය කරන ලද බලශක්තිය වැනි සහ ඒවායේ වෙනත් යම් ව්‍යුත්පන්න වූ දේ ඇතුළත් ශ්‍රී ලංකාවේ ඇති ඕනෑම ආකාරයක බලශක්ති විභවයක් අදහස් වන

නමුත් කිසිදු ආනයනය කරන ලද පොසිල ඉන්ධන පදනම් වූ බලශක්ති නිෂ්පාදන ඇතුළත් නොවේ;

"අයිතිවාසිකම" යන්නෙන්, පහත දැක්වෙන කටයුතු-වලින් කිසිවක් කරගෙන යනු ලබන යම් සමාගමක හෝ ව්‍යවසායක ඍජුව හෝ වක්‍ර යම් මූල්‍ය හෝ වෙනත් අයිතිවාසිකමක් අදහස් වේ:-

(අ) විදුලිය උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම, හෝ සැපයීම;

(ආ) විදුලිය උත්පාදනය කිරීම සඳහා ඉන්ධන සැදීම, නිෂ්පාදනය කිරීම, විකිණීම හෝ සැපයීම;

(ඇ) විදුලිය උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදා හැරීම, සැපයීම හෝ භාවිත කිරීම සඳහා යන්ත්‍රෝපකරණ, පිරියත, උපකරණ, මෙවලම් හෝ පිරිවැද්දුම් ආනයනය කිරීම, සෑදීම, විකිණීම, බද්දට දීම, කුලියට දීම හෝ වෙනත් ආකාරයකින් සැපයීම හෝ ගනුදෙනු කිරීම; හෝ

(ඈ) යම් සමාගමකට හෝ ව්‍යවසායකට නීතිමය, ගිණුම්කරණ හෝ බැංකු සේවා සැපයීම;

"සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම" යන්නෙන්, 1982 අංක 28 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කළ සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම අදහස් වේ;

"බලපත්‍රය" යන්නෙන්, මේ පනතේ 20 වන වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද බලපත්‍රයක් අදහස් වන අතර, "බලපත්‍රලාභියා" යන යෙදුමෙන් විදුලිය උත්පාදනය කිරීම, සම්ප්‍රේෂණය කිරීම, බෙදා හැරීම, සැපයීම, වෙළෙඳාම් කිරීම හෝ ප්‍රසම්පාදනය කිරීමට සම්බන්ධිත කටයුතුවල නිරතවීම සඳහා මේ පනත ප්‍රකාරව බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තකු අදහස් වේ;

"මාර්ගය" යන්නෙන්, විදුලිය රැගෙන යාමේ දී භාවිත කිරීම සඳහා නිර්මාණය කරන හෝ යොදා ගන්නා (එහි කොපුව හෝ වැස්ම ඇතුළත්ව) යම් කම්බියක්, කේබලයක්, පයිප්පයක්, සන්නායකයක් හෝ වෙනත් සමාන දෙයක් අදහස් වේ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහනගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවැනි යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලබන, කරනු ලබන හා ඉටු කරනු ලබන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටු කිරීම සඳහා යම් කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද කවර හෝ අධිකාරියක් ද ඇතුළත් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථාව ප්‍රකාරව විදුලිය විෂයය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"ජාතික විදුලි ප්‍රේෂණ මධ්‍යස්ථානය" යන්නෙන්, ජාතික ජාලකය තථ්‍ය කාලයේ ක්‍රියාත්මක කිරීම ක්‍රියාවේ යෙදවීම සඳහා මේ පනතේ 10 වන වගන්තිය යටතේ පිහිටුවන ලද මධ්‍යස්ථානය අදහස් වේ;

"ජාතික පද්ධති ක්‍රියාකරු" යන්නෙන්, මේ පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති තැනැත්තා හෝ පුද්ගල මණ්ඩලය අදහස් වේ;

"ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු" යන්නෙන්, ජාතික සම්ප්‍රේෂණ ජාලය ක්‍රියාත්මක කිරීම සඳහා බලපත්‍රය ප්‍රදානය කරනු ලැබ ඇති තැනැත්තා හෝ පුද්ගල මණ්ඩලය අදහස් වේ;

"විවෘත ප්‍රවේශය" යන්නෙන්, නියාමක විසින් නිකුත් කරන ලද විධාන ප්‍රකාරව, මේ පනත යටතේ උත්පාදන බලපත්‍රලාභීන්ගෙන් ඍජුව ම විදුලිය මිල දී ගැනීම සඳහා සුදුසුකම්ලත් පාරිභෝගිකයන්ට විදුලිය සැපයීම සඳහා සම්ප්‍රේෂණ ජාලය හෝ බෙදා හැරීමේ මාර්ග හෝ ආශ්‍රිත පහසුකම් භාවිත කිරීම සඳහා වෙනස් කොට නොසැලකීමේ සැපයීම අදහස් වේ. එමගින් චක්‍රීය බද්දක් ගෙවීමෙන් පසුව, ජාල හිමිකරු හෝ වෙනත් යම් භාවිත කරන්නකු වශයෙන් සමාන කොන්දේසි මත සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ ජාලයකට ප්‍රවේශවීම සඳහා විදුලිය සැපයීමට තුන්වන පාර්ශ්වීය සැපයුම්කරුවන්ට අවසර ලබාදෙනු ලැබේ;

"පද්ධතිය" යන්නෙන්, විදුලිය උත්පාදනය කිරීමේ, සම්ප්‍රේෂණය කිරීමේ, බෙදා හැරීමේ සහ සැපයීමේ සියලු අංශ

අදහස් වන අතර, ඊට පහත නම් වශයෙන් දැක්වෙන එකක් හෝ ඊට වැඩි ගණනක් ඇතුළත් වේ:-

(අ) උත්පාදන ස්ථාන;
(ආ) සම්ප්‍රේෂණ මාර්ග;
(ඇ) උපපොළවල්;
(ඈ) බැඳි මාර්ග;
(ඉ) විදුලිය ප්‍රේෂණ කටයුතු;
(ඊ) ප්‍රධාන බෙදා හැරීමේ මාර්ග;
(උ) විදුලිබල සැපයුම් මාර්ග;
(ඌ) ඉහළින් ඇති මාර්ග;
(එ) සේවා මාර්ග; සහ
(ඒ) වැඩකටයුතු;

"පරිශ්‍රය" යන්නෙන්, යම් ඉඩමක්, ගොඩනැගිල්ලක් හෝ ව්‍යුහයක් අදහස් වේ;

"නියම කරන ලද" යන්නෙන්, මේ පනත යටතේ සාදනු ලබන නියෝගවලින් නියම කිරීම අදහස් වේ;

"රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වය" යන්නෙන්, ආයෝජකයා විසින් සැලකිය යුතු ලෙස ප්‍රාග්ධන ආයෝජන කරනු ලබන විදුලිය, බලශක්ති ගබඩා කිරීම, අනුයාත සේවා හෝ සම්ප්‍රේෂණ සේවා සැපයීම සඳහා ආයෝජකයකු සමඟ දීර්ඝකාලීන ගිවිසුමකට එළඹීම අදහස් වේ;

"කලාපීය වෙළෙඳපොළ" යන්නෙන්, දකුණු ආසියානු කලාපය තුළ ශ්‍රී ලංකා දේශ සීමාවෙන් පිටත ක්‍රියාත්මක වන විදුලි වෙළෙඳපොළ අදහස් වේ;

"ප්‍රමාණීකෘත විදුලිය මිල දී ගැනීමේ ගිවිසුම" යන්නෙන්, තාක්ෂණය, නිශ්චිත විදුලිබල මිල දී ගැනීමේ බද්ද සහ මෙගා වොට් 10 ක උපරිම ධාරිතාවක්

සහිත පුනර්ජනනීය බලශක්තිය පදනම් කර ගත් පිරියත සඳහා වෙනත් ගිවිසුම්ගත නියම ඇති පෙර අර්ථ දැක්වූ නියම සහ කොන්දේසි මත විදුලිය මිල දී ගැනීමේ ගිවිසුමක් අදහස් වේ;

"සැපයුම" යන්නෙන්, විදුලිය සම්බන්ධයෙන් වන විට දී බෙදා හැරීමේ බලපත්‍රලාභියකුගේ හෝ එසේ කිරීමට බලයලත් යම් අස්තිත්වයක බෙදා හැරීමේ ජාලය භාවිතයෙන් විදුලිය බෙදා හැරීම අදහස් වේ;

"සම්ප්‍රේෂණ ජාලය" යන්නෙන්, යම් කම්බි හෝ ඉහළින් ඇති මාර්ගවල පාලනයට සහ ආරක්ෂාවට අවශ්‍ය වන සහ ඒ සඳහා භාවිත කරනු ලබන යම් ට්‍රාන්ස්ෆෝමර්, ස්විච්, යතුරු ආම්පන්න සහ වෙනත් කටයුතු හා උපාංග මෙන්ම එකී ට්‍රාන්ස්ෆෝමර්, ස්විච්, යතුරු ආම්පන්න සහ වෙනත් කටයුතු හා උපාංග සපයා දීම සඳහා අවශ්‍ය විය හැකි යම් ගොඩනැගිලි හෝ එහි කොටස් සමඟ උත්පාදන ස්ථානයකින් උපපොළකට, එක් උත්පාදන ස්ථානයකින් වෙනත් උත්පාදන ස්ථානයකට හෝ එක් උපපොළකින් වෙනත් උපපොළකට විදුලිය ගෙනයාම සඳහා භාවිත කරනු ලබන (බලපත්‍රලාභියකුගේ බෙදා හැරීමේ පද්ධතියේ අත්‍යාවශ්‍ය කොටසක් නොවන) අධිවෝල්ටීයතාවයෙන් යුතු සියලු කේබල් සහ ඉහළින් ඇති මාර්ග අදහස් වේ;

"සම්ප්‍රේෂණ වෝල්ටීයතාවය" යන්නෙන්, කිලෝවොට් 33 ට ඉහළ යම් වෝල්ටීයතාවයක් හෝ සම්ප්‍රේෂණ පද්ධතිය ක්‍රියාත්මක වන වෝල්ටීයතාවය හෝ වෝල්ටීයතාවයන් ලෙස නියාමක විසින් නිශ්චය කරනු ලබන වෙනත් යම් වෝල්ටීයතාවයක් අදහස් වේ;

"සම්ප්‍රේෂණය කිරීම" යන්නෙන්, විදුලිය සම්බන්ධයෙන් වන විට දී, අධිවෝල්ටීයතාවයෙන් යුතු මාර්ග සහ විදුලිබල පිරියතය අඩංගු වන සහ විදුලිය උත්පාදන ස්ථානයකින් උපපොළකට, එක් උත්පාදන ස්ථානයකින් වෙනත් උත්පාදන ස්ථානයකට හෝ එක් උපපොළකින් වෙනත් උපපොළකට ගෙනයාම සඳහා භාවිත කරනු ලබන, සම්ප්‍රේෂණ පද්ධතියක් මගින් විදුලිය ප්‍රවාහනය කිරීම අදහස් වන අතර, "සම්ප්‍රේෂණය" සහ "සම්ප්‍රේෂණ පද්ධතිය" යන යෙදුම් ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය;

"උපයෝගිතාවය" යන්නෙන්, මේ පනතේ විධිවිධාන යටතේ බලපත්‍රලාභියකු ලෙස කටයුතු කරන යම් තැනැත්තකුට අයත් වන සියලු ඉඩම්, ගොඩනැගිලි, වැඩකටයුතු සහ ඒවාට සම්බන්ධිත ද්‍රව්‍ය ඇතුළුව විදුලිබල මාර්ග හෝ විදුලිබල පිරියතය අදහස් වන අතර, "විදුලි උපයෝගිතාවය" යන්නෙන්, විදුලිබල ශක්තිය නිෂ්පාදනය, සම්ප්‍රේෂණය හෝ බෙදා හැරීම සඳහා මූලිකව ම භාවිත කරනු ලබන සහ ප්‍රයෝජනවත් වන ගිවිසුම් සහ පැවරූ අයිතීන් ඇතුළුව සියලු කොටස් සහ එයට අයත් දේ සමඟ යම් පිරියතක්, වැඩ කටයුතු පද්ධතියක්, පහසුකම් හෝ දේපළ අදහස් වේ;

"එක්‍රීය" යන්නෙන්, අවස්ථාවෝචිත පරිදි, සම්ප්‍රේෂණ හෝ බෙදා හැරීමේ බලපත්‍රලාභියකු නොවන වෙනත් තැනැත්තකු විසින් එක්‍රීය ගාස්තු ගෙවීම මත සුදුසුකම්ලත් පාරිභෝගිකයන්ට විදුලිය සැපයීම සඳහා සම්ප්‍රේෂණ බලපත්‍රලාභියකුගේ බෙදා හැරීමේ පද්ධතිය සහ ආශ්‍රිත පහසුකම් භාවිත කිරීම අදහස් වේ;

"එක්‍රීය ගාස්තු" යන්නෙන්, මේ පනත ප්‍රකාරව එක්‍රීය සේවා සැපයීම සඳහා නියාමක විසින් අනුමත කරන ලද සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ ජාල භාවිත කිරීමේ බදු අදහස් වේ;

"තොග විදුලි වෙළෙඳපොළ" යන්නෙන්, වඩාත් ම ලාභදායී පිරිවැයට පාරිභෝගිකයන්ට විදුලිය සැපයීම සඳහා බහුවිධ විදුලි සපයන්නන් විසින් එකිනෙකා සමග තරග කරනු ලබන වෙළෙඳපොළක් අදහස් වේ; සහ

"වැඩකටයුතු" යන්නෙන්, විදුලිය ජනතාවට සම්ප්‍රේෂණය කිරීමට, බෙදා හැරීමට හෝ සැපයීමට සහ මේ පනත යටතේ ප්‍රදානය කළ බලපත්‍රයක හෝ අවසරයක පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමට අවශ්‍ය කරන විදුලි මාර්ග සහ යම් ගොඩනැගිලි, පිරියත, යන්ත්‍රෝපකරණ, උපකරණ සහ කවරාකාර විස්තරයෙන් යුත් වෙනත් යම් දෙයක් අදහස් වේ.

[16 වන වගන්තිය]

## උපලේඛනය

වර්තමානයේ ලංකා විදුලිබල මණ්ඩලය සතු වන පහත දක්වා ඇති පරිදි වන ජල විදුලිය උත්පාදනය, තාප විදුලිය උත්පාදනය සහ පුනර්ජනනීය බලශක්ති උත්පාදනය සම්බන්ධයෙන් වන කටයුතු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වන ව්‍යවස්ථාව ප්‍රකාරව කථානායකවරයා විසින් මේ පනත පාර්ලිමේන්තු පනතක් වශයෙන් සහතික කරන ලද දින සිට මාස හයකට වඩා පසු නොවන, මේ පනත ක්‍රියාත්මකභාවයට එළඹෙන දිනයේ දී, මේ පනත ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා සාරානුකූලව පහත දැක්වෙන ආකාරයෙන් ප්‍රතිව්‍යුහගත කර, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරනු ලබන සංස්ථාමය අස්තිත්වයන් සතු කරනු ලැබිය යුතු ය:-

(අ) ලංකා විදුලිබල මණ්ඩලයේ ජල විදුලිබලය උත්පාදන වත්කම් පවරා ගැනීම සඳහා එක් සමාගමක්;

(ආ) ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා ගල් අඟුරු සමාගම විසින් හිමිකාරීත්වය දරන සහ ක්‍රියාත්මක කරනු ලබන ගල් අඟුරු විදුලි පිරියතය පවරා ගැනීම සඳහා එක් සමාගමක්;

(ඇ) ලංකා විදුලිබල මණ්ඩලයේ තාප විදුලි උත්පාදන වත්කම් පවරා ගැනීම සඳහා එක් සමාගමක්;

(ඈ) ලංකා විදුලිබල මණ්ඩලය විසින් හිමිකාරීත්වය දරන, සන්තකය දරන සහ ක්‍රියාත්මක කරනු ලබන සුළං විදුලි පිරියතය පවරා ගැනීම සඳහා එක් සමාගමක්;

(ඉ) ශ්‍රී ලංකාවේ ජාතික ජාලකය සැකසෙන්නා වූ භෞතික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, පවත්වාගෙන යාම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වන ලංකා විදුලිබල මණ්ඩලයේ කර්තව්‍ය පවරා ගැනීමට එක් සමාගමක්;

(ඊ) ලංකා විදුලිබල මණ්ඩලයේ අනාගත විදුලි සහ සම්ප්‍රේෂණ ඉල්ලීම් සැලසුම් කිරීම සම්බන්ධයෙන් වන කර්තව්‍ය සහ උත්පාදන කාල සටහන් ගත කිරීම,

කැපවීම සහ උත්පාදන පිරියතවල ආර්ථික ප්‍රේෂණය සම්බන්ධයෙන් වන කර්තව්‍ය පවරා ගැනීමට එක් සමාගමක්;

(උ) ලංකා විදුලිබල මණ්ඩලයේ බෙදා හැරීම් අංශවල බෙදා හැරීමේ කර්තව්‍ය පවරා ගැනීමට වෙන් වූ සමාගම්; සහ

(ඌ) ලංකා විදුලිබල මණ්ඩලයේ අවශේෂ කර්තව්‍ය කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය වන සමාගම් යම් ගණනක්. වෙනත් කරුණු අතර යම් අනුප්‍රාප්ත සමාගමකට පවරනු නොලැබිය හැකි පහත දැක්වෙන අවශේෂ කර්තව්‍ය භාර ගැනීම සඳහා එකී අවශේෂ සමාගම් සංස්ථාගත කරනු ලැබිය යුතු ය:-

(i) සංස්ථාගත කරන ලද සමාගම්වලට පැවරූ ඒ කර්තව්‍ය සහ කටයුතු හැර, ලංකා විදුලිබල මණ්ඩලයේ කර්තව්‍ය පවරා ගැනීම සඳහා එක් සමාගමක්;

(ii) ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදලේ සහ විශ්‍රාම වැටුප් අරමුදලේ කර්තව්‍ය පවරා ගැනීමට සහ අර්ථසාධක අරමුදලේ සහ විශ්‍රාම වැටුප් අරමුදලේ රක්ෂක සහ භාරකරු ලෙස කටයුතු කරමින් කළමනාකරණය කිරීම එකී අර්ථසාධක අරමුදල සහ විශ්‍රාම වැටුප් අරමුදල සඳහා එක් සමාගමක්, එසේ වුව ද, සමාගමේ සම්පූර්ණ කොටස් හිමිකම සෑමවිටම රජය සතු විය යුතු ය.

46. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.